# ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා වන උපායමාර්ගය

## පසුබිම් සටහන








SDCSL

ESCAP
Economic and Social Commission for Asia and the Pacific

UNITED NATIONS
SRI LANKA

# ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා වන උපායමාර්ගය

## පසුබිම් සටහන













SDCSL

ESCAP
Economic and Social Commission for Asia and the Pacific

UNITED NATIONS
SRI LANKA



**ආසියානු සහ පැසිෆික් කලාපය සඳහා වන ආර්ථික හා සාමාජීය කොමිෂන් සභාවෙහි (ESCAP) සාමාජිකයන් සහ ආශ්‍රිත සාමාජිකයන් සිතියමේ වර්ණ ගන්වා ඇති කොටසින් දැක්වේ.**

ආසියානු සහ පැසිෆික් කලාපය සඳහා වන ආර්ථික හා සාමාජීය කොමිෂන් සභාව ආසියානු පැසිෆික් කලාපයෙහි වඩාත්ම සංයුක්ත අන්තර් රාජ්‍ය වේදිකාව වේ. ස්ථිරසාර සංවර්ධන අභියෝග සඳහා විසඳුම් සෙවීමට කොමිෂන් සභාව එහි සාමාජික රාජ්‍යයන් 53 සහ ආශ්‍රිත සාමාජිකයන් 9 අතර සහයෝගීතාව ප්‍රවර්ධනය කරයි. ආසියානු සහ පැසිෆික් කලාපය සඳහා වන ආර්ථික හා සාමාජීය කොමිෂන් සභාව (ESCAP) යනු එක්සත් ජාතීන්ගේ කලාපීය කොමිෂන් සභා පහ අතරින් එකකි.

ආසියානු සහ පැසිෆික් කලාපය සඳහා වන ආර්ථික හා සාමාජීය කොමිෂන් සභා ලේකම් කාර්යාලය, ජාතික සංවර්ධන අරමුණු, කලාපීය ගිවිසුම් සහ තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමට තාක්ෂණික සහාය සහ ධාරිතා සංවර්ධන සේවාවන් සැපයීමෙන් සහ කාර්යාභිමුඛ දැනුම උත්පාදනය කිරීමෙන් කලාපය තුළ සංයුක්ත, ඔරොත්තු දෙන සහ තිරසර සංවර්ධනයට සහාය වේ.

* මෙම සිතියමේ භාවිතා කර ඇති නාමයන් සහ ඉදිරිපත් කිරීම් මඟින් කිසිදු රටක, භූමි ප්‍රදේශයක, නගරයක හෝ එහි බල ප්‍රදේශයක නෛතික තත්ත්වය හෝ එහි දේශසීමාවන් හෝ මායිම් නිර්ණය කිරීම සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ලේකම් කාර්යාලයේ කිසිදු මතයක් ප්‍රකාශ කිරීමක් අදහස් නොවේ.

## ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ප්‍රවර්ධනය සඳහා වන උපායමාර්ගය

## **පසුබිම් සටහන**

United Nations Publication
Copyright © United Nations 2023
All rights reserved ST/ESCAP/3119

මෙම ප්‍රකාශනය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර පහත කාර්යාලය අමතන්න:

Trade, Investment, and Innovation Division UN
ESCAP
Rajadamnern Nok Avenue
Bangkok 10200, Thailand
ෆැක්ස් : (+66-2) 288-1027, 288-3066
ඊ මේලා : escap-tiid@un.org

වෙනත් අයුරකින් දක්වා නොමැති අවස්ථාවන්හි දී ඩොලරය ($) යනුවෙන් දක්වා ඇත්තේ ඇමරිකානු ඩොලරයයි.

*මෙම සිතියමේ භාවිතා කර ඇති නාමයන් සහ ඉදිරිපත් කිරීම් මඟින් කිසිදු රටක, භූමි ප්‍රදේශයක, නගරයක හෝ එහි බල ප්‍රදේශයක නෛතික තත්ත්වය හෝ එහි දේශසීමාවන් හෝ මායිම් නිර්ණය කිරීම සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ලේකම් කාර්යාලයේ කිසිදු මතයක් ප්‍රකාශ කිරීමක් අදහස් නොවේ.

"රට හෝ ප්‍රදේශය" යනුවෙන් සඳහන් වන ස්ථානවල එමඟින් රටවල්, භූමි ප්‍රදේශ, නගර හෝ ප්‍රදේශ ආවරණය කරනු ලැබේ.

ග්‍රන්ථ නාමාවලිය සහ වෙනත් ආශ්‍රිත ලේඛන හැකි සෑම අවස්ථාවකදී ම සත්‍යාපනය කර ඇත. URL ලිපින වෙත පිවිසීම හෝ ඒවායේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය කිසිදු වගකීමක් නොදරයි.

මෙම ප්‍රකාශනයෙහි ප්‍රකාශිත අදහස් කතුවරුන්ගේ හෝ සිද්ධි අධ්‍යයනයට දායක වූවන්ගේ අදහස් වන අතර ඒවා සැමවිට ම එක්සත් ජාතීන්ගේ අදහස් පිළිබිඹු නොකරයි.

මෙම ප්‍රකාශනයේ දක්වා ඇති අදහස්, සංඛ්‍යා සහ ඇස්තමේන්තු කතුවරුන්ගේ සහ දායක වූවන්ගේ වගකීම වන අතර ඒවා සැමවිටම එක්සත් ජාතීන්ගේ අදහස් පිළිබිඹු කිරීමක් හෝ එහි සහතිකයක් සහිත වන බව සැලකිය යුතු නොවේ. කිසියම් දෝෂයක් වේ නම් එය කතුවරුන්ගේ වගකීම වේ.

ආයතනික නම් සහ වාණිජ නිෂ්පාදන සඳහන් කිරීම එක්සත් ජාතීන්ගේ සහතිකයක් සහිතව සිදු කර ඇති බවට අදහස් නොවන අතර යම් ව්‍යවසායක්, වාණිජ නිෂ්පාදනයක් හෝ ක්‍රියාවලියක් සඳහන් කිරීමට අපොහොසත් වීම ප්‍රතික්ෂේප කිරීම ඇඟවීමක් නොවේ.

නිව් යෝර්ක්හි එක්සත් ජාතීන්ගේ ප්‍රකාශන මණ්ඩලයේ ලේකම්වරයාගෙන් පළමුව අවසරය ලබා ගත් අවස්ථාවක හැර ප්‍රකාශනය කිසියම් වාණිජමය අරමුණක් සඳහා භාවිතා කිරීම තහනම් වේ. අවසර ඉල්ලීමේ දී අරමුණ සහ පිටපත් ප්‍රමාණය සඳහන් කළ යුතුය.

# ස්තුතිය

ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමේ උපාය මාර්ගය සඳහා  වන පසුබිම් සටහන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන සභාවේ ඉල්ලීම පරිදි සකස් කරන ලදී.

තිරසර සංවර්ධන සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වන චමින්ද්‍රි සපරමාදුගේ නායකත්වය හා එක්සත් ජාතීන්ගේ ආසියානු සහ පැසිෆික් කලාපය සඳහා වන ආර්ථික හා  සාමාජීය කොමිෂන් සභාවේ ව්‍යවසාය සහ ආයෝජන අංශයේ නවෝත්පාදන පිළිබඳ ප්‍රධානී Jonathan Tsuen Yip Wonගේ අධීක්‍ෂණය යටතේ ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක කාර්යාලය සමඟ සහයෝගීතාවයෙන් යුතුව එක්සත් ජාතීන්ගේ ආසියානු සහ පැසිෆික් කලාපය සඳහා වන ආර්ථික හා  සාමාජීය කොමිෂන් සභාවේ වෙළඳ, ආයෝජන හා  නවෝත්පාදන අංශය මඟින් වර්තමාන පසුබිම් සටහන සකස් කරන ලදී.

එකී පසුබිම් සටහන ආසියානු සහ පැසිෆික් කලාපය සඳහා වන ආර්ථික හා සාමාජීය කොමිෂන් සභාවේ නවෝත්පාදන, ව්‍යවසාය හා අයෝජන අංශයේ ආර්ථික කටයුතු නිලධාරිනී Marta Pérez Cusó ගේ නායකත්වයෙන් යුතු කණ්ඩායමක් විසින් කෙටුම්පත් කරන ලදී. ආසියානු සහ පැසිෆික් කලාපය සඳහා වන ආර්ථික හා  සාමාජීය කොමිෂන් සභාවේ නවෝත්පාදන, ව්‍යවසාය හා අයෝජන අංශයේ ආශ්‍රිත ආර්ථික කටයුතු නිලධාරි, Yihan Zhao, ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරක කාර්යාලයේ හවුල්කාරිත්ව සහ සංවර්ධන මූල්‍ය විශේෂඥ අසාම් බාකිර් මාර්කර් සහ Positive Impact Consultancy හි සම නිර්මාතෘ සහ හවුල්කාර බාහිර විශේෂඥ සෙලිනා පීරිස්  සහ Positive Impact Consultancy හි සම නිර්මාතෘ සහ හවුල්කාරු විකුම් රාජපක්ෂ යන අය කණ්ඩායමේ සාමාජිකයන් අතර විය.

පසුබිම් සටහන බොහෝ සෙයින් සකස් වී ඇත්තේ අදහස් විමසීමේ ක්‍රියාවලියේ දී පාර්ශවකරුවන් විශේෂයෙන් ජනාධිපති ලේකම් කාර්යාලය, කර්මාන්ත අමාත්‍යාංශය, මුදල් අමාත්‍යාංශය, පරිසර අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, ආයෝජන මණ්ඩලය සහ ශ්‍රී ලංකා  රජයේ අදාළ වෙනත් ආයතන, ප්‍රමුඛ වාණිජ මණ්ඩල සහ කර්මාන්ත සංගම්, එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සහ අනෙකුත් බහුපාර්ශවික සහ ද්විපාර්ශවික සංවර්ධන හවුල්කරුවන් මෙන්ම ශ්‍රී ලංකාවේ අදාළ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වන බුද්ධි මණ්ඩල විසින් සපයනු ලබන වටිනා අදහස් මතයි.

පසුබිම් සටහන Mary Ann Perkins විසින් සංස්කරණය කරන ලද අතර Ipsita Sarkar විසින් සැලසුම් කරන ලදී. Su-Arjar Lewchalermvongs විසින් පරිපාලන සහාය ලබා දෙන ලදී.

# පටුන


| | | |
|---|---|---|
| ස්තුතිය | | vi |
| කෙටි යෙදුම් | | vii |
| **1.** | **හැඳින්වීම** | **1** |
| **2.** | **සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ආකෘති අවබෝධ කර ගැනීම** | **2** |
| 2.1 | සංකල්පීය රාමුව: තිරසර සහ සංයුක්ත සංවර්ධනය සඳහා සංයුක්ත සහ තිරසර ව්‍යාපාරයන්හි දායකත්වය | 4 |
| **3.** | **ශ්‍රී ලංකාව තුළ සමාජීය සහ පාරිසරික ප්‍රමුඛතා** | **6** |
| 3.1 | සමාජීය අභියෝග සහ ප්‍රමුඛතා | 6 |
| 3.2 | පාරිසරික අභියෝග සහ ප්‍රමුඛතා | 7 |
| **4.** | **ශ්‍රී ලංකාව තුළ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සඳහා වන වෙළඳපළ අවස්ථා** | **8** |
| 4.1 | කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය ඉහළ නැංවීම | 8 |
| 4.2 | පුනර්ජනනීය බලශක්ති විසඳුම් | 11 |
| 4.3 | තිරසර කෘෂිකර්මාන්තය සහ කෘෂි ව්‍යාපාරය | 12 |
| 4.4 | පරිසර හිතකාමී සහ තිරසර සංචාරක කර්මාන්තය | 14 |
| 4.5 | චක්‍රීය ආර්ථික මූලාරම්භයන් | 16 |
| 4.6 | තිරසර ඇඟලුම් සහ රෙදිපිළි | 17 |
| 4.7 | සමාජීය බලපෑම සඳහා ඩිජිටල් නවෝත්පාදනය | 18 |
| 4.8 | හරිත මූල්‍යනය සහ බලපෑම් ආයෝජනය | 20 |
| **5.** | **සහායශීලි පරිසරය** | **23** |
| 5.1 | සමස්ථ ආර්ථික සන්දර්භය | 23 |
| 5.2 | සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවලට සහාය වීමේ දී පවතින ප්‍රතිපත්ති සහා උපායමාර්ග ඇතුළුව රජයේ කාර්යභාරය | 28 |
| 5.3 | පුද්ගලික අංශයේ කාර්යභාරය | |
| 5.4 | මූල්‍යන පසුබිම | 30 |
| 5.5 | අතරමැදි සහ සහාය සංවිධාන | 31 |
| **යොමුව** | | **34** |

# කෙටි යෙදුම්

| | |
|---|---|
| කොවිඩ්19 | කොරෝනා  වෛරස රෝගය |
| DFI | සංවර්ධන මූල්‍ය ආයතන |
| FAO | එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය |
| GIIN | ගෝලීය බලපෑම් ආයෝජන ජාලය |
| IFC | ජාත්‍යන්තර මූල්‍ය සමාගම |
| ILO | ජාත්‍යන්තර කම්කරු සංවිධානය |
| IMF | ජාත්‍යන්තර මූල්‍ය අරමුදල |
| ISBs | සංයුක්ත සහ තිරසර ව්‍යාපාර |
| JICA | ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය |
| LIIN | ලංකා බලපෑම් ආයෝජන ජාලය |
| MSMEs | ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යය පරිමාණ ව්‍යාපාර |
| PGS | සහභාගීත්ව සහතික පද්ධතිය |
| SDG | තිරසර සංවර්ධන අරමුණු |
| SMEs | කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර |
| SOE | රජය සතු ව්‍යාපාර |
| UNDP | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන |
| WHO | ලෝක සෞඛ්‍ය සංවිධානය |

# 1 හැඳින්වීම

ඔරොත්තු දීමේ හැකියාව සහිත සහ තිරසර ආර්ථිකයක් ඇති කිරීම සඳහා ශ්‍රී ලංකා රජය අපේක්ෂා සහගත ප්‍රතිසංස්කරණ කෙරෙහි යොමු වී ඇත. මෙම දැක්ම තුළ කේන්ද්‍රය වන්නේ සංයුක්ත සහ තිරසර වර්ධනය සඳහා උත්ප්‍රේරකයක් ලෙස පුද්ගලික අංශය සම්බන්ධ කර ගැනීමේ අවස්ථා ගවේෂණය කිරීමයි.

මෙම සන්දර්භය තුළ ආහාර, බලශක්ති සහ මූල්‍ය යන ත්‍රිත්ව අර්බුද මෙන්ම දැනට පවතින දේශගුණික විපර්යාස වල බලපෑම ඇතුළු ඉතා බරපතල අභියෝග සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නව්‍ය විසඳුම් පිරිනැමීමේ දී සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ප්‍රධාන ක්‍රියාකාරීන් ලෙස ඉස්මතු වේ. සංයුක්ත සහ තිරසර ව්‍යාපාර මඟින් අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා වෙත ප්‍රවේශය ලබා දීම පමණක් නොව ජීවනෝපාය සඳහා දායක වන අතර ඒවායේ ක්‍රියාකාරීත්වයේ දී සංයුක්ත බව ප්‍රවර්ධනය කිරීම ද සිදු කරයි.

ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමේ උපායමාර්ගයෙහි සංයුක්ත සහ තිරසර වර්ධනයක් ඇති කිරීම සඳහා පුද්ගලික අංශයේ හැකියාව උපයෝගී කර ගැනීමට සම්බන්ධීකරණය කළ සහ ගැළපෙන ප්‍රවේශයක් සහතික කිරීම සඳහා වන මූලික පියවර ඇතුළත් වේ. අන්තර් ආංශික ආයතන සහ නියෝජිතායතන අතර අදහස් විමසීම් හරහා තිරසර සංවර්ධන සභාවේ නායකත්වය යටතේ සකස් කරන ලද මෙම උපායමාර්ගය තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සහ ශ්‍රී ලංකාව තුළ තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා සහාය දක්වයි.

වත්මන් පසුබිම් සටහන මඟින් උපාය මාර්ගයෙහි දක්වා ඇති නිර්දේශ සහ ක්‍රියාමාර්ග ගැනීම සඳහා වන යෝජනා සනාථ කිරීමට විස්තරාත්මක අදහස් සහ විශ්ලේෂණ ඉදිරිපත් කරයි.

උපාය මාර්ගය සකස් කිරීමේ ක්‍රියාවලියට බහු පාර්ශ්වකරුවන් සිතියම්ගත කිරීම, ද්විතියික පර්යේෂණ (Desk Research) ප්‍රධාන තොරතුරු සපයන්නන්ගේ සම්මුඛ සාකච්ඡා සහ කේන්ද්‍ර කණ්ඩායම් සාකච්ඡා ඇතුළත් විය. රජයේ සහ එක්සත් ජාතීන්ගේ ප්‍රධාන නිලධාරීන් සමඟ මූලිකව අදහස් ලබා ගැනීමේ දී පාර්ශවකරුවන් හඳුනාගෙන, පර්යේෂණ ප්‍රශ්න සකස් කර ගැනීම සහ අදහස් ලබා ගන්නා විෂය පථය සැකෙවින් දැක්වීම සිදු කරන ලදී.

ද්විතියික පර්යේෂණ (Desk Research) මඟින් විවිධ දර්ශක, නීති සහ රාමු ආවරණය කෙරුණු අතර අදහස් ලබා ගැනීමට සහ දත්ත නැවත පරීක්ෂා කිරීමට අර්ධ ව්‍යුහගත කණ්ඩායම් රැස්වීම් සහ විවිධ පාර්ශවකරුවන් සමග සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. වලංගු කිරීමේ වැඩමුළු මඟින් විශේෂයෙන් රජය, පුද්ගලික අංශය සහ සංවර්ධන නියෝජිතායතන වෙතින් සහභාගීත්ව ප්‍රතිපෝෂණ ලබා ගන්නා ලදී, විවිධ අංශවල ප්‍රධාන තොරතුරු සපයන්නන් උපායමාර්ගිකව තෝරා ගන්නා ලද අතර උපායමාර්ගික නිර්දේශයන් සඳහා ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය හරහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදීතා සහ සමානාත්මතා සලකුණු පිළිබඳ සලකා බලන ලදී.

වත්මන් පසුබිම් සටහනේ 2 වන කොටස මඟින් සංයුක්ත සහ තිරසර ව්‍යාපාරයන්හි නිර්වචනය හා සමාජ සංවර්ධනය සහ පාරිසරික තිරසරභාවය සඳහා දායක වන සංයුක්ත සහ තිරසර ව්‍යාපාර වර්ග ඇතුළුව සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සංකල්පය හඳුන්වා දෙනු ලැබේ. 3 වන කොටස මඟින් කොරෝනා (කොවිඩ්19) වසංගතයේ බලපෑම, ආර්ථික අර්බුදය සහ ශ්‍රී ලංකාව තුළ දිගු කලක් තිස්සේ පවතින ව්‍යුහාත්මක, සමාජීය සහ පාරිසරික ගැටළු සම්බන්ධයෙන් මතුවන ප්‍රධාන සමාජීය හා පාරිසරික අභියෝග සැකෙවින් දක්වයි. සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට අවස්ථා පවතින ප්‍රධාන සමාජ සහ පාරිසරික ක්ෂේත්‍ර 4 වන කොටසින් ඉස්මතු කරයි. අවසාන වශයෙන්, 5 වන කොටස මඟින් ආර්ථික සන්දර්භය, රජයේ, පෞද්ගලික අංශයේ සහ අතරමැදි සහ සහායක සංවිධානවල කාර්යභාරය ඇතුළුව සංයුක්ත සහ තිරසර ව්‍යාපාර වලට වර්ධනය වීමට අවශ්‍ය පරිසරය ගවේෂණය කරයි.


ශ්‍රී ලංකාව තුළ සංයුක්ත සහ තිරසර ආර්ථික සුසමාදර්ශයක් කරා යන ගමන විවිධ පැතිකඩ ඔස්සේ සිදු වන අතර ඒ සඳහා විවිධ අංශ හරහා සහයෝගීතාව, නවෝත්පාදන සහ උපායමාර්ගික මැදිහත්වීම් අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමේ උපාය මාර්ගයේ අරමුණ වන්නේ මෙම අරමුණු ඉටු කර ගැනීම සඳහා පුළුල් මාවතක් සකස් කිරීම, පුද්ගලික අංශයේ ගතිකත්වය වර්ධනය කිරීම සහ ගෝලීය සංවර්ධනය, තිරසර අභිලාෂයන් සමඟ ගැළපීමයි.

# 2 සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ආකෘති අවබෝධ කර ගැනීම

| බලපෑම |
|---|
| මෙහෙවර පාදක ධනාත්මක හෝ සැලකිය යුතු වෙනස; විචාරාත්මක, අරමුණු සහිත සහ චේතනාන්විත; මතුපිටින් හෝ සුළු වශයෙන් නොවන |

| සංයුක්ත | තිරසර |
|---|---|
| ආර්ථික පිරමීඩයේ පත්ලෙහි සිටින පුද්ගලයන්ට වාණිජමය වශයෙන් ශක්‍ය පදනමක් මත භාණ්ඩ, සේවා සහ ජීවනෝපායන් සපයමින් ඔවුන්ව සැපයුම්කරුවන්, බෙදාහරින්නන්, සිල්ලර වෙළෙන්දන් හෝ පාරිභෝගිකයන් ලෙස අගය දාමයේ මූලික කොටසක් බවට පත් කරන සංයුක්ත ව්‍යාපාර ආකෘති.<br><br>ආන්තික කණ්ඩායම්වල සමාජීය අවශ්‍යතා සම්බන්ධයෙන් කටයුතු කරන සමාජ ව්‍යවසායන්.<br><br>කාන්තා කේන්ද්‍රීය සහ කාන්තා මූලික ව්‍යවසායන්.<br><br>අවධානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා යහපත් රැකියා අවස්ථාවන් සපයන ව්‍යාපාර (උදා: කාන්තාවන්, තරුණයින් සහ ආබාධ සහිත පුද්ගලයින්). | වෙළඳපළ පාදක ප්‍රවේශයන් භාවිතා කරමින් ධනාත්මක සමාජීය සහ/හෝ පාරිසරික බලපෑම් එල්ල කරන ව්‍යාපාර. |

සංයුක්ත සහ තිරසර ව්‍යාපාර යනු විචාරාත්මක, අරමුණු සහිත සහ චේතනාන්විත ප්‍රවේශයක් හරහා ප්‍රජාවන් සහ පරිසරය තුළ ධනාත්මක වෙනසක් අපේක්ෂා කරන අරමුණු මත පදනම් වූ ව්‍යවසායන් වේ. සංයුක්ත සහ තිරසර ව්‍යාපාර මඟින් සමාජයට සහ පෘථිවියට ප්‍රතිලාභ ලබා දෙන අතරම තම තිරසර බව සහතික කරමින් ධනාත්මක සමාජීය සහ පාරිසරික බලපෑම් ඇති කිරීම සඳහා වෙළඳපළ පාදක ප්‍රවේශයන් භාවිතා කරනු ලැබේ. සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවලට පාරිසරික වශයෙන් තිරසර ලෙස ක්‍රියාත්මක වන හරිත ව්‍යාපාර; ආර්ථික පිරමීඩයේ පත්ලෙහි සිටින පුද්ගලයන්ට වාණිජමය වශයෙන් ශක්‍ය පදනමක් මත භාණ්ඩ, සේවා සහ ජීවනෝපායන් සපයන සංයුක්ත ව්‍යාපාර ආකෘති; සමාජ ව්‍යවසායන්; කාන්තා කේන්ද්‍රය සහ කාන්තා මූලික ව්‍යවසායන්; සහ අවධානමට ලක්විය හැකි කණ්ඩායම් (කාන්තාවන්, තරුණයින් සහ ආබාධ සහිත පුද්ගලයින් වැනි) සඳහා යෝග්‍ය රැකියා සපයන ව්‍යාපාර ඇතුළත් වේ.



ජාතික සමාජ සංවර්ධනය සහ පාරිසරික තිරසර ඉලක්ක ළඟා කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර වලට ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කළ හැකිය. රාජ්‍ය වියදම් සඳහා වන මූල්‍ය සීමාවන්හි වර්තමාන සන්දර්භය තුළ සංයුක්ත සහ තිරසර ව්‍යාපාරයන්හි කාර්යභාරය විශේෂයෙන් තීරණාත්මක වේ.

ශ්‍රී ලංකාවේ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර කිහිපයක් ධනාත්මක පාරිසරික සහ සමාජීය බලපෑම් එල්ල කර ඇති අතර ප්‍රතිනිර්මාණය කළ සහ වැඩිදියුණු කළ ව්‍යාපාර මත මෙම උදාහරණ ගොඩනැගීමට හැකිය. මෙම සංයුක්ත සහ තිරසර ව්‍යාපාරයන්ට පහත ඒවා ඇතුළත් වේ: (අ) ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ සමාගම් වැනි පාරිසරික තිරසර බව කෙරෙහි සහාය දක්වන ව්‍යාපාර; (ආ) වාණිජ ව්‍යාපාර ඒකාබද්ධ කිරීම සහ කුඩා වතු හිමි ගොවීන්ගේ සැපයුම් දාමය තුළ ඔවුන්ට වටිනාකම් එකතු කිරීම (ඇ) කුඩා වතු හිමි ගොවීන්ට තාක්ෂණික දැනුම සපයන සමූපකාර කෘෂිකාර්මික ජාල, වෙළඳපළ අවස්ථාවන් සහ ජාත්‍යන්තරව පිළිගත් සහතිකයන් (ඈ) කාන්තාවන්, තරුණ සහ වරප්‍රසාද නොලත් ප්‍රජාවන් සඳහා සාධාරණ රැකියා අවස්ථා වන් සහතික කරන සමාජීය ව්‍යවසායන්; (ඉ) කාබන් විවික්ත කිරීම, ප්‍රති වන වගාව සහ පුනර්ජනනීය කෘෂිකර්මය වැනි පරිසර හිතකාමී භාවිතයන්ට සහාය දක්වන සමාජීය ව්‍යවසායන්; සහ (ඊ) භාණ්ඩ රැස් කිරීම, තේරීම සහ සකස් කිරීම සඳහා සහාය සහ දේශීය සහ ජාත්‍යන්තර වෙළඳපළ වෙත සහතික කළ ප්‍රවේශය පිරිනමන සංයුක්ත සහ තිරසර ව්‍යාපාර පෝෂණය කරන ව්‍යාපාර රැකවරණ පරිසරය. තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමේදී පුද්ගලික අංශයේ කාර්යභාරය වැඩි දියුණු කිරීම සඳහා මෙම වර්ගයේ ව්‍යාපාර ප්‍රධාන ධාරාවේ ආර්ථික ක්‍රියාකාරකම් සමඟ ඒකාබද්ධ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ.









සංයුක්ත සහ තිරසර ව්‍යාපාර යනු සමාජයට සහ ලෝකයට යහපත සලසන අතරම තම තිරසරභාවය සහතික කර ගනිමින් විචාරාත්මක, අරමුණු සහිත සහ චේතනාන්විත ප්‍රවේශයක් හරහා ප්‍රජාවන් සහ පරිසරය තුළ ධනාත්මක වෙනසක් අපේක්ෂා කරන අරමුණු මත පදනම් වූ ව්‍යවසායන් වේ.

PdhdrEm (UNDP)

## 2.1 සංකල්පීය රාමුව: තිරසර සහ සංයුක්ත සංවර්ධනය සඳහා සංයුක්ත සහ තිරසර ව්‍යාපාරයන්හි දායකත්වය

සමාජ සංවර්ධනය සහ පාරිසරික තිරසරභාවය සඳහා සහාය වීමේ දී සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවල කාර්යභාරය හා සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවල මතුවීම සහ වර්ධනය කෙරෙහි සහාය වීමට රජයන් සඳහා වන උපාය මාර්ගික ක්‍රම මෙම කොටස මඟින් ඉදිරිපත් කරනු ලැබේ.

| බලපෑමට ලක් වන ක්ෂේත්‍ර | සංයුක්ත සහ තිරසර ව්‍යාපාර වර්ග | අවශ්‍ය සහාය |
|---|---|---|
| **සමාජීය බලපෑම** | | |
| අධ්‍යාපනය වෙත ප්‍රවේශය | ඊ ඉගෙනුම් වේදිකා සහ ඩිජිටල් අධ්‍යාපනික සම්පත් සපයන අධ්‍යාපන තාක්ෂණ සමාගම් වැනි මාර්ගගත සහ වෘත්තීය පුහුණුව ඇතුළුව දැරිය හැකි මිලකට ලබා ගත හැකි සහ ප්‍රවේශය සහිත අධ්‍යාපන ආයතන සහ වැඩසටහන්. | **උපායමාර්ගික මෙහෙයුම සහ මාර්ග සිතියම:**<br>සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සංවර්ධනය සඳහා පැහැදිලි දැක්මක් සහ මඟ පෙන්වීමක් සැපයීම.<br><br>**ප්‍රතිපත්තිය සහ රෙගුලාසි:**<br>සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සඳහා සහාය දක්වන ප්‍රතිපත්ති සහ නියාමන රාමු සැපයීම.<br><br>**නීති සම්පාදනය:**<br>සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවල වර්ධනයට පහ සුකම් සැලසීම සහ තිරසර ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා අදාළ නීති පැනවීම.<br><br>**පිළිගැනීම:**<br>සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවල ප්‍රයත්නයන් සහ ජයග්‍රහණ පිළිගැනීම සහ ප්‍රවර්ධනය කිරීම.<br><br>**ප්‍රතීතනය:**<br>සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවල තිරසර භාවය සහ සංයුක්ත බව තහවුරු කිරීම සඳහා විධිමත් ප්‍රතීත ක්‍රියාවලීන් පිරිනැමීම.<br><br>**සහතිකකරණය:**<br>සංයුක්ත සහ තිරසර ව්‍යාපාර පාරිසරික සහ සමාජීය ප්‍රමිතීන්ට අනුකූල වන බවට තහවුරු කිරීම සඳහා |
| ආදායම් උත්පාදනය | ව්‍යවසායකත්වය සහ ස්වයං රැකියා අවස්ථා ප්‍රවර්ධනය කරන සමාජ ව්‍යවසායන් හා ව්‍යාපාර සහ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සහ රැකියා පුහුණු වැඩසටහන් ආදායම් උත්පාදනය කිරීම සහ රැකියා සොයා ගැනීම සඳහා පුද්ගලයන් සවිබලගැන්වීම අරමුණු කර ගැනීම. | |
| දැරිය හැකි මිලක් මත සෞඛ්‍ය සේවා සහ සුවතාව වෙත ප්‍රවේශය | සෞඛ්‍ය සායන, ජංගම සෞඛ්‍ය ඒකක සහ අඩු වියදම් ඖෂධ සහ වෛද්‍ය සැපයුම් කෙරෙහි අවධානය යොමු කරන ඖෂධ සමාගම් වැනි ප්‍රවේශ විය හැකි සහ දැරිය හැකි මිලකට සෞඛ්‍ය සේවා සපයන ටෙලිමෙඩිසින් වේදිකාවන් | |
| වැඩිදියුණු කළ යහපැවැත්ම සහ ජීවන තත්ත්වය | පිරිසිදු බලශක්ති විසඳුම් සහ වැඩිදියුණු කළ නිවාස තත්ත්වයන් වෙත ප්‍රවේශය සපයන සංවිධාන ඇතුළුව ඉහළ නංවන ලද යහ පැවැත්මට දායක වන සුවතා මධ්‍යස්ථාන, යෝග්‍යතා වැඩසටහන් සහ මානසික සෞඛ්‍ය සේවාවන්. | |
| කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම | කාන්තාවන්ගේ ආර්ථික සහභාගීත්වය සහ නායකත්වය ප්‍රවර්ධනය කරන කාන්තාවන් විසින් මෙහෙයවන සමාගම් ඇතුළුව කාන්තා කේන්ද්‍රීය ව්‍යාපාර සංවර්ධන වැඩසටහන් සහ ක්ෂුද්‍ර ණය සපයන සංවිධාන. | |
| ආන්තික කණ්ඩායම් සවිබල ගැන්වීම | සංයුක්ත බඳවා ගැනීමේ පිළිවෙත් සහ විවිධත්වය කේන්ද්‍ර කරගත් ව්‍යාපාර හරහා ආදිවාසී ජනගහනය සහ සරණාගතයින් ඇතුළුව ආන්තික ප්‍රජාවන් සවිබල ගැන්වීම සඳහා කැප වූ සමාජ ව්‍යසායන් සහ ව්‍යාපාර. | |
| ආබාධ සහිත පුද්ගලයින් සඳහා වැඩි කළ අවස්ථා | ආබාධිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සහ ප්‍රවේශතා ප්‍රමිතීන් වෙනුවෙන් පෙනී සිටින පුද්ගලයන් ඇතුළුව ආබාධ සහිත පුද්ගලයන්ට ප්‍රවේශ විය හැකි නිෂ්පාදන, සේවා සහ රැකියා අවස්ථා ලබා දෙන සමාජ ව්‍යවසායන් සහ ව්‍යාපාර. | |
| ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය | ඉදිකිරීම් සහ යටිතල පහසුකම් සංවර්ධන සමාගම් තිරසර සහ සංයුක්ත නාගරික පරිසර නිර්මාණය කිරීම සඳහා කැප වූ නාගරික සැලසුම් ආයතන ඇතුළු පාසල්, සායන සහ ප්‍රජා මධ්‍යස්ථාන වැනි අත්‍යවශ්‍ය ප්‍රජා පහසුකම් ගොඩනැගීම කෙරෙහි අවධානය යොමු කිරීම. | |
| ආපදා සහන සහ මානුෂීය ආධාර | සමාජ ව්‍යවසායන් සහ ආපදා සඳහා ප්‍රතිචාර දක්වන කාර්ය සම්පාදනය සහ සැපයුම් සම්බන්ධයෙන් විශේෂිත වූ ව්‍යවසායන් සහ ව්‍යාපාර ඇතුළුව අර්බුද සහ ස්වභාවික ව්‍යසනවලදී හදිසි සහාය සපයන සංවිධාන. | |

<table>
<tr><th>බලපෑමට ලක් වන ක්ෂේත්‍ර</th><th>සංයුක්ත සහ තිරසර ව්‍යාපාර වර්ග</th><th rowspan="2">අවශ්‍ය සහාය</th></tr>
<tr><th colspan="2">පාරිසරික බලපෑම</th></tr>
<tr><td>ජෛව විවිධත්ව සංරක්ෂණය සහ පුනර්ජනනය</td><td>ජෛව විවිධත්වයට හිතකර ගොවිතැන් පිළිවෙත් ප්‍රවර්ධනය කරන තිරසර කෘෂිකාර්මික ව්‍යාපාර ඇතුළුව ප්‍රති වන වගාව, වාසස්ථාන ප්‍රතිසංස්කරණය සහ වනජීවී සංරක්ෂණ ප්‍රයත්නයන්හි නියැලී සිටින සංවිධාන.</td><td rowspan="10">දිරිදීමනා:<br>තිරසර භාවිතයන් අනුගමනය කිරීම කෙරෙහි සංයුක්ත සහ තිරසර ව්‍යාපාර දිරිගැන්වීම සඳහා දිරිදීමනා සහ ත්‍යාග පිරිනැමීම.<br><br>මූල්‍ය ප්‍රවේශය:<br>සංයුක්ත සහ තිරසර ව්‍යාපාර වලට සහාය වීම සඳහා විවිධ මූල්‍ය උපකරණ සහ සම්පත් වෙත ප්‍රවේශය සහතික කිරීම.<br><br>ආයෝජන:<br>සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවල වර්ධනය සඳහා රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයෙන්ම ආයෝජන ආකර්ෂණය කර ගැනීම.<br><br>ධාරිතා සංවර්ධනය:<br>සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවල හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා පුහුණුව, අධ්‍යාපනය සහ සම්පත් සැපයීම.<br><br>තොරතුරු:<br>සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා අවශ්‍ය අදාළ දත්ත, දැනුම සහ සම්පත් වෙත ප්‍රවේශය ලබාදීම.<br><br>හවුල්කාරිත්වයන්:<br>තිරසරභාවය සහ සංයුක්ත බව ප්‍රවර්ධනය කිරීම සඳහා සංයුක්ත සහ තිරසර ව්‍යාපාර, රාජ්‍ය ආයතන, ආයෝජකයින් සහ අනෙකුත් පාර්ශවකරුවන් අතර සහයෝගීතාවන් සහ හවුල්කාරිත්වයන් දිරිමත් කිරීම.</td></tr>
<tr><td>අපද්‍රව්‍ය උත්පාදනය අඩු කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය කිරීම</td><td>කසළ ගොඩ ගැසීම සඳහා වන අපද්‍රව්‍ය ප්‍රමාණය අවම කිරීමට අපද්‍රව්‍යය එකතු කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම සහ මුල් භාණ්ඩයට වඩා වටිනාකමින් වැඩිදෙයක් බවට පත් කර නැවත භාවිතා කිරීම (upcycling) පිළිබඳ විශේෂඥතාව සහිත ව්‍යාපාර; සහ ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය හෝ e-අපද්‍රව්‍යය ප්‍රතිචක්‍රීකරණය වැනි ප්‍රතිචක්‍රීකරණ තාක්ෂණයන් නව්‍යකරණය කරන ව්‍යාපාර.</td></tr>
<tr><td>බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම</td><td>බලශක්ති කළමනාකරණ පද්ධති සඳහා ස්මාර්ට් තාක්ෂණය සපයන්නන් ඇතුළුව නිවාස, ගොඩනැගිලි සහ කාර්මික ක්‍රියාවලීන් හි බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා බලශක්ති විගණන සහ විසඳුම් ලබා දෙන සමාගම්.</td></tr>
<tr><td>තිරසර සැපයුම් දාම කළමනාකරණය</td><td>සාධාරණ ශ්‍රම පරිචයන් සහ පාරිසරික වශයෙන් වග කියන සේවාවන් ලබා ගැනීම සම්බන්ධයෙන් සලකා බලා තිරසර සහ සදාචාරාත්මක සැපයුම්දාමයන් ස්ථාපිත කිරීමට වෙනත් සමාගම් වලට උපකාර කරන ව්‍යාපාර.</td></tr>
<tr><td>කාබන් ඩයොක්සයිඩ් විමෝචනය අඩු කිරීම සහ කාබන් උදාසීනතාව</td><td>කාබන් උදාසීනතාව සාක්ෂාත් කර ගැනීම සඳහා හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම හෝ ග්‍රහණය කර ගැනීම ඉලක්ක කරගත් ව්‍යාපෘති සඳහා ආයෝජනය කරන කාබන් විමෝචනය අඩු කිරීම සිදු කරන්නන්.</td></tr>
<tr><td>පුනර්ජනනීය බලශක්ති භාවිතය</td><td>පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සකස් කරන්නන් ඇතුළුව සූර්ය පැනල, සුළං ටර්බයින සහ අනෙකුත් පුනර්ජනනීය බලශක්ති පද්ධති ස්ථාපනය කිරීමේ විශේෂඥතාව සහිත සමාගම් පිරිසිදු බලශක්ති ධාරිතාව වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු කරන සමාගම්.</td></tr>
<tr><td>හරිත ගොඩනැගිලි නිර්මාණය</td><td>තිරසර ගොඩනැගිලි ද්‍රව්‍ය සහ තාක්ෂණය සපයන්නන් ඇතුළුව පරිසර හිතකාමී, බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සැලසුම් කරන සහ ගොඩනගන සමාගම්.</td></tr>
<tr><td>පාරිසරික අධ්‍යාපනය සහ දැනුවත්භාවය</td><td>ස්වභාවික පරිසරයන් තුළ අධ්‍යාපනික සහ සමීප අත්දැකීම් සපයන පරිසර හිතකාමී සංචාරක ව්‍යාපාර ඇතුළුව පාරිසරික දැනුවත්භාවය ඉහළ නැංවීම සහ තිරසර ජීවන රටාව ප්‍රවර්ධනය කිරීම සඳහා අධ්‍යාපනික වැඩසටහන්, අන්තර්ගතය සහ තාක්ෂණය සංවර්ධනය කරන සංවිධාන.</td></tr>
<tr><td>ජල සංරක්ෂණය සහ වායු ගුණාත්මකභාවය</td><td>තිරසර ජල කළමනාකරණය සඳහා උපදේශන සේවා සපයන ව්‍යාපාර ඇතුළුව ජල පිරිපහදු තාක්ෂණයන්, වායු තත්ත්ව අධීක්ෂණ පද්ධති සහ දූෂණය පාලනය කරන ක්‍රම පිළිබඳ විශේෂඥතාවයක් සහිත සමාගම්.</td></tr>
<tr><td>ජලය, සනීපාරක්ෂාව සහ ස්වස්ථතාව (WASH)</td><td>නව්‍ය, පරිසර හිතකාමී සනීපාරක්ෂක නිෂ්පාදන නිපදවන්නන් ඇතුළු අඩු පහසුකම් සහිත ප්‍රජාවන් තුළ පිරිසිදු ජලය, සනීපාරක්ෂක පහසුකම් සහ ස්වස්ථතාව පිළිබඳ අධ්‍යාපනය වෙත ප්‍රවේශය ඉහළ නැංවීම සඳහා කටයුතු කරන සංවිධාන.</td></tr>
</table>

# 3 ශ්‍රී ලංකාව තුළ සමාජීය සහ පාරිසරික ප්‍රමුඛතා

මානව සංවර්ධන දර්ශකයට ඇතුළත් කර ඇති රටවල් අතරින් සියයට අනූවක්ම 2020 සහ 2021 වසරවල මානව සංවර්ධන දර්ශකවල පෙර නොවූ විරූ විපර්යාසයන් දක්නට ලැබුණේ කොවිඩ්19, භූ දේශපාලනික ගැටළු සහ දේශගුණික විපර්යාස (UNDP, 2022) නිසා ඇති වූ පාරිසරික ව්‍යසනයන් හේතුවෙනි. ශ්‍රී ලංකාව ද මෙම සිදුවීම්වල බලපෑමෙන් නිදහස් නොවූ අතර ඒවා මඟින් නව සමාජීය හා පාරිසරික අභියෝග එල්ල විය.

## 3.1 සමාජීය අභියෝග සහ ප්‍රමුඛතා

### දරිද්‍රතාව

2022 වසරේ තෙවන සහ සිව්වන කාර්තුවල ආර්ථිකය දැඩි ලෙස හැකිලී ගිය අතර ජාතික දරිද්‍රතා මට්ටම ජනගහනයෙන් සියයට 25 ඉක්මවා ගොස් ඉදිරි වසර කිහිපය තුළ එවැනි මට්ටම්වලට වඩා ඉහළින් පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇත (World Bank, 2023). ලෝක ආහාර වැඩසටහන ඇස්තමේන්තු කර ඇති පරිදි, 2022 වසර අවසානය වන විට ජනගහනයෙන් සියයට 85 ක් මුදල් ණයට ගැනීම, අධ්‍යාපනය සහ සෞඛ්‍යය සඳහා වියදම් අඩු කිරීම, ඉතුරුම් වියදම් කිරීම හෝ නියමිත ණය ගෙවීම් ප්‍රමාද කිරීම වැනි ජීවනෝපාය මත පදනම් වූ ක්‍රමෝපායන් මත විශ්වාසය තබා ඇත: (Central Bank of Sri Lanka, 2023)

### ස්ත්‍රී පුරුෂ සමාජභාවය

2019 සහ 2021 අතර මානව සංවර්ධන දර්ශකයට අදාළව ශ්‍රී ලංකාවේ සමස්ත කාර්ය සාධනය නොවෙනස්ව පැවති අතර ස්ත්‍රී පුරුෂ අසමානතා දර්ශකය මඟින් මනිනු ලබන ආකාරයට ස්ත්‍රී පුරුෂ අසමානතා ව 2019 වසරේ 0.401 ට සාපේක්ෂව 2021 දී 0.383 දක්වා අඩු විය (UNDP, 2022). කෙසේ වුවද, කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය 2022 දී සියයට 32.1 දක්වා පහත වැටුණු අතර එය පසුගිය වසර 12 තුළ දෙවන අඩුම වාර්ෂික අනුපාතය වන අතර 2017 දී ඉහළම මට්ටමේ සහභාගීත්වය වන සියයට 36.6 ට වඩා අඩුය (Central Bank of Sri Lanka, 2023).

### ආහාර සහ පෝෂණය

2022 දී වයස අවුරුදු 5 ට අඩු ළමුන් අතර මිටි බව සහ ක්ෂය බව පිළිවෙලින් සියයට 9.2 සහ 10.1 දක්වා ඉහළ ගිය අතර එය 2021 දී වාර්තා වූ සියයට 7.4 සහ 8.2 ට සාපේක්ෂව කැපී පෙනෙන වැඩි වීමක් පෙන්නුම් කරයි (Central Bank of Sri Lanka, 2023)'

2022 වර්ෂය අවසානයේ, සමීක්ෂණයට භාජනය කරන ලද ගෘහ ඒකකවලින් සියයට 27 ක වැඩිහිටියන් තම දරුවන් පෝෂණය කිරීම සඳහා ආහාර වේල් කැප කරන බව වාර්තා විය (Central Bank of Sri Lanka, 2023).

2030 වන විට ශ්‍රී ලංකාව කුසගින්නෙන් මිදීමේ ඉලක්කය ළඟා කර ගැනීමේ ප්‍රගතිය අඩු මට්ටමක පවතින බව 2022 තිරසර සංවර්ධන වාර්තාව මඟින් පෙන්නුම් කෙරේ. (Sachs et al, 2022)

### සෞඛ්‍ය සහ අධ්‍යාපනය වෙත වන ප්‍රවේශය

කොවිඩ්19 හේතුවෙන් රට අගුළු දැමීමේ පියවර සහ ආර්ථික අර්බුදය හේතුවෙන් ප්‍රවාහන සේවා සහ අවශ්‍යතාවන් නොමැතිකමින් ළමුන් මිලියන 4.8 කගේ අධ්‍යාපනයට බාධා එල්ල වී ඇති (Laryea, 2022) අතර ළමුන් මිලියන 1.1 කට අධ්‍යාපන සහාය අවශ්‍ය වේ (UNICEF" 2023).

ඖෂධ හිඟය, කල් දැමූ ශෛල්‍යකර්ම සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විශේෂඥයින්ගේ සැලකිය යුතු ප්‍රමාණයක් රටින් පිටවී යාම (WHO, 2023) ඇතුළුව ජාතියේ සෞඛ්‍ය ආරක්ෂණ පද්ධතිය සැලකිය යුතු දුෂ්කරතා ප්‍රමාණයකට මුහුණ දෙයි. විශේෂඥ වෛද්‍යවරුන් 1,000කට අධික පිරිසක් රට හැර ගොස් ඇති බවට වාර්තා වේ (Ceylon Today, 2023)



### 3.2 පාරිසරික අභියෝග සහ ප්‍රමුඛතා

#### දේශගුණික අවදානම් වලට අනුවර්තනය වීම සහ ඒවා අවම කිරීම

ගෝලීය දේශගුණික අවදානම් දර්ශකය 2020 (Eckstein etal, 2019) අනුව වඩාත්ම දේශගුණික අවදානම්වලට ලක්වීමේ හැකියාව ඇති රටවල් 10 අතරට ශ්‍රී ලංකාව ශ්‍රේණිගත කර ඇත. එම දර්ශකයට අනුව ශ්‍රී ලංකාව තුළ 2018 දී දේශගුණික විපත් ආශ්‍රිත මරණ 36 ක් සහ 2019 දී මරණ 33 ක් වාර්තා වී ඇත (Eckstein et al, 2021). ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් සියයට 90 ක් මධ්‍යස්ථ සහ දරුණු දේශගුණික විපත් සහිත ස්ථාන ලෙස ශ්‍රේණිගත කර ඇති ස්ථානවල ජීවත් වන බවට ලෝක බැංකුව (2018) ඇස්තමේන්තු කර ඇත.

2015 පැරිස් ගිවිසුමේ ඉලක්ක සපුරා නොගතහොත්, කාබන් විමෝචනයට අදාළ අයහපත් ම ප්‍රතිඵලය යටතේ දළ දේශීය නිෂ්පාදිතයේ ඩොලර් බිලියන 50 ක අඩුවීමක් ඇති කරමින් 2.0 ° C දක්වා උෂ්ණත්වය ඉහළ යාමක් සිදු විය හැකිය (World Bank, 2018). ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ තෙත් ස්වභාවය සහ වියළි කලාපයේ වියළි ස්වභාවය තවත් වැඩි වීම රටේ ආහාර නිෂ්පාදනයට බලපාන අතර එය කුඩා වතු හිමියන්ට විසමානුපාතික ලෙස බලපාන බව දේශගුණික විපර්යාස පිළිබඳ පුරෝකථන මඟින් පෙන්නුම් කරයි (World Bank and CIAT, 2015)

#### බලශක්තිය මත යැපීම සහ පුනර්ජනනීය බලශක්තිය

ජාතික වශයෙන් තීරණය කර ඇති දායකත්වයන් යටතේ 2030 වන විට විදුලි උත්පාදනයෙන් සියයට 70 ක් පුනර්ජනනීය බලශක්තිය මඟින් නිපදවා ගැනීමට ශ්‍රී ලංකාව කැපවී සිටියි (Ministry of Environment) 2021. 2022 දී විදුලි බලයෙන් සියයට 52 ක් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් ජනනය කරන ලදී. පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් ජනනය කරන ලද විදුලියෙන් සියයට 81 ක් ජල විදුලිය වන අතර සුළඟ සහ සූර්ය බලශක්තිය සියයට 9 බැගින් දායක වී ඇත. (Ceylon Electricity Board, n.d.)

ශ්‍රී ලංකාවේ ජල විදුලි නිෂ්පාදනය කාලගුණික රටාවල දැඩි බලපෑමට ලක් වන අතර බොහෝ විට රජය බලාපොරොත්තු වූවාට වඩා අඩු වර්ෂාපතනයක් පවතින විට තාප ශක්තිය මිලදී ගැනීමට යොමු විය යුතුය. එබැවින්, මෙරට පුනර්ජනනීය බලශක්ති ඉලක්ක සපුරා ගැනීම සඳහා වෙරළබඩ මූලාශ්‍ර ඇතුළු පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් විවිධාංගීකරණය කිරීම රටට අත්‍යවශ්‍ය වේ. (Government of Sri Lanka, 2022)

#### අපද්‍රව්‍ය අවම කිරීම සහ කළමනාකරණය

ශ්‍රී ලංකාව දෛනිකව ඝන අපද්‍රව්‍ය ටොන් 7,000ක් නිකුත් කරන අතර බස්නාහිර පළාත මෙම ප්‍රමාණයෙන් සියයට 60 කට ආසන්න ප්‍රමාණයකට දායක වේ (EFL, 2017). එක්සත් ජාතීන්ගේ ආහාර අපද්‍රව්‍ය දර්ශකයට අනුව වාර්ෂිකව සාමාන්‍ය ශ්‍රී ලාංකිකයෙකු ආහාර අපද්‍රව්‍ය කිලෝග්‍රෑම් 76 ක් නිකුත් කරන අතර ජාතික වශයෙන් ටොන් 1,617,738 ක් නිකුත් කරයි (United Nations Environment Programme, 2021). ශ්‍රී ලංකාව වසරකට ප්ලාස්ටික් අපද්‍රව්‍යය ටොන් මිලියන 1.59 ක් නිපදවයි. ශ්‍රී ලංකා වෙරළ තීරයේ මත්ස්‍ය සම්පත 1980 දී ටොන් 300,000 සිට 2018 දී ටොන් 53,000 දක්වා පහත වැටීමට දායක වන ප්‍රධාන සාධකයක් ලෙස ක්ෂුද්‍ර ප්ලාස්ටික් දූෂණය සලකනු ලැබේ (Cole, 2020).

#### වන විනාශය සහ ජෛව විවිධත්වය නැති වී යාම

ශ්‍රී ලංකාව සත්ව සහ වෘක්ෂලතා විශේෂ 9,400 කට අධික සංඛ්‍යාවක් සහිත ලොව වැඩිම ජෛව විවිධත්වයකින් යුතු ස්ථාන වලින් එකකි. ජෛව විවිධත්වය සුරැකීමේ දී මුහුණ දීමට සිදු වන ප්‍රධාන අභියෝග අතර වන විනාශය, කඩොලාන සහ තෙත්බිම් වැනි ඉතා වැදගත් වාසස්ථාන හායනය, අධි උපයෝජනය හේතුවෙන් ශාක සහ සත්ව විශේෂ වඳවී යාමේ අවදානම, ආක්‍රමණශීලී විශේෂ පැතිරීම සහ සත්ව මිනිස් ගැටුම් ඇතුළත් වේ (Ministry of Environment, 2022). ශ්‍රී ලංකාවේ වන ආවරණය 2015 දී භූමි ප්‍රමාණයෙන් සියයට 29.7 ක් පමණ වූ (Ministry of Environment, 2022) නමුත් එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානයට අනුව 2020 වන විට එය භූමි ප්‍රමාණයෙන් ඇස්තමේන්තුගත සියයට 28.4ක් දක්වා අඩු වී ඇත (Samaraweera, 2021).

#### ජල සම්පත

රටේ ජල සැපයුම වර්ෂාපතනය මත රඳා පැවතීම සහ අසමාන අවකාශ ව්‍යාප්තිය හා ඉහළ අන්තර් වාර්ෂික විචලනයේ ප්‍රතිඵයක් ලෙස ජල හිඟය නැවත නැවතත් ඉස් මතු වේ. දේශගුණික විපර්යාස මඟින් වර්ෂාපතන රටාවලට බාධා එල්ල වී ඇති අතර ගැටළුව තවත් බරපතල තත්ත්වයට පත් කරයි. ජනගහනයෙන් සියයට 55 කට වඩා වැඩි පිරිසක් වාසය කරන තෙත් කලාපයට වසර පුරා අඛණ්ඩ වර්ෂාපතනයක් ලැබෙන නමුත් ඉඩම් හිඟය සැලකිය යුතු බාධාවක් වේ. ඊට හාත්පසින්ම වෙනස්ව, බොහෝ වගා කළ හැකි ඉඩම් පවතින වියළි කලාපය, අසමාන වර්ෂාපතන ව්‍යාප්තිය සහ ඉහළ වාෂ්පීකරණ අනුපාත හේතුවෙන් විශේෂයෙන් මාස පහක කාලයක් පුරාවට ජල හිඟයට මුහුණ දෙයි (Ministry of Environment, 2022)

#### වෙරළ සහ සාගර සම්පත්

ශ්‍රී ලංකාවේ වෙරළබඩ කලාප ජනාකීර්ණ වන අතර ආසන්න වශයෙන් ජනගහනයෙන් සියයට 40 ක් දේශගුණික විපර්යාස බලපෑම් වලට ගොදුරු විය හැකි වෙරළබඩ නගරවල වාසය කරයි. ස්වාභාවික සහ මානව සාධක හේතුවෙන් ඇති වන වෙරළ ඛාදනය තීරණාත්මක අභියෝගයක් වන අතර එමඟින් වෙරළ තීරය අඩු වීම සහ මිරිදිය ප්‍රභවයන්ට ලවණ ජලය ඇතුළු වීම සිදු වේ. තවද, විශේෂයෙන් කඩොලාන වැනි වෙරළබඩ වාසස්ථාන විනාශ කිරීම වෙරළබඩ ප්‍රජාවන්ගේ අවදානම වැඩි කරයි (Ministry of Environment, 2022).

# 4 ශ්‍රී ලංකාව තුළ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර

ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සඳහා තිරසර සහ සංයුක්ත ප්‍රතිඵල වලට තුඩු දෙන සංයුක්ත ව්‍යාපාර ආකෘති සංවර්ධනය කිරීමට අවස්ථා කිහිපයක් පවතියි. ව්‍යාපාර වල වෙනසක් කළ හැකි ප්‍රධාන බලපෑම් ක්ෂේත්‍රවලට පහත දෑ ඇතුළත් වේ:

- කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය
- පුනර්ජනනීය බලශක්තිය
- කෘෂිකර්මාන්තය
- පරිසර හිතකාමී සහ තිරසර සංචාරක ව්‍යාපාරය
- චක්‍රීය ආර්ථිකය
- පරිසර හිතකාමී අන්දමින් නිපදවූ ඇඳුම්
- ඩිජිටල් නවෝත්පාදනය
- හරිත මූල්‍යනය

සැබැවින්ම ශ්‍රී ලංකාවේ ප්‍රධාන බලපෑම් ක්ෂේත්‍ර තුළ දැනටමත් සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සඳහා උදාහරණ තිබේ.



### 4.1 කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය ඉහළ නැංවීම

ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම බලකායේ අඩු සහභාගීත්වය ආර්ථික සංවර්ධනයට සහ සමාජ ප්‍රගතියට සැලකිය යුතු අභියෝගයක් එල්ල කරයි.
කාන්තා ජනගහනය පිරිමි ජනගහනයට වඩා වැඩි වන අතර රාජ්‍ය විශ්ව විද්‍යාල පිරිමි උපාධිධාරීන්ට වඩා කාන්තා උපාධිධාරීන් බිහි කරයි (Mendis, 2013). එසේම කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය පිරිමි ශ්‍රම බලකායේ සහභාගීත්වයෙන් අඩකටත් වඩා අඩුය. සැපයුම් අංශයේ විශ්ලේෂණ මඟින් ගෙවීම් නොකරන රැකවරණ සහ ගෘහාශ්‍රිත කටයුතු, කුසලතා අඩු වීම සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අනුව වෙනස් කොට සැලකීම මූලික සැපයුම් අංශයට අදාළ සාධක ලෙස හඳුනාගෙන ඇත. (Gunatilaka and Chandrasiri, 2022). මීට අමතරව, පිරිමින්ට මෙන් කාන්තාවන්ට තම වෘත්තීය ජීවිතය තුළ ඉදිරියට යාමට නොහැකි වී තිබේ. සමාගම් මණ්ඩලවල අධ්‍යක්ෂවරුන්ගෙන් සියයට 9 ක්, ආයතනික කළමනාකාරිත්වයෙන් සියයට 16 ක් [ජ්‍යෙෂ්ඨ] සහ කළමනාකරණ කණ්ඩායමෙන් සියයට 13 ක් පමණක් කාන්තාවන් වේ (Gunawardana, 2017). කාන්තාවන්ගේ ප්‍රමාණය විශාල, නමුත් ප්‍රයෝජනයට නොගත් ආර්ථික සම්පතක් ලෙස පවතී. කාන්තාවන් වැඩි වශයෙන් ආර්ථිකයට දායක කර ගැනීම දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නංවනු ඇත. කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය ඉහළ නැංවීම මඟින් විවිධ කුසලතා සහිත සංචිතයක් ඇති වන අතර නිර්මාණශීලීත්වය, නවෝත්පාදන සහ ව්‍යාපාර වර්ධනයට සහ තරඟකාරීත්වයට හේතු විය හැකි විවිධ දෘෂ්ටිකෝණයන් ගොඩ නගනු ඇත. විවිධත්වය වැළඳ ගන්නා සමාගම් බොහෝ විට මූල්‍ය කාර්ය සාධනය සහ සමස්ත සාර්ථකත්වය අනුව සම මට්ටමේ සමාගම් අභිබවා යයි (Lorenzo et al', 2018).

ව්‍යාපාර වලට ළමා රැකවරණය සඳහා පහසුකම් සැලසීම, නම්‍යශීලී වැඩ කිරීමේ ආකෘති යොදා ගැනීම සහ අමතර ප්‍රතිලාභ හෝ සෞඛ්‍ය, මූල්‍ය කළමනාකරණය සහ නායකත්ව කුසලතා වැනි සේවා වෙත ප්‍රවේශය ලබා දිය හැකි ක්‍රම ගවේෂණය කිරීම (Selyn සහ English Tea Company යන උදාහරණය බලන්න) මඟින් කාන්තා ශ්‍රම බලකා සහභාගීත්වය වැඩි කිරීමට උපකාරී විය හැකිය.

# Selyn Handloom

වසර 30 කට පෙර ආරම්භ කරන ලද කාන්තා මූලික ව්‍යාපාරයක් වන Selyn" ශ්‍රී ලංකාවේ අත්යන්ත්‍ර සහ අත්කම් කර්මාන්තයේ ප්‍රධාන ක්‍රියාකාරිකයෙකි. එය සාධාරණ වෙළෙඳාම සහ සතුන් භාවිතයෙන් පරීක්ෂා නොකරන බවට සහතික කළ ශ්‍රී ලංකාවේ එකම අත්යන්ත්‍ර රෙදිපිළි සමාගම වන අතර ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ආන්තික කණ්ඩායම් වලට අයත් කාන්තාවන් 1,000 කට ආසන්න සංඛ්‍යාවක් සඳහා නම්‍යශීලී රැකියා සහ ජීවනෝපාය අවස්ථා ලබා දෙයි. ශ්‍රම සංක්‍රමණයට ගොදුරු විය හැකි අවිධිමත් ආර්ථිකය තුළ වන කාන්තාවන් කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු කෙරෙන අතර ඔවුන් විසින් නම්‍යශීලී වැඩ විකල්ප, ළමා රැකවරණය, නායකත්ව පුහුණුව සහ ව්‍යවසායකත්ව සහාය ලබා දෙනු ලැබේ. මූල්‍ය කළමනාකරණය, සෞඛ්‍ය පරීක්ෂාවන් සහ පුද්ගල සංවර්ධන වැඩසටහන් වැනි අමතර සේවාවන්, තීරණ ගැනීම සහ වර්ධනය සඳහා අත්‍යවශ්‍ය කුසලතා වලින් ප්‍රජාවන් සන්නද්ධ කරයි. ආ. Selyn විසින් ගෝලීය වෙළෙඳපොළ තුළ ලබා ගත හැකි ඉහළ වටිනාකමකින් යුත් නිෂ්පාදන ඉදිරිපත් කර ඇති අතර සැපයුම් දාම විනිවිදභාවය සඳහා ගනුදෙනු පිළිබඳ දත්ත සංකලනයෙහි (blockchain integration) පුරෝගාමියා විය. ඇ. තවද, Selyn හි #BleedGood මුලපිරීම මඟින් ග්‍රාමීය ප්‍රජාවන්ට නැවත භාවිතා කළ හැකි සනීපාරක්ෂක තුවා, ආර්තව සනීපාරක්ෂාව පිළිබඳ දැනුවත් කිරීම සහ ප්‍රජනක සෞඛ්‍ය පරීක්ෂාවන් ලබා ගත හැකි වන තිරසර ආකෘතියක් සපයයි.

**අභිප්‍රේරණය**

ප්‍රධාන ධාරාවේ රැකියා වෙළඳපොළෙන් බැහැර වූ කාන්තාවන්ට නම්‍යශීලී රැකියා අවස්ථා සහ අත්‍යවශ්‍ය සේවා සැපයීම මෙන්ම ඔවුන්ගේ සංවර්ධනය සහ සවිබල ගැන්වීම සඳහා කුසලතා වර්ධනයට අවස්ථා සැලසීම

**බලපෑම**

නව්‍ය නිෂ්පාදන සහ තාක්ෂණය හරහා සාම්ප්‍රදායික සාධාරණ වෙළඳ ව්‍යාපාර ආකෘති බවට පරිවර්තනය කිරීම

**නවෝත්පාදනය**

ශ්‍රී ලංකාවේ කාන්තා ශිල්පීන් 1,000 කට අධික පිරිසකට ස්ථාවර රැකියාවක් සහ ගෞරවාන්විත ජීවනෝපායක් සහතික කිරීම

**සටහන්:**


අ. Ada Derana (2019) Selyn as Best Practice for Employer Supported Child Care. 22 January . Available at http://bizenglish.adaderana.lk/selyn-as- best-practice-for-employer-supported-child-care/ හි දී ලබා ගත හැකිය.

ආ. United Nations Development Programme, Sri Lanka (2021). A test of Resilience by UNDP Sri Lanka - Exposure. Https://undpsrilanka හි දී ලබා ගත හැකිය. exposure.co/a-test-of-resiliencenbsp?locale=en%2Ffor-sports%2Fyear+in+review%2Ficeland%2Fyear+in+review%2Fjapan%3Fmore%3Dtrue.

ඇ. Daily FT (2023). Handloom fame Selyn pioneers blockchain technology with The London College of Fashion. www.ft.lk/front-page/ Handloom-fame-Selyn-pioneers-blockchain-technology-with-The-London-College-of-Fashion/44-746789 වෙතින් ලබා ගත හැකිය.

ඈ. www.dailymirror.lk/news-features/BLEEDGOOD-WITH-SELYN-THIS-WOMENS-DAY/131-207315 n,kak.




**කාන්තා මූලික ව්‍යාපාරයක් වන Selyn Handlooms මඟින් ගෝලීය වෙළෙඳපොළ තුළ ලබා ගැනීමේ හැකියාව ඇති ඉහළ වටිනාකමකින් යුත් අත්කම් නිෂ්පාදන තනනු ලැබේ.**

**ඡායාරූපය: ශ්‍රී ලංකා තිරසර සංවර්ධන සභාව**

# English Tea Shop Organic (ETS)

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම කාබනික තේ සන්නාමය වන ETS ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ කාබනික ගොවීන්ගෙන් සිය තේ සහ උද්භිද විද්‍යාත්මක අමුද්‍රව්‍ය ලබා ගනී. Great Game of Business All Star 2020 සම්මානය පිරිනැමීමෙන් එම සමාගම පිළිගෙන ඇති අතර වසංගතය පවතින කාලසීමාව සමාගමේ කැපී පෙනෙන ඔරොත්තු දීමේ හැකියාව සහ ලාභදායිත්වය මඟින් එහි තිරසර ව්‍යාපාරික ආකෘතිය අවධාරණය කෙරේ. තේ වගාකරුවන්ගෙන් සෘජුවම තේ ලබා ගැනීමෙන් සමාගම සිය කණ්ඩායම, ගොවීන් සහ කොටස් හිමියන්ගේ වර්ධනයට ඉඩ සලසමින් කෘෂිකාර්මික තිරසරභාවය ඉහළ නංවයි. අ. වගකිවයුතු භාවිතයන් වෙනුවෙන් දැඩිව පෙනී සිටින ETS සමාගම ගොවි ප්‍රජාවන් තුළ තිරසර ප්‍රවේශයන් ඉදිරියට ගෙන යාමට අධ්‍යාපනය සහ පුහුණුව ලබා දීම පමණක් නොව ළමා ප්‍රතිලාභ දීමනාව ලබා දීමේ මුලපිරීම කෙරෙහි මූලිකත්වය ගෙන කටයුතු කිරීම ද සිදු කරයි. ළමා අයිතිවාසිකම් සහ ව්‍යාපාර මධ්‍යස්ථානය සහ Save the Children සමඟ වන මෙම සහයෝගීතාවය මඟින් සේවකයින්ට මානසික සමාජීය සහාය ලබා දෙන අතර එමඟින් තම දරුවන්ගේ යහපැවැත්ම සඳහා ආයෝජනය කිරීමට ඔවුන් සවිබල ගන්වයි. මෙම මුලපිරීම වයස අවුරුදු 16 ට අඩු ළමුන් සිටින සියලුම සේවකයින් සඳහා වන අතර එමඟින් සාකල්‍ය වර්ධනය කෙරෙහි සමාගමේ කැපවීම විදහා  දක්වයි. ආ. සන්නාමයේ හවුල් හිමිකාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා සැපයුම් දාම ආකෘති ගවේෂණය කිරීම සහ එමඟින් සන්නාමයේ ආර්ථික ලාභයෙන් ප්‍රතිලාභ ලබා ගැනිමට තේ කර්මාන්තය ආශ්‍රිත ආන්තික ප්‍රජාවන්ට සහාය වීම අනෙකුත් ETS මුලපිරීම් අතර වේ.

**අභිප්‍රේරණය**

ඔවුන්ගේ ජාලයේ ප්‍රමුඛතා අරමුණ සවිබල ගැන්වීම සහ යහපැවැත්ම සඳහා පරිපූර්ණ විසඳුම් ලබා දීම

**නවෝත්පාදනය**

ඔවුන්ගේ සේවකයින් සඳහා ළමා රැකවරණයට සම්බන්ධ සමාජීය සහය සහ සමාගම් අනුග්‍රහය ලබන වෛද්‍ය සහ ජීවිත රක්ෂණය, විස්තීර්ණ කාර්තුමය ලාභ බෙදාගැනීමේ වැඩසටහනක් සහ සියලුම සේවකයින් සඳහා එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂ වැටුප් වැනි වෙනත් මුලපිරීම් දියත් කිරීමේ පුරෝගාමීත්වය ගැනීම.

**බලපෑම**

B Corp සහතිකය ලබා ගැනීම සහ කුඩා පරිමාණ කාබනික තේ ගොවීන් 3,000 කට වැඩි පිරිසකගේ සහ ETS හි 300 ට අධික ස්ථිර සේවකයින්ගේ ජීවිත නඟා සිටුවීමට කටයුතු කිරීම.

**සටහන්:**

අ. Save the Children (2022) A first in Sri Lanka: English Tea Shop Organic සිය සේවකයින් සඳහා  ආයෝජනය කරන අතර ළමා ප්‍රතිලාභ දීමනා  මුලපිරීමෙහි මූලිකත්වය ගනියි. Https://srilanka.savethechildren.net/news/press-release-first-sri-lanka-english-tea-shop-organic-invests-its-employees-and-pilots-child වෙතින් ලබා ගත හැකිය.

Centre for Child Rights and Business (2022). The Centre, Save the Children and English Tea Shop Launches First Ever Company-Invested Child Benefit Allowance Initiative in Sri Lanka. Www.childrights-business.org/impact/the-centre-save-the-children-and-english-tea-shop- වෙතින් ලබා ගත හැකිය. launches-first-ever-company-invested-child-benefit-allowance-initiative-in-sri-lanka.html.

ආ. www.bcorporation.net/en-us/find-a-b-corp/company/english-tea-shop-group/ බලන්න.



කාන්තාවන් විශාල, නමුත් ප්‍රයෝජනයට නොගත් ආර්ථික සම්පතක් ලෙස පවතී. කාන්තාවන් වැඩි වශයෙන් ආර්ථිකයට දායක කර ගැනීමේ දළ දේශීය නිෂ්පාදිතය ඉහළ යනු ඇත.

කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය ඉහළ නැංවීම මඟින් විවිධ කුසලතා සහිත සංචිතයක් ඇති වන අතර නිර්මාණශීලීත්වය, නවෝත්පාදන සහ ව්‍යාපාර වර්ධනයට සහ තරඟකාරීත්වයට හේතු විය හැකි විවිධ ඇත.

ඡායාරූපය: ශ්‍රී ලංකා තිරසර සංවර්ධන සභාව

### 4.2 පුනර්ජනනීය බලශක්ති විසඳුම්



පුනර්ජනනීය බලශක්ති සංක්‍රාන්තිය කෙරෙහි ශ්‍රී ලංකාවේ කැපවීම මඟින් සූර්ය, සුළං, ජල හා ජෛව බලශක්ති විසඳුම් පිළිබඳ විශේෂිත වූ ව්‍යාපාර සඳහා දොරටු විවර කරයි. පිරිසිදු බලශක්ති උත්පාදනයට දායක වීම සහ කාබන් විමෝචනය අවම කිරීම සඳහා පුද්ගලික ව්‍යවසායන්ට ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ හැකිය. දැනට, රටේ විදුලිබලයෙන් ආසන්න වශයෙන් සියයට 52ක් ජනනය කරනු ලබන්නේ පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් වන අතර 2030 වන විට ශ්‍රී ලංකාව විදුලිබලයෙන් සියයට 70ක් පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් ජනනය කිරීමට අපේක්ෂා කරයි.

**2023 සිට 2030 දක්වා පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් සියයට 70 ක විදුලිය උත්පාදනය කිරීමේ ඉලක්කය සපුරා ගැනීමට ශ්‍රී ලංකාව ඩොලර් බිලියන 11 කට ආසන්න ආයෝජනයක් සිදු කිරීමට අවශ්‍ය වනු ඇත.**

**(Economynext, 2023)**

පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් නිපදවන විදුලිය සඳහා ගෝලීය ඉල්ලුම වැඩි වන විට, ශ්‍රී ලංකා දේශගුණික සෞභාග්‍යය සැලසුම මඟින් ඉන්දියාව සමග විදුලි ජාල සම්බන්ධතාව හරහා පුනර්ජනනීය ප්‍රභවයන්ගෙන් ජනනය වන විදුලියේ ශුද්ධ අපනයනකරුවෙකු වීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරයි. පුනර්ජනනීය විදුලි උත්පාදනය සඳහා ආයෝජනය කිරීමෙන් පුද්ගලික අංශයට දිගු කාලීන ලාභයක් අත්කර ගැනීමට මෙමඟින් අවස්ථා උදා වේ.

## WindForce

ශ්‍රී ලංකාවේ විශාලතම පුනර්ජනනීය බලශක්ති නිපදවන්නා WindForce වේ. ව්‍යාපාර, ප්‍රජාවන් සහ කර්මාන්ත සඳහා පිරිසිදු බලශක්ති ප්‍රවේශය ලබා දීමට හරිත බලශක්තිය සඳහා ඉහළ යන ඉල්ලුම සපුරාලීම සඳහා අවශ්‍ය වන උපකරණ සියල්ල සහිත පුනර්ජනනීය බලශක්ති බලාගාර එය සතු වන අතර ඒවායේ සංවර්ධනය සහ මෙහෙයුම් කටයුතු එමඟින් සිදු කරනු ලැබේ.

WindForce ආයතනය සිය ලාභයෙන් කොටසක් ජීවනෝපාය සහය, අධ්‍යාපනය සහ ළමා සංවර්ධනය, පරිසර සංරක්ෂණය සහ සෞඛ්‍ය ආරක්ෂණය ඇතුළු ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ සුබසාධනයට සහාය වීම සඳහා වන ප්‍රජා සංවර්ධන ව්‍යපෘති වෙනුවෙන් වෙන් කරයි.

| අභිප්‍රේරණය | නවෝත්පාදනය | බලපෑම |
| --- | --- | --- |
| ශක්‍යතාව සහිත, පරිසර හිතකාමී සහ නවීනතම පුනර්ජනනීය බලශක්ති බලාගාර සඳහා ආයෝජනය කිරීමෙන් ශ්‍රී ලංකාවේ විශාලතම පුනර්ජනනීය බලශක්ති නිෂ්පාදකයා වීමට අපේක්ෂා කරයි | පුනර්ජනනීය බලශක්ති උත්පාදනය සඳහා ගෝලීය වශයෙන් ලබා ගත හැකි නව්‍ය විසඳුම් සඳහා ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම මෙන්ම ශ්‍රී ලංකාවේ අවශ්‍යතා සඳහා එවැනි තාක්ෂණයන්ට අනුවර්තනය වීමට දේශීය නවෝත්පාදන එක් කිරීම | ව්‍යාපෘති 30ක් නිම කරමින් මෙගාවොට් 245.1ක ධාරිතාවක් ජනනය කිරීම |

**මූලාශ්‍රය** (https($$windforce'lk$wp-content$uploads$2023$06$Annual-Report-22_23'pdf බලන්න.

### 4.3 තිරසර කෘෂිකර්මාන්තය සහ කෘෂි ව්‍යාපාරය

නියඟය සහ අකාලයේ ඇති වන අධික වර්ෂාව, ගංවතුර සහ ඉඩම් හායනය ඇතුළු දේශගුණික විපර්යාස මඟින් එල්ල වන බලපෑම් කෘෂිකාර්මික අංශය මුහුණ දෙන ප්‍රධාන පාරිසරික අවදානම් වේ. ශ්‍රම හිඟය මෙම අංශයේ අඛණ්ඩ ඵලදායිතාව කෙරෙහි පවතින ප්‍රධාන අවදානමකි (PEC, 2019).

2030 වන විට ආහාර ඉල්ලුම සපුරාලීම සඳහා වගා කිරීම පිණිස තවත් හෙක්ටයාර් 223,000ක භූමි ප්‍රමාණයක් රටට අවශ්‍ය වේ (PEC, 2019). කෙසේ වුවද, වගා කළ හැකි ඉඩම් සඳහා ප්‍රවේශය සහ වන විනාශයේ අවදානම අවධානයට ලක්ව ඇති ප්‍රධාන කරුණු වේ. කුඩා වතු හිමි ගොවීන් ශ්‍රී ලංකාවේ ආහාර නිෂ්පාදනයේ ප්‍රධානත්වය දරන අතර ඔවුහු අවිධිමත් මට්ටමින් ක්ෂේත්‍රයේ නියැලී සිටිති දළ වශයෙන් කුඩා වතු හිමි ගොවීන් මිලියන 1.65 ක් සාමාන්‍යයෙන් හෙක්ටයාර 2 කට වඩා අඩු භූමි ප්‍රමාණයක වගා කරන අතර සමස්ත වාර්ෂික ආහාර නිෂ්පාදනයෙන් සියයට 80 කට දායක වේ (Ministry of Agricultur, n.d.). වර්තමානයේ කෘෂිකාර්මික අංශය සමඟින් තාක්ෂණය සම්බන්ධ වී ඇති තත්ත්වය එලෙසම පවතිනු ඇතැයි යන උපකල්පනය මත 2030 වන විට නිෂ්පාදන ඉල්ලුම සපුරාලීම සඳහා කෘෂිකර්මාන්තයේ නියැලී සිටින ශ්‍රම බලකායේ සියයට 27 ක වැඩිවීමක් අවශ්‍ය වනු ඇත. ගෝලීය වශයෙන්, බෝග මාරුව සහ ජෛව විවිධත්වයෙන් යුතු බහු භෝග වගාවට සාපේක්ෂව මහා පරිමාණ ඒක බෝග වගාව පාංශු හායනය හා ජෛව විවිධත්වය නැතිවී යාම කෙරෙහි වැඩි වශයෙන් බලපායි (Balogh, 2021).

**කෘෂිකාර්මික අංශයේ ආසන්න වශයෙන් මිලියන 2.2 ක ජනතාවක් සේවයේ යොදවා ඇත.**
**මෙයින් ආසන්න වශයෙන් කුඩා වතු හිමි ගොවීන් මිලියන 1.65 ක් සමස්ත වාර්ෂික ආහාර නිෂ්පාදනයෙන් සියයට 80 ක් සඳහා දායක වේ.**

ආසන්න වශයෙන් ශ්‍රී ලංකාවේ මිලියන 2.2 ක ජනතාවක් හෝ සමස්ත ශ්‍රම බලකායෙන් සියයට 26 ක් පමණ කෘෂිකාර්මාන්තයේ නියැලී සිටියි. ඒ අතරම, දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ගෙන් අඩක් පමණ කුඩා පරිමාණ ගොවීන් වන (ගුණවර්ධන, 2018) අතර සමස්ත කෘෂිකාර්මික ශ්‍රම බලකායෙන් සියයට 40ක් තම පිරිමි සගයන්ට වඩා අඩු ආදායමක් ලබන කාන්තාවන් වේ (SLYCAN Trust, n.d). මෙම අංශයේ දරිද්‍රතාවය අඛණ්ඩව ඉහළ යාම පිළිබඳව අවධානය යොමුව පවතී (ලෝක බැංකුව, 2021).

## කුඩා පරිමාණ කාබනික ගොවි සංගමය

කුඩා පරිමාණ කාබනික ගොවි සංගමය (SOFA) කාබනික ආහාර නිෂ්පාදනය කර අපනයනය කරන අතරම කුඩා වතු හිමියන් සඳහා තිරසර හා සාධාරණ පරිසරයක් නිර්මාණය කරයි. එය කුඩා වතු හිමියන් සඳහා සාධාරණ වෙළඳ සහතික කිරීම, ක්‍රියාවලි සරළ කිරීම සහ ඔවුන්ට පුළුල් වෙළඳපළ වෙත ප්‍රවේශය සහ ආර්ථික අවස්ථා වැඩි කිරීමට පිරිවැය අඩු කිරීම සඳහා පහසුකම් සපයයි. කුඩා පරිමාණ කාබනික ගොවි සංගමය සාධාරණ වෙළඳ වාරික ප්‍රජාවන් වෙත නැවත ආයෝජනය කරමින් කුඩා පරිමාණ ගොවීන්ගේ සහ අවදානමට ලක්විය හැකි ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සහ කුඩා පරිමාණ ගොවීන් සවිබල ගැන්වීම සඳහා ධාරිතා සංවර්ධනය සහ කෘෂිකාර්මික වැඩිදියුණු කිරීම් කෙරෙහි අවධානය යොමු කිරීම සිදු කරයි. කාබනික ගොවීන් 3,600කට අධික සංඛ්‍යාවක් අපනයන වෙළෙඳපොළට සම්බන්ධ කිරීමත් සමඟ කුඩා පරිමාණ කාබනික ගොවි සංගමය දේශීය විශේෂඥතාව ජාත්‍යන්තර වෙළෙඳපොළට සම්බන්ධ කර දේශීය ප්‍රජාවන් සහ ගෝලීය වෙළඳාම අතර අත්‍යවශ්‍ය සම්බන්ධකයක් ලෙස කටයුතු කරන අතර තිරසර කෘෂිකර්මාන්තය සහ සියල්ලන්ගේ වර්ධනය ප්‍රවර්ධනය කරයි.

**අභිප්‍රේරණය**

ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ගොවීන් ගෝලීය සැපයුම් දාමය සහ වෙළඳපොළ සමඟ ඒකාබද්ධ කිරීම

**නවෝත්පාදනය**

සංයුක්ත වර්ධනය සඳහා සමුපකාර ආකෘතියේ ව්‍යුහාත්මක ප්‍රතිලාභ උපරිමයෙන් භාවිතා කිරීම

**බලපෑම**

දිවයින පුරා කාබනික ගොවීන් 3,600කට අධික පිරිසක් අපනයන වෙළෙඳපොළට සම්බන්ධ කිරීම

**මූලාශ්‍රය** Fairtrade Network of Asia and Pacific Producers (2020). Fairtrade Premium COVID-19 Relief Programs of Small Organic Farmers' Association FLO ID 558 by Bernard Ranaweera, President (SOFA).

## Good Market PGS

පිළිගත් කාබනික සහතිකය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ප්‍රවේශ විය හැකි පරිදි, ප්‍රජා සහභාගීත්වය සහ සාමූහික වගකීම ඉහළ නැංවීම සඳහා Good Market Organic Participatory Guarantee System (PGS) ස්ථාපිත කර ඇත. Good Market PGS සතුව ලියාපදිංචි පුද්ගලයින් සහ ව්‍යවසායන් 408ක් සහ හෙක්ටෙයාර් 224ක භූමි ප්‍රමාණයක් ඇති අතර එය 2016 වසරේ සිට ජාත්‍යන්තර කාබනික කෘෂිකර්ම ව්‍යාපාර සම්මේලනය විසින් පිළිගෙන ඇත.

| අභිප්‍රේරණය | නවෝත්පාදනය | බලපෑම |
|---|---|---|
| කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට පිළිගත් කාබනික සහතිකකරණය ලබා දීම. | ප්‍රජා සහභාගිත්වය සහ සාමූහික වගකීම ඉහල නැංවීම | පුද්ගලයන් සහ ව්‍යවසායන් 408 ක් සහ ඉඩම් හෙක්ටයාර 224 ක් ලියාපදිංචි කිරීම |

**මූලාශ්‍රය Https://pgs.ifoam.bio/pgs_groups/** බලන්න

කෘෂිකර්මාන්තය ආශ්‍රිත අවදානම් සඳහා විසඳුම් සෙවීම, ජීවනෝපායන් වැඩිදියුණු කිරීම, දරිද්‍රතාවය අවම කිරීම සහ තිරසර බව වැඩි කිරීම, දේශගුණයට අනුවර්තනය වීම, නව තාක්ෂණයන් සහ කාබනික නිෂ්පාදන සඳහා ආයෝජනය කිරීම ඉතා වැදගත් වේ. තිරසර කෘෂිකාර්මික ව්‍යාපාර මඟින් පරිසර පද්ධති වැඩිදියුණු කළ හැකි අතර සවිඥානික පාරිභෝගිකයන් වෙත සේවා සැපයීම සහ සැපයුම් දාමයන් ප්‍රශස්ත කිරීම සිදු කළ හැකි ය. කුඩා වතු හිමියන් සවිබල ගැන්වීම, ජෛව විවිධත්වයට හිතකර භාවිතයන්, දේශගුණික බලපෑම් අවම කරන ශිල්පීය ක්‍රම සහ නවීන තාක්ෂණය ඒකාබද්ධ කිරීම යනාදිය අංශය මඟින් ඇති කරන බලපෑමට ඉවහල් වේ. කුඩා වතු හිමියන්, නිෂ්පාදක කණ්ඩායම් සහ අගය එකතු කිරීමේ සමුපකාර ලෙස සංවිධානය කිරීම ඇතුළු නව ව්‍යාපාර සහ සැපයුම් දාම ආකෘතීන් ගවේෂණය කිරීම (කුඩා කාබනික ගොවි සංගමයේ සහ Good Market PGS පිළිබඳ උදාහරණ බලන්න), ගොවීන් සඳහා  වන වැඩසටහන් (Hayleys පිළිබඳ උදාහරණය බලන්න), තාක්ෂණය භාවිතා කරන සැපයුම් දාමයේ විනිවිදභාවය සහ සොයාගැනීම සඳහා  වන ක්‍රම (Tracified පිළිබඳ උදාහරණය බලන්න), සහ බෝග රක්ෂණය වැනි අවදානම් අවම කිරීමේ මූල්‍ය උපකරණ හඳුන්වාදීම මෙම අංශය තුළ දරිද්‍රතාවයේ වර්ධනය වන මට්ටම් අඩු කිරීමට උපකාරී විය හැකිය.

## Hayleys ග්‍රාමීය ගොවි වැඩසටහන

මෙම වැඩසටහන ගොවීන් අතර ආදායම් මට්ටම් ඉහළ නැංවීම සඳහා උත්ප්‍රේරකයක් වේ. මෙම කොන්ත්‍රාත් පදනම මත වගා  කිරීමේ පද්ධතියට සම්බන්ධ ගොවීන්ට පුහුණු සහ ව්‍යාප්ති සේවා ; ණය මත බීජ, පොහොර සහ කෘෂි රසායන වැනි යෙදවුම් ලැබෙන අතර ඔවුහු කලින් තීරණය කළ මිල සහ නියම කළ ගුණාත්මක බව මත ඇපකර ආපසු මිලදී ගනිති.

| අභිප්‍රේරණය | නවෝත්පාදනය | බලපෑම |
|---|---|---|
| ව්‍යවසායකත්ව සංවර්ධනයට සහාය වීම සහ "එකිනෙකා සඳහා එකිනෙකා සමඟ වර්ධනය වීම" | කොන්ත්‍රාත් පදනම මත වගා  කිරීමේ පද්ධතියට සම්බන්ධ ග්‍රාමීය ගොවීන්ට ණය මත අත්‍යවශ්‍ය ගොවි යෙදවුම් (උදා: බීජ, කෘෂි රසායන, පොහොර) සහ කලින් තීරණය කළ මිලකට ආපසු මිලදී ගැනීමේ ඇපකර ලබා දීම | අපනයන කෘෂිකාර්මික අංශය හරහා  දළ වශයෙන් ගොවීන් 8,250 කට වක්‍ර රැකියා ලබා දීම |

**මූලාශ්‍රය** www.hayleys.com/out-grower බලන්න.

### 4.4 පරිසර හිතකාමී සහ තිරසර සංචාරක ව්‍යාපාරය

ශ්‍රී ලංකාවේ මනරම් භූ දර්ශන සහ සංස්කෘතික උරුමයන්, පරිසර හිතකාමී හා තිරසර සංචාරක ව්‍යාපාරය සඳහා වැඩිවන ඉල්ලුම සමඟින්, පරිසර කළමනාකාරීත්වය සහ ප්‍රජා යහපැවැත්ම සමඟ ආර්ථික වර්ධනය ඒකාබද්ධ කිරීම සඳහා ව්‍යාපාර වලට අවස්ථාව සලසා දෙයි. පරිසර හිතකාමී නවාතැන් සැපයීම, ප්‍රාදේශීය ප්‍රජාවන් සමඟ සහයෝග යෙන් කටයුතු කිරීම, වනජීවී සහ පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම, එළිමහන් ක්‍රියාකාරකම් පිරිනැමීම, තිරසර ප්‍රවාහනය හඳුන්වාදීම සහ ප්ලාස්ටික් දූෂණයට එරෙහිව කටයුතු කිරීම මඟින් වගකිවයුතු සංචාරක ව්‍යාපාරයක් කෙරෙහි තම කැපවීම ප්‍රදර්ශනය කිරීමට ව්‍යාපාර වලට හැකිය. තිරසර සංචාරක ව්‍යාපාරය කෙරෙහි රජයේ දැඩි අවධානය යොමු කිරීම සහ සංවර්ධන හවුල්කරුවන්ගේ සහයෝගය සමඟ ධාරිතා සංවර්ධනය සහ මූල්‍ය සහාය සඳහා විවිධ අවස්ථා පවතී.

**2022 දී ඩොලර් ට්‍රිලියන 3.3 ක වටිනාකමක් සහිත වූ ගෝලීය පරිසර හිතකාමී හා තිරසර සංචාරක වෙළඳපොළ, වාර්ෂිකව සියයට 14 කින් වර්ධනය වී 2032 දී ඩොලර් ට්‍රිලියන 11.4 දක්වා ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.**
**(Ashutosh and Roshan, 2023)**

**2018 වසරේ ශ්‍රී ලංකාවට පැමිණි විදේශීය සංචාරකයන්ගෙන් අඩක් එහි පරිසර හිතකාමී සංචාරක ගමනාන්තයන් වෙත ආකර්ෂණය විය.**
(De Zoysa, 2022)




## Saraii Villag

Saraii Village යනු යාල පිහිටි පරිසර හිතකාමී හෝටලයක් වන අතර එය ස්වභාවධර්මය සමඟ එක් වීමට, ජීවිතයේ සරළ බව සහ ශ්‍රී ලංකාවේ සැබෑ ස්වරූපය අත්විඳීමට අමුත්තන් දිරිමත් කරමින් තිරසර බව ප්‍රවර්ධනය කරයි. පාරිසරික සංගතතාව (eco-compatibility) පිළිබඳ දර්ශනය මත ගොඩනගා ඇති Saraii Village මඟින් සේවයේ යොදවා ඇති ප්‍රාදේශීය ප්‍රජාවේ සාමාජිකයින් විසින් සකසනු ලබන සෞඛ්‍යය සම්පන්න සහ කාබනික ආහාර වලින් සංග්‍රහ කරයි.

| අභිප්‍රේරණය | නවෝත්පාදනය | බලපෑම |
|---|---|---|
| ග්‍රාමීය ගොවි ප්‍රජාවන්හි වෘත්තීය ගෞරවය ඇති කර ගැනීමට සහ ඔවුන්ගේ ආර්ථික තත්ත්වය වැඩිදියුණු කිරීමට හැකි වන පරිදි ඔවුන්ට උපකාර කිරීම | ප්‍රජාවට සහ පෘථිවියට ආපසු යමක් පිරිනැමීමේ පණිවිඩය ලබා දෙන ජීවන රටාවක් පවත්වා ගැනීම සඳහා සෞඛ්‍ය සම්පන්න ආහාර සමඟ නැවත සරළ දිවි පෙවෙතක් වෙත යොමු වීම. | සමූහ විනෝද චාරිකාවලින් ලැබෙන ආදායමෙන් සියයට 65ක් සේවා සපයන්නන් වෙත ආපසු ලබා දෙමින් හෝටලය පිහිටි ප්‍රදේශය තුළ පවුල් 60ක සේවාවන් සෘජුව හෝ වක්‍රව ලබා ගන්නා අතර එහි ප්‍රතිඵලයක් ලෙස ගෘහ ආදායම පහේ සිට අට ගුණයකින් වැඩි කිරීම. |

**මූලාශ්‍රය** www.sundaytimes.lk/180311/magazine/saraii-village-the-essence-of-lanka-284982.html and www.srilanka.travel/ eco-tourism බලන්න.

## Jetwing Vil Uyana

උතුරු මැද පළාතේ සුඛෝපභෝගී හෝටලයක් වන Jetwing Vil Uyana පරිසර සංරක්ෂණය සහ ප්‍රජා යහපැවැත්ම වෙනුවෙන් දැඩිව කැපවී සිටී. එහි ආචාර විධි සහ මෙහෙයුම් මඟින් දේශීය පරිසරය සහ වාසස්ථාන ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම, දේශීය ශාක හා සත්ව විශේෂ ආරක්ෂා කිරීම, ගෘහ නිර්මාණ ශිල්පය වගකීමෙන් භාවිතා කිරීම සහ කලාපයේ ආර්ථික වර්ධනය ඉහළ නංවන රැකියා අවස්ථා ලබා දීම අපේක්ෂා කරයි.

- Vil Uyana තුළ වන විවෘත සැලසුම් ව්‍යුහයන් සාම්ප්‍රදායික පිදුරු සහ මැටි භාවිතයෙන් ඉදිකර ඇති අතර ඒ සඳහා කෘතිම ආලෝකකරණය සහ වාතාශ්‍රය අවශ්‍ය වන්නේ අඩුවෙනි.
- ආහාර අපද්‍රව්‍යය භූමිය තුළ ම ජීරක භාවිතයෙන් පිරිසකසනු ලබන අතර එහි ප්‍රතිඵලය වන ජීව වායුව මුළුතැන්ගෙයි උදුන් සඳහා යොදා ගනී. කාබනික ගෙවත්තක් මඟින් නැවුම් නිෂ්පාදන සපයයි.
- අප ජලය පිරිපහදු කර ගෙවතු සඳහා  භාවිතා කරනු ලබන අතර සියලුම වියළි කොළ සහ ගෙවතු අපද්‍රව්‍යය භූමිය තුළ කොම්පෝස්ට් සකස් කිරීමට යොදා ගනු ලැබේ.
- හෝටලය සඳහා අවශ්‍ය ජලය සපයන්නේ වැසි ජලයෙන් පිරී ඇති මිනිසුන් විසින් සාදන ලද වැව් මඟිනි.
- අවට ගොවි ප්‍රජාවන්හි දරුවන් අතරින් බොහෝ දෙනෙක් අතරමඟදී පාසල් ගමන නවතා  දමති. ඔවුන්ට නව නිපුණතා වර්ධනය කර ගැනීමට උපකාර කිරීම සඳහා Jetwing තරුණ සංවර්ධන වැඩසටහන මඟින් හෝටල් මෙහෙයුම් කටයුතු පිළිබඳව ඉගෙන ගැනීමට සහ ප්‍රමාණවත් ඉංග්‍රීසි දැනුමක් ලබා ගැනීමට අවස්ථාව සැලසෙන පරිදි නොමිලේ මාස හයක පුහුණු සැසි පවත්වනු ලැබේ. උපාධිධාරීන්ට බොහෝ විට Vil Uyana මඟින් රැකියා අවස්ථා පිරිනමනු ලැබේ.

| අභිප්‍රේරණය | නවෝත්පාදනය | බලපෑම |
|---|---|---|
| දේශීය පරිසරය සහ වාසස්ථාන ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම | මිනිසා විසින් සාදන ලද ස්වභාවික රක්ෂිතයක් ස්ථාපිත කිරීම; ප්‍රදේශයෙන් කොටසක නැවත වන වගා කර තවත් කොටසක් සාම්ප්‍රදායික ක්‍රමය යටතේ වී වගාව සඳහා භාවිතා කිරීමත් සමඟ අතහැර දැමූ කෘෂිකාර්මික ඉඩම් නැවත තෙත් බිම් බවට පත් කිරීම | තෙත්බිම් සහ වනාන්තර ප්‍රතිසංස්කරණයෙන් පසුව, බොහෝ පක්ෂීන් සහ සතුන් ආපසු පැමිණි අතර එමඟින් ක්ෂීරපායී විශේෂ (12 සිට 25 දක්වා), පක්ෂීන් (29 සිට 138 දක්වා), සමනලුන් (24 සිට 43 දක්වා), සහ උභයජීවීන් සහ උරගයින් (3 සිට 39 දක්වා) ප්‍රමාණය වැඩි වීම. |

**මූලාශ්‍රය:** www.jetwinghotels.com/jetwingviluyana/wp-content/uploads/sites/2/2022/05/Jetwing-Vil-Uyana-SPR-2021.pdf and www.responsibletourismindia.com/inspire-me/case-study-jetwing-vil-uyana-sri-lanka/429 බලන්න.


Photo: UNDP

## 4.5 චක්‍රීය ආර්ථික මූලාරම්භයන්

අපද්‍රව්‍ය අවම කරන, ප්‍රතිචක්‍රීකරණය ප්‍රවර්ධනය කරන සහ සම්පත් කාර්යක්ෂමතාව උපරිම කරන නිෂ්පාදන සහ සේවා පිරිනැමීමෙන් ව්‍යාපාර වලට චක්‍රීය ආර්ථික මූලධර්ම මෙහෙයවීමේ හැකියාව පවතින අවස්ථා අතරට ප්‍රතිචක්‍රීකරණ, ප්‍රතිනිෂ්පාදන සහ අපද්‍රව්‍යය කළමනාකරණ විසඳුම් ඇතුළත් වේ.

චක්‍රීය ආර්ථික භාවිතාවන් මඟින් සම්පත් භාවිතය ප්‍රශස්ත කිරීමට, නාස්තිය අවම කිරීමට සහ මෙහෙයුම් පිරිවැය අඩු කරමින් පාරිසරික බලපෑම අවම කිරීමට ව්‍යාපාර වලට අවස්ථාව ලබා දෙයි. එමඟින් සමාගමක කීර්තිය ඉහළ නැංවීම, සැපයුම් දාමයේ ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සහ සමාගම හෝ සැපයුම් දාමය නිෂ්පාදනයේ ඉහළ ගුණාත්මක භාවය සඳහා ගාස්තු අය කිරීමේ හැකියාව ඇති පරිසර කළමනාකරුවෙකු බවට පත් කිරීම සිදු කරනු ලැබේ.

මෙම ප්‍රවේශය මඟින් නිෂ්පාදන සැලසුම්කරණයේ නවෝත්පාදනයන් ප්‍රවර්ධනය කිරීම සහ පරිසරය පිළිබඳ සවිඥානික පාරිභෝගිකයින් ආකර්ෂණය කර ගැනීම (Eco Spindles පිළිබඳ උදාහරණය බලන්න) සිදු කරමින් අගය එකතු කළ නිෂ්පාදන සහ සේවා හරහා නව ආදායම් ප්‍රවාහයන් උත්පාදනය කරයි. නිදසුනක් ලෙස ආරක්ෂිත සහ තිරසර ඇසුරුම්කරණය හරහා පසු අස්වනු හානි අවම කර ගැනීමේ මුලපිරීම් මඟින් නව ආදායම් මාර්ග ඇති කිරීම, එම අස්වැන්නෙන් දැනට ලැබෙන ආදායම වැඩි කිරීම සහ ආහාර සුරක්ෂිතතාව ඉහළ නැංවීමට උපකාරී වීම සිදු වේ. සම්පත් ප්‍රතිසාධන ක්‍රියාමාර්ග මඟින් ජෛව ඉන්ධන සහ කාබනික පොහොර නිෂ්පාදනයට ආහාර අපද්‍රව්‍යය භාවිතා කිරීම වැනි නව ආර්ථික කටයුතු සඳහා අපද්‍රව්‍යය භාවිතා කිරීමේ නව අවස්ථා උදාකරයි.

### Eco Spindles

Eco Spindles යනු ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ පොලියෙස්ටර් නූල් සහ ෆිලමන්ට් නිෂ්පාදකයෙකු වන අතර ප්‍රතිචක්‍රීකරණය කරන ලද PET ප්ලාස්ටික් පතුරු වලින් සෘජුවම පොලියෙස්ටර් නූල් නිර්මාණය කිරීමේ හැකියාව ඇති ලොව ඇති යන්ත්‍ර දෙකෙන් එකක් එය සතු වේ. එය ශ්‍රී ලංකාවේ විශාලතම ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණ සමාගම ද වේ. සමාගම ශ්‍රී ලංකාවේ තිරසර භාවිතයන් වැඩිදියුණු කිරීම සඳහා ශක්තිමත් ප්‍රතිචක්‍රීකරණ පරිසර පද්ධතියක් නිර්මාණය කිරීමට පුරෝගාමී වී ඇති බව සැලකිය යුතුය. 500 කට අධික ලියාපදිංචි වූ එකතුකරන්නන් සංඛ්‍යාවක් සහිත විශාල ජාලයක් සමඟින් Eco Spindle මූලාශ්‍ර විසින් සංස්ථා, එකතුකරන්නන්, Waste 2 Value ජංගම යෙදුම සහ PET ප්ලාස්ටික් එකතු කිරීමට සක්‍රියව දායක වන පුළුල් ප්‍රජාව සමඟ වන සහයෝගීතාවය හරහා PET බෝතල් භාවිත කරයි. සමාගම විසින් පූජනීය ස්ථාන වල අපද්‍රව්‍යය කළමනාකරණ මුලපිරීම මඟින් පරිසර කළමනාකරණය සහ සංස්කෘතික සංරක්ෂණය යන අංශ දෙක කෙරෙහිම සමාගමේ කැපවීම පෙන්නුම් කරමින් ඉවතලන ප්ලාස්ටික් බෝතල් ඉවතලීම සඳහා එකතු කිරීමේ බඳුන් සවි කිරීම සහ නඩත්තු කිරීම මඟින් පූජනීය ස්ථාන සංරක්ෂණය කිරීමට උත්සාහ කෙරේ.



ඡායාරූපය Eco Spindles

| අභිප්‍රේරණය | නවෝත්පාදනය | බලපෑම |
| --- | --- | --- |
| ලෝකයට මුදා හරින හරිතාගාර වායු ප්‍රමාණය අඩු කිරීම | උසස් තත්ත්වයේ නූල් සහ ෆිලමන්ට් තැනීම සඳහා ප්ලාස්ටික් අපද්‍රව්‍ය භාවිතා කිරීම | PET බෝතල් මිලියන 90 කට අධික ප්‍රමාණයක්, වාර්ෂිකව ටොන් 20,000 ක් ප්‍රතිචක්‍රීකරණය කිරීම |

**මූලාශ්‍රය** www.ecospindles.com/pilgrimage-waste-management/ බලන්න.

### 4.6 තිරසර ඇඟලුම් සහ රෙදිපිළි

විලාසිතා කර්මාන්තය විශාලතම දූෂකකාරකයන්ගෙන් එකක් වන අතර එය වැඩි වශයෙන් සියුම් පරීක්ෂාවට ලක්ව ඇත (Samuel and Danise, 2023). ඇඟලුම් සහ විලාසිතා සඳහා සදාචාරාත්මක මූලාශ්‍ර සපයන ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව ගෝලීය විලාසිතා කර්මාන්ත සැපයුම් දාමයේ ප්‍රධාන ස්ථානයක් උසුලයි. කෙසේ වුවද, පරිසරය සහ ප්‍රජාවන් ආරක්ෂා කිරීමට දැඩි ප්‍රතිපත්ති සහ භාවිතයන් සඳහා වන ඉල්ලුම ඉහළ යාමත් සමඟ ඉලක්ක වෙනස් වෙමින් පවතී. ශ්‍රී ලංකාවේ මෙම ක්ෂේත්‍රය මඟින් ආසන්න වශයෙන් පුද්ගලයින් 350,000 ක් පමණ සේවයේ යොදවා ඇති අතර ඔවුන්ට ලබා දෙන වැටුප්, කර්මාන්තයේ බාහිර නිරීක්ෂකයින් අඩු වැටුප් ප්‍රමාණයක් ලෙස සැලකීම හේතුවෙන් ඒ කෙරෙහි නිරන්තරයෙන් බලපෑම් එල්ල වේ (EDB, 2022) "OHCHR" 2021). ගෝලීය ඇඟලුම් සැපයුම් දාමයේ සිය ප්‍රමුඛ හා ගෞරවනීය ස්ථානය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා ඵලදායිතාව ඉහළ නංවන, පාරිසරික බලපෑම අවම කරන සහ තිරසර ලෙස නිෂ්පාදනය කරන ලද ඇඟලුම් නිෂ්පාදන සඳහා ඉල්ලුමක් පවතින සහ අධි මිලක් ගෙවීමට සූදානම් වෙළඳපළ වෙත ගෙන යාම සඳහා වන මුල පිරීම් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වනු ඇත.

තිරසර හා ජෛවහායනීය රෙදිපිළි සහ ද්‍රව්‍යය සඳහා ද වැඩි ඉල්ලුමක් පවතී. සමස්ත මිරිදිය දූෂණයෙන් සියයට 25 ක් සිදු වන්නේ රෙදිපිළි පිරියම් කිරීමට සහ සායම් පෙවීමට අදාළ ක්‍රියාවලීන් හේතුවෙන් බව ඇස්තමේන්තු මඟින් පෙන්නුම් කරයි (Samuel and Danise, 2023). තිරසර රෙදිපිළි සඳහා වන ගෝලීය වෙළෙඳපොළ 2022 සහ 2030 අතර කාලය තුළ සියයට 12.5 ක සංයුක්ත වාර්ෂික වර්ධන වේගයකින් වර්ධනය වී 2030 දී ඩොලර් බිලියන 69.5 කට ආසන්න වනු ඇතැයි අපේක්ෂා කෙරේ (Market Research Future, 2023).

තිරසර විලාසිතා මඟින් සදාචාරාත්මක මූලාශ්‍ර, චක්‍රීය මෝස්තර, නව්‍ය අමුද්‍රව්‍යය, අධ්‍යාපනය, තාක්ෂණය ඒකාබද්ධ කිරීම සහ අනුකූලතාවය තුළ ව්‍යාපාරික අවස්ථා නිර්මාණය කරනු ලැබේ. හරිත අලෙවිකරණය, පරිසර හිතකාමී නිෂ්පාදනය සහ ගෝලීය වෙළඳපළ ප්‍රවේශය මඟින් සන්නාම පක්ෂපාතිත්වය සහ ජාත්‍යන්තර ප්‍රවේශය වැඩි දියුණු කරයි.

## Kantala

Kantala යනු සාධාරණ සහ ප්‍රජාතන්ත්‍රවාදී සැපයුම් දාමයන් නිර්මාණය කරමින් විලාසිතා ක්ෂේත්‍රයට පුනර්ජනනීය විසඳුම් සැපයීම සඳහා ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික ශිල්ප වලින් පෙළඹවීමක් ලබා දෙන සමාජ ව්‍යවසායකි. Kantala මඟින් සිය ප්‍රධාන අමුද්‍රව්‍ය ප්‍රභවය වන පුනර්ජනනීය සහ ඉහළ තිරසර බවකින් යුතු හන ශාකයෙහි (Agave cantala) කාබන් විච්ඡේද කිරීමේ හැකියාව හේතුවෙන් කාබන් විමෝචනය අවම වන ප්‍රතිජනනීය ශාකහාරී සම් භාණ්ඩ සහ කාන්තා විලාසිතා උපාංග බවට පත් කිරීමට ගොවි ප්‍රජාවන් සහ ශිල්පීන් සම්බන්ධ කර ගනු ලැබේ. අද වන විට Kantala මඟින් දුම්බර හන වියනු ලබන ශිල්පීන් 23 දෙනෙකු සඳහා ශිල්පීන්ගේ සංගමයක් පිහිටුවා ඇති අතර එහි සැපයුම්හි නියැලී සිටින ගොවීන් 35 දෙනා සඳහා නිෂ්පාදක කණ්ඩායම් පිහිටුවීමට කටයුතු කරමින් සිටී.

| අභිප්‍රේරණය | නවෝත්පාදනය | බලපෑම |
| --- | --- | --- |
| විලාසිතා අංශය සඳහා කාබන් සෘණ පුනර්ජනනීය ශෘකහාරී විසඳුම් හරහා බලපෑම එල්ල කිරීම | ඉහළ වටිනාකමකින් යුතු සමකාලීන නිෂ්පාදන හරහා දේශීය බුද්ධිමය දේපළ සහ සාම්ප්‍රදායික ශිල්ප සංරක්ෂණය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම; පුනර්ජනනීය ශෘකාහාරී සම් අමුද්‍රව්‍ය සකස් කිරීම; නියමිත ප්‍රමිතියට පවතින්නේ දැයි සොයා ගැනීම සඳහා වන විගණන සහ වාසි සහගත පාරිසරික බලපෑම් ඇති කරමින් ආදායම් ඉපැයීමට සහාය වීමට අවශ්‍ය දත්ත රැස් කිරීම සහ වාර්තා කිරීම සඳහා බ්ලොක්චේන් සක්‍රීය සැපයුම් දාම සොයා ගැනීමේ මෙවලම් භාවිතා කිරීම; සහ හරිතාගාර වායු සත්‍යපනය සඳහා කාබන් වෙන් කිරීමේ දත්ත ලබා ගැනීම | ශිල්පීය නිපුණතා සහිත ශිල්පීන් 8 සිට 23 දක්වා වැඩි කිරීම සහ සාමාන්‍ය වයස අවුරුදු 60 සිට 48 දක්වා අඩු කිරීම; ද්‍රව්‍යමය නවෝත්පාදනයන් සහ කාබන් සත්‍යාපනය තුළින් ගොවීන් 35 දෙනෙකු සඳහා ද්විතීයික ආදායමක් ඇති කිරීම තුළින් හන ශාකවල ආර්ථික වටිනාකම වැඩි කිරීම; ජෛව හායනීය කාබන් විමෝචනය අවම වන, කෘෘරත්වයෙන් තොර නිෂ්පාදන හා අමුද්‍රව්‍ය පාරිභෝගිකයින් සහ කර්මාන්ත සඳහා සැපයීම |

**මූලාශ්‍රය:** www.kantalabrands.com/pages/trading-fairly බලන්න.

## 4.7 සමාජීය බලපෑම සඳහා ඩිජිටල් නවෝත්පාදනයයි

ඩිජිටල් තාක්ෂණයන් ආර්ථික වර්ධනයේ සහ සමාජ වෙනසෙහි ප්‍රධාන සාධකයකි. ශ්‍රී ලංකාවේ ව්‍යාපාර වලට විවිධ අංශවල විප්ලවීය වෙනසක් ඇති කිරීමට සහ තිරසර සහ සංයුක්ත ප්‍රතිඵල ළඟා කර ගැනීමට ඩිජිටල් නවෝත්පාදන උපයෝගී කර ගත හැකිය. ව්‍යාපාර වලට තම මෙහෙයුම් කටයුතු වැඩිදියුණු කිරීමට සහ ග්‍රාමීය ප්‍රජාවන් වෙත අත්‍යාවශ්‍ය සේවාවන් (උදා. සෞඛ්‍යය සේවා, අධ්‍යාපනය සහ මූල්‍ය) සැපයීමට ඩිජිටල් තාක්ෂණය භාවිතා කළ හැකිය. උදාහරණයක් ලෙස, ODoc වැනි ටෙලිමෙඩිසින් යෙදුම් වලට ග්‍රාමීය ප්‍රදේශ සඳහා අඩු වියදම් සහිත ප්‍රවේශයක් ලබා දෙමින් තත්‍යසම වෛද්‍ය උපදේශන ලබා දිය හැකිය. ඩිජිටල් අධ්‍යාපන වේදිකා සහ අන්තර්ගත සපයන්නන්ට (Tilli වැනි) ගුණාත්මක අධ්‍යාපනය සඳහා ප්‍රවේශය ඉහළ නැංවිය හැකි අතර නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ අතර දැනුම් පරතරය අඩු කරමින් මාර්ගගත පුස්තකාල මඟින් දැනුම සඳහා වැඩි ප්‍රවේශයක් ලබා දෙනු ලැබේ.

ඩිජිටල් මුදල් පසුම්බි, ක්ෂුද්‍ර රක්ෂණය සහ බ්ලොක්චේන් වැනි ඩිජිටල් මූල්‍ය විසඳුම් සහ තාක්ෂණයන්, සම්ප්‍රදායික බැංකු ගිණුම් නොමැති අයට පවා ආරක්ෂිත සහ පහසු ඩිජිටල් ගනුදෙනු කිරීමට ඉඩ සලසන අතර මෙම තාක්ෂණයන් මඟින් කුඩා වතු හිමියන්ට සහ අනෙකුත් අඩු ආදායම්ලාභී කණ්ඩායම් වලට ප්‍රවේශ විය හැකි මූල්‍ය නිෂ්පාදන බිහි කරනු ලැබේ.

ඩිජිටල් විසඳුම් මඟින් කෘෂිකර්මාන්තයේ විප්ලවීය වෙනසක් ඇති කිරීමට හා කුඩා වතු හිමියන්ට තොරතුරු සඳහා  වූ අඩු වියදම් ප්‍රවේශය හරහා සම්පත් වෙන් කිරීම, බෝග තෝරා ගැනීම, බෝග අස්වැන්න සහ දේශගුණයට අනුවර්තනය වීම ප්‍රශස්ත කිරීම සඳහා සහාය වීමට හැකිය.

මාර්ගගත වේදිකා යනු වෙළඳපළ සඳහා පිළිගැනීම හා ප්‍රවේශය ලබා දීම සහ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට (MSMEs) සහාය වීම (Good Market පිළිබඳ උදාහරණය බලන්න) සිදු කරන ඵලදායී වෙළඳ ජාලයන් වේ.

ජනගහනයෙන් සියයට 87 ක් ආපදා අවදානම් සහිත ප්‍රදේශවල වෙසෙන ශ්‍රී ලංකාවට ඉතා වැදගත් පූර්ව අනතුරු ඇඟවීමේ විසඳුම් ඩිජිටල් විසඳුම් මඟින් සැපයිය හැකි අතර ජීවිත හානි සහ ආර්ථික හානිය අවම කිරීමට උපකාරී විය හැකිය.

**ඩිජිටල් මූල්‍ය විසඳුම් සහ තාක්ෂණයන් කුඩා වතු හිමියන් සහ අනෙකුත් අඩු ආදායම්ලාභී කණ්ඩායම් වැනි සාම්ප්‍රදායික බැංකු ගිණුම් නොමැති අයට පවා මූල්‍ය නිෂ්පාදන වෙත ප්‍රවේශ විය හැකි තත්ත්වයට පත් කරයි**

### ODoc

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ටෙලිමෙඩිසින් සපයන්නා විසින් ජංගම උපාංග භාවිතයෙන් වීඩියෝ, ශ්‍රව්‍ය සහ පෙළ උපදේශන හරහා සෞඛ්‍ය සේවා වෘත්තිකයන් සහ පරිශීලකයන් සම්බන්ධ කරන යෙදුමකි. එමඟින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පිළිගත් ලියාපදිංචි වෛද්‍යවරුන් සහ විශේෂඥ වෛද්‍යවරුන් ඇතුළුව වෛද්‍යවරුන් 1,000 කට අධික සංඛ්‍යාවක ජාලයක් වෙත ප්‍රවේශය ලබා දෙනු ලැබේ.

| අභිප්‍රේරණය | නවෝත්පාදනය | බලපෑම |
|---|---|---|
| උසස් තත්ත්වයේ සෞඛ්‍ය සේවාව සැමට ප්‍රවේශ විය හැකි, දැරිය හැකි මිලක් යටතේ ලබා ගත හැකි සහ පුද්ගලික තත්ත්වයට පත්කිරීම | සෞඛ්‍ය සේවා වෘත්තිකයන් සහ පරිශීලකයින් සම්බන්ධ කරන ඩිජිටල් වේදිකාවක් නිර්මාණය කිරීම; වෘත්තිකයන් 1,000 කට අධික සංඛ්‍යාවක් සහිත පුළුල් ජාලයකට පොදු ප්‍රවේශය සහිත ජංගම උපාංග හරහා  වීඩියෝ, ශ්‍රව්‍ය සහ පෙළ උපදේශන සක්‍රීය කිරීම | සෙම්ප්‍රතිශ්‍යාවේ සිට වේදනාව සමනය කරන ප්‍රතිකාර ලබා දීම දක්වා වූ පුළුල් පරාසයක රෝග තත්ත්වයන් සම්බන්ධයෙන් කටයුතු කරමින් සාර්ථක උපදේශන 40,000කට අධික ප්‍රමාණයක් සක්‍රීය කිරීම |

**මූලාශ්‍රය:** Echelon Magazine (2021). ද *Doc (better healthcare for all is now a reality'* www'echelon'lk/odoc-better- healthcare-for-all-is-now-a-reality/ වෙතින් ලබා ගත හැකිය.

# Tilli

කෘතිම බුද්ධියෙන් බල ගැන්වෙන සමාජ චිත්තවේගීය ඉගෙනුම් මෙවලමක් වන Tilli, වයස අවුරුදු 5 සිට 10 දක්වා ළමුන් තුළ සහකම්පනය, විචාරාත්මක චින්තනය සහ අධිප්‍රජානනය ඇති කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. සංයුක්ත සැලසුම් සහ සම නිර්මාණය තුළින් අධ්‍යාපනයේ අසමානතා අවම කිරීම සහ එකිනෙකට සම්බන්ධ වූ ලෝකයක් සඳහා සමාජීය දැනුවත්භාවයකින් යුතු පුද්ගලයින් සකස් කිරීම Tilli හි අරමුණු වේ.

| අභිප්‍රේරණය | නවෝත්පාදනය | බලපෑම |
|---|---|---|
| Tilli හි දහවන උපන්දිනය වන විට සෑම දරුවෙකුටම ජීවිතයේ ඉදිරියට යාම සඳහා අවශ්‍ය කුසලතා, අභියෝග වලට සාර්ථකව මුහුණ දීමේ උපාය මාර්ග සහ මානසිකත්වය ඇති බව සහතික කිරීම | විනෝදාත්මක ඉගෙනුම, චර්යා විද්‍යාවන් සහ ළමුන් හා රැකබලා ගන්නන් තුළ ජීවිතාන්තය දක්වා පවතින චර්යාත්මක වෙනස්කම් ඇති කිරීම සඳහා වන දත්ත ඒකාබද්ධ කරන සමාජචිත්තවේගීය ඉගෙනුම් මෙවලමක් නිර්මාණය කිරීම සඳහා කෘතිම බුද්ධිය භාවිතා කිරීම | උතුරු ඇමරිකාව, යුරෝපය සහ දකුණු ආසියාව තුළ වෙසෙන වයස අවුරුදු 5 සිට 10 දක්වා වූ ඉගෙනුම ලබන ළමුන් 100+ පමණ පිරිසක් දෙමාපියන් සහ ගුරුවරුන් ඇතුළු පහසුකම් සපයන්නන් 58 දෙනෙකු සමග Tilli පරීක්ෂා කිරීම මගින් සියයට 73 ක් ළමුන් අතර ඉහළ මට්ටමේ නියැලීමක් පෙන්නුම් කරන ලදී; Tilli භාවිතය ළමුන් අතරින් සියයට 93කට අවංක හා අර්ථවත් සංවාදයක් පැවැත්වීමට උපකාර කිරීම |

**මූලාශ්‍රය:**www.tillikids.com/research and www.unicefventurefund.org/portfolio/tilli-gamified-social-emotional-learning-child- online-safety බලන්න.

# Good Market Platform

Good Market යනු සමාජ ව්‍යවසායන්, සමූපකාර, වගකිව යුතු ව්‍යාපාර, සිවිල් සංවිධාන, ජාල සහ විපර්යකාරකයන්ගෙන් යුතු සංවිධිත ප්‍රජාවකි. එය සිය දේශීය හා ගෝලීය ප්‍රවේශය සමඟින්, නිෂ්පාදකයින්, ශිල්පීන් සහ කුඩා පරිමාණ ව්‍යවසායකයින් 1,500 කට අධික පිරිසකට ශ්‍රී ලංකාව තුළ තම භාණ්ඩ ඉදිරිපත් කිරීමට සහ අලෙවි කිරීමට වේදිකාවක් සලසා දෙයි. සක්‍රීය පරිසර පද්ධතියක් ලෙස Good Market, වාණිජ මෙන්ම සමාජ ආර්ථික ප්‍රගතිය ඇති කරමින් ප්‍රාදේශීය ප්‍රජාවන් සඳහා අත්‍යවශ්‍ය ආදායමක් සහ ජීවනෝපායන් ජනනය කරයි. වේදිකාව මගින් ව්‍යාපාරික අරමුණු සමාජ හේතු සමඟ මුසු කරමින්, සමාජ ව්‍යසායකයින්ගේ ප්‍රවේශය ඉහළ නැංවීමට හා පර්වර්තනීය වෙනසක් සඳහා ඔවුන්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීමට සහාය වේ.



| අභිප්‍රේරණය | නවෝත්පාදනය | බලපෑම |
|---|---|---|
| මිනිසුන්ට සහ පෘථිවියට යහපතක් වන විසිඑක්වන සියවසේ ආර්ථිකයක් නිර්මාණය කිරීම | විනිවිදභාවයෙන් යුතුව ප්‍රජාවන් සම්බන්ධ කිරීමට ඩිජිටල් මෙවලම් භාවිතා කිරීම | මෙම වේදිකාව මත නිෂ්පාදකයින්, ශිල්පීන් සහ කුඩා පරිමාණ ව්‍යවසායකයින් 1,500 කට අධික පිරිසක් සම්බන්ධ කිරීම; කාබනික නිෂ්පාදකයින් 400 කට වැඩි පිරිසකට ගොවි වෙළඳපොළ සහ Good Market සිල්ලර වෙළඳසැල් හරහා සෘජු වෙළඳපළ ප්‍රවේශය ලබා දීම |

**මූලාශ්‍රය:** Good Market Sri Lanka (2022). Good Market community in Sri Lanka celebrates 10 years! www.goodmarket වෙතින් ලබා ගත හැකිය. // Good - Market - community - in community - in - Sri - Lanka - celebrates -10 - years/.

# Tracified Technologies : බ්ලොක්චේන් සක්‍රිය කර ඇති නිරීක්ෂණ විසඳුම

Tracified Technologies යනු සම්පූර්ණ සැපයුම් දාමය සම්බන්ධ කරන බ්ලොක්චේන් මත පදනම් වූ නිරීක්ෂණය කිරීමේ විසඳුමකි. සැපයුම් දාමයේ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා මෙම විසඳුම අදාළ කරගත හැකිය. කෘෂිකර්මාන්තය, ශිල්ප හෝ විලාසිතා වේවා, Tracified හට බ්ලොක්චේන් තාක්ෂණය මඟින් සක්‍රිය කරන ලද නිරීක්ෂණය කිරීමේ ක්‍රම රාශියක් භාවිතා කරමින් සංචලනය, පිරිස්, අමුද්‍රව්‍යය, පිහිටීම සහ බලපෑම හඳුනාගෙන වාර්තා කළ හැකිය.

**ව්‍යාපෘති:**

- යුරෝපා සංගමය වෙත අපනයනය කරන ශ්‍රී ලංකාවේ ගොවීන් 10,000ක් ඉලක්ක කර බ්ලොක්චේන් මත පදනම් වූ නිරීක්ෂණය කිරීමේ විසඳුමකට මුල පුරන ලදී.
- Kantal සමඟ එක්ව සමාජ වගකීම් සහිත ව්‍යාපාර තුළ ශ්‍රී ලාංකීය හස්ත කර්මාන්ත ප්‍රවර්ධනය කරන ලදී.

| අභිප්‍රේරණය | නවෝත්පාදනය | බලපෑම |
|---|---|---|
| ශ්‍රී ලංකාවේ කර්මාන්ත වැඩිදියුණු කිරීම සහ බිම් මට්ටමේ ගොවීන්ගේ සහ ශිල්පීන්ගේ ප්‍රමිතීන් නංවාලීම | නිෂ්පාදන එකතුවක් සැපයීම:<br>• වෙබ් පෝටලය: පරිපාලනය විධිමත් කිරීම<br>• අදහස් පෝටලය: වටිනා ව්‍යාපාරික අදහස් ලබා දීම<br>• ක්ෂේත්‍ර නිලධාරි යෙදුම: කාර්යක්ෂම සැපයුම් දාම නිරීක්ෂණය සහතික කිරීම<br>• ජංගම යෙදුම සහ ඊ-වාණිජ්‍ය යෙදුම: පාරිභෝගිකයින් සඳහා පරිශීලක හිතකාමී අතුරු මුහුණතක් පිරිනැමීම කෘතිම බුද්ධිය භාවිතා කිරීම | කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ගොවීන් 10,000 කට වැඩි පිරිසකට සහ අත්කම් ක්ෂේත්‍රයේ ශිල්පීන් 100 කට වැඩි පිරිසකට සැපයුම් දාමයන් හරහා විනිවිදභාවය ඇති කරන බීජ මට්ටමේ සිට අවසාන පාරිභෝගික භාණ්ඩය දක්වා නිරීක්ෂණය කිරීමේ දත්ත ලබා දීම මඟින් පාරිභෝගිකයින්ට දැනුවත් තේරීම් සිදු කිරීමට සහ ව්‍යවසායන්ට සිය සැපයුම් දාමය නැරඹීමට සහ බලපෑම මැන ගැනීමට හැකියාව ලබා දීම. |

**මූලාශ්‍රය:** Daily FT (2021). Tracified enables 10,000 Sri Lankan farmers to move up the value chain. www.ft.lk/Agriculture/ Tracified-enables-10-000- Sri-Lankan-farmers-to-move-up-the-value-chain/31-727271 වෙතින් ලබා ගත හැකිය.

### 4.8 හරිත මූල්‍ය සහ බලපෑම් ආයෝජන

වෙළෙඳපොළ 2022 දී ඩොලර් ට්‍රිලියන 1.1කට වඩා වැඩි විය (Hand et al, 2022). International Finance Corporation (දි.ර.) ඇස්තමේන්තු කරන ආකාරයට සාධනීය බලපෑමක් එල්ල කිරීමේ අපේක්ෂාව මත ඩොලර් ට්‍රිලියන 2.3 ක් ආයෝජනය කර ඇත.

ශ්‍රී ලංකාවේ බලපෑම ආයෝජන වෙළෙඳපොළ සාපේක්ෂව කුඩා වේ. Global Impact Investing Network (GIIN) විසින් 2004 සිට 2014 දක්වා කාලය ආවරණය වන පරිදි සිදු කරන ලද අධ්‍යයනයකින් ඇස්තමේන්තු කර ඇත්තේ ආයෝජන හෝ පාරිසරික, සමාජීය සහ ආයතනික පාලන ප්‍රමිතීන්ට අනුකූලව කළමනාකරණය යටතේ දළ වශයෙන් ඩොලර් මිලියන 500 ක වත්කම් ශ්‍රී ලංකාව සතු බවයි. සමස්ත කුඩා පරිමාණ වෙළඳපළෙහි ප්‍රමාණය සහ ජනනය කරන ලද බලපෑම පිළිබඳව වාර්තා කිරීමේ දී ව්‍යවසාය ධාරිතාවන්හි පවතින හිඩැස් රටෙහි අඩු බලපෑම් ආයෝජන මට්ටම සඳහා ප්‍රධාන හේතු ලෙස දක්වා ඇත (GIIN and Dalberg, 2015). මුල් ආයෝජකයින්ට පිටවීමේ අවස්ථා සීමා කරන නිශ්චිත නොවන ද්විතීයික වෙළඳපොළක් සහ ශ්‍රී ලංකාවෙන් මුදල් ආපසු යැවීම සීමා කිරීම සංයුක්ත සහ තිරසර ව්‍යාපාරයන්හි ආයෝජන සීමා කරන සාධක වේ (අදහස් විමසීම් අතරතුර කර්මාන්තයේ පාර්ශවකරුවන් විසින් වාර්තා කරන ලද පරිදි).

ගෝලීය වශයෙන්, හරිත බැඳුම්කරවල ඉහළ යෑම, නිල්, සංක්‍රාන්ති, තිරසර සහ සමාජ බලපෑම් ඇති කරන බැඳුම්කර වැනි විවිධාකාර බලපෑම් සහ තිරසර ස්ථාවර ආදායම් මෙවලම් නිර්මාණය කිරීමට පෙළඹීමක් ඇති කර ඇතත් ඒවා යොදා ගැනීම වඩාත් ක්‍රමිකව සිදු වී ඇත. ලොව පුරා, තිරසරභාවය කේන්ද්‍ර කර ගත් බැඳුම්කර නිකුත් කිරීම 2021 දී ඩොලර් ට්‍රිලියන 1 ඉක්මවූ අතර එය නිරපේක්ෂ වශයෙන් සැලකිය යුතු ප්‍රමාණයකි. නමුත් මෙම ප්‍රමාණය එම කාලය තුළ සමස්ත ගෝලීය බැඳුම්කර නිකුත් කිරීම් වලින් සියයට 4ක් පමණි (Hand et al, 2022). හරිත, බලපෑම් සහ තිරසර මූල්‍යකරණයේ තවමත් භාවිතයට නොගත් හැකියාවන් හඳුනා ගනිමින් රජය, මහ බැංකුව සහ කොළඹ කොටස් වෙළෙඳපොළ හරිත බැඳුම්කර නිකුත් කිරීම සහ වෙළඳාම් කිරීම සඳහා රාමු, ප්‍රතිපත්ති සහ යාන්ත්‍රණයන් සකස් කරමින් සිටී.

සංයුක්ත සහ තිරසර ව්‍යාපාර, බලපෑම් ආයෝජකයින් සහ හරිත/ තිරසර මූල්‍ය සම්පාදකයින් සඳහා ශ්‍රී ලාංකීය ආයෝජන ක්ෂේත්‍රයෙහි අභියෝග ජය ගැනීමට සහාය වීම සඳහා  අතරමැදි ක්‍රියාකාරීන් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇත. මැදිහත්කරුවන්ට සංයුක්ත සහ තිරසර ව්‍යාපාර අතර දැනුවත්භාවය ඇති කළ හැකි අතර අරමුදල් සම්පාදන/මූල්‍යකරණ අවස්ථා සමඟ එම ව්‍යාපාර සම්බන්ධ කරන අතරම බලපෑම් ආයෝජනය, හරිත බැඳුම්කර සහ තිරසර මූල්‍ය උපකරණ පිළිබඳව අවබෝධ කර ගැනීමට ඔවුන්ගේ තාක්ෂණික හැකියාවන් වර්ධනය කළ හැකිය. බලපෑම් ආයෝජකයින් සහ හරිත මූල්‍ය සම්පාදකයින් සඳහා ආයෝජන අවස්ථා  ඇති කිරීමට මැදිහත්කරුවන්ට උපකාර කළ හැකිය.

තවද, අතරමැදියන්ට ගැණුම්කරුවන් ලබා ගැනීමෙන් ද්‍රව්‍යශීල ද්විතීයික වෙළඳ පොළක් නිර්මාණය කිරීමේ කටයුත්තෙහි ක්‍රියාශීලීව නිරත විය හැකි අතර එමඟින් මුල් ආයෝජකයින්ට ආයෝජන වලින් ඉවත් වීමටත් බැඳුම්කර හිමියන්ට වෙළඳාම් කිරීමටත් හැකි වන අතර ශ්‍රී ලංකාවේ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර වල ආයෝජන අවස්ථා ආයෝජකයින්ට වඩාත් ආකර්ෂණීය වේ.

විශාල ප්‍රාදේශිය බලපෑම්, අරමුදල් සහ සංවර්ධන මූල්‍ය අරමුදල් මඟින් පිරිනමනු ලබන ආයෝජනය කිරීම සඳහා අවශ්‍ය  අවම මුදල් ප්‍රමාණය අතර නොගැළපීම සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා විශාල අරමුදල් කුඩා සංයුක්ත සහ තිරසර ව්‍යාපාර අවශ්‍යතා වලට ගැළපෙන පරිදි ආයෝජනය කිරීම සඳහා අවශ්‍ය අඩු මුදල් ප්‍රමාණ වලට වෙන් කිරීමේ අවස්ථා ඇත.

විපර්ය අනුකෘති න්‍යාය, මිනුම් හා ඇගයීම් රාමු සංවර්ධනය කිරීම සහ බලපෑම් ආයෝජන සහ හරිත/සමාජ මූල්‍ය වාර්තාකරණ අවශ්‍යතා සපුරාලන බලපෑම් වාර්තා කිරීම සඳහා සංයුක්ත සහ තිරසර ව්‍යාපාර වලට සහාය වීම සඳහා වන සේවාවන්

## Lanka Impact Investment Network

Lanka Impact Investment Network (LIIN) යනු තීරණාත්මක සමාජ සහ පාරිසරික අභියෝගවලට පිළියම් සෙවීම සඳහා  පුද්ගලික ප්‍රාග්ධනය යොමු කිරීම කෙරෙහි අවධානය යොමු කරන පුරෝගාමී බලපෑම් ආයෝජන සමාගමකි. එය සමාජ ව්‍යවසායන් සඳහා ආයෝජනය කරන අතර ශ්‍රී ලංකාව පුරා සිටින සමාජ ව්‍යවසායකයින්ට ව්‍යාපාර සංවර්ධන ආධාර සපයයි. LIIN බලපෑම් ආයෝජන අරමුදල් දෙකක් රැස් කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටියි: එනම් සමාජ ව්‍යවසාය අරමුදල ඩොලර් මිලියන 5 කින් සහ සමාජ බලපෑම් ප්‍රාග්ධනය ඩොලර් මිලියන 20 කින් ලෙසයි.

### අභිප්‍රේරණය

දැවෙන සමාජ සහ පාරිසරික ගැටළු සඳහා  සෘජු විසඳුම් ලබා දෙන ශ්‍රී ලංකාව පුරා පැතිරී ඇති කුඩා හා මධ්‍ය ප්‍රමාණ සමාජ ව්‍යවසායන් සඳහා දැනුම සහ මූල්‍ය ප්‍රාග්ධනය සැපයීම

### නවෝත්පාදනය

විවිධ මට්ටමේ සමාජ ව්‍යවසායන් සහ ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට ගැළපෙන පරිදි දැනුම බෙදා හැරීම සහ ඉලක්කගත නිෂ්පාදන හරහා ආයෝජනයට බලපෑම් එල්ල කළ හැකි බාධක අවම කිරීම

### බලපෑම

ඇත් පවුර ආයෝජන වේදිකාව හරහා දිස්ත්‍රික්ක 10 ක සමාජ ව්‍යවසායන් 17 ක් ඔස්සේ බලපෑම් ආයෝජනය සඳහා ශ්‍රී ලංකා රුපියල් මිලියන 22.5 කට වැඩි ප්‍රමාණයක් සැපයීම; සමාජ ව්‍යවසායන්  577 ක් ආරම්භ කිරීම හෝ  වැඩිදියුණු කිරීම; ධාරිතා සංවර්ධන වැඩමුළු සඳහා  කාන්තා ව්‍යවසායකයින් 330කට අධික සංඛ්‍යාවක් සම්බන්ධ කර ගැනීම

ශ්‍රී ලංකා ආයෝජන ක්ෂේත්‍රයේ අභියෝග ජය ගැනීම සඳහා සංයුක්ත සහ තිරසර ව්‍යාපාර, බලපෑම් ආයෝජකයින් සහ හරිත/තිරසර මූල්‍යකරුවන් වෙත සහාය දීමට අතරමැදි ක්‍රියාකාරීන් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇත.

# 5 | සහායශීලි පරිසරය

දියුණු වීම සඳහා ව්‍යාපාර වලට සක්‍රීය පරිසරයක් අවශ්‍ය වේ: එනම් හිතකර සමාජ ආර්ථික සන්දර්භයක්, ආධාරක ප්‍රතිපත්ති, මූල්‍ය වෙත ප්‍රවේශය මෙන්ම අදාළ සම්පත්, දැනුම සහ වෙළඳපළ වෙත ප්‍රවේශය සැපයිය හැකි දක්ෂ අතරමැදි සංවිධාන යනාදියයි. ශ්‍රී ලංකාවේ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ක්‍රියාත්මක වන පරිසරය පිළිබඳ මෙම කොටසින් විමසා බලයි.

## 5.1 සමස්ත ආර්ථික සන්දර්භය

### 5.1.1 ආර්ථික අර්බුදයෙන් පසු යථා තත්වයට පත් වීම

2022 පුරාවට රටම වෙලා ගත් ආර්ථික අර්බුදයෙන් පසුව රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධ කරගනිමින් 2023 මාර්තු මාසයේ දී විශේෂ ගැණුම් හිමිකම් සහිත දීර්ඝ කළ අරමුදල් පහසුකමක් ලබා ගත්තේය. (Central Bank of Sri Lanka, 2023). ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගිවිසුම් අවශ්‍යතා වලට අනුකූලව රජය විසින් බලශක්ති මිල ගණන් සකස් කර ඇති අතර රජයේ බදු ආදායම ඉහළ නැංවීම සඳහා බදු ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කර ඇත. රජය සතු ව්‍යවසායන් (SOEs) නැවත පැවරීම ඇතුළු ප්‍රතිසංස්කරණ සඳහා කැබිනට් අනුමැතිය ලබා දී ඇත. මහ බැංකුවේ ස්වාධීනත්වය තහවුරු කිරීම සඳහා නීති යෝජනා කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත. දූෂණ විරෝධී නීති ශක්තිමත් කිරීම සඳහා තවත් නීති සම්පාදනය කිරීමට යෝජනා කර ඇත.

2023 ජූලි මාසයේදී පෙර වසරට සාපේක්ෂව ජාතික උද්ධමනය තනි ඉලක්කමක් දක්වා අඩු කිරීමට සෑපු බදුවල වැඩිවීම් සහ මුදල් ප්‍රතිපත්ති අනුපාතවල ඉහළ යෑම් උපකාරී වී ඇත. අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය තහනම් කිරීමත් සමඟ මූල්‍ය ප්‍රතිපත්ති නිකුත් කිරීම සහ බලශක්ති මිල ඉහළ යාම හේතුවෙන් ශ්‍රී ලංකාව 2023 ජුනි මාසයේදී ඩොලර් බිලියන 3.7 දක්වා  එහි විදේශ සංචිතය ක්‍රමයෙන් වර්ධනය කර ගැනීමට සමත් විය.


සාර්ව ආර්ථික දර්ශක ස්ථාවර වීම ආරම්භ වී ඇති අතර ව්‍යාපාර පිළිබඳ අදහස් දුර්වල මට්ටමේ පවතී. ආර්ථිකය 2023 දී සියයට 3 කින් හැකිලෙනු ඇතැයි ද 2024 දී නැවත සියයට 1.3 ක මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කරනු ඇතැයි ද අපේක්ෂා  කෙරේ (ADB, 2023).

### 5.1.2 ප්‍රධාන ආර්ථික අංශ සහ ශ්‍රම බලකායේ අභියෝග


මෙරට පවතින ඉහළ මට්ටමේ ආදායම් බද්ධ සහ සමාජ ආර්ථික දැක්ම පිළිබඳ පොදු අතෘප්තිය හේතුවෙන් සංක්‍රමණය වීම ඉහළ මට්ටමක පවතී. ශ්‍රී ලංකාවේ මිලියන 22 ක ජනගහනයෙන් ආසන්න වශයෙන් 300,000 ක ජනතාවක් 2022 දී රැකියා සඳහා විදේශගත වූ අතර එයින් බහුතරයක් අඩු සහ අර්ධ පුහුණු ශ්‍රමිකයෝ වූහ. 2023 ජනවාරි සිට මාර්තු දක්වා, ඉහළ යන මධ්‍යම පාන්තික වෘත්තිකයන් ඇතුළුව තවත් 73,000 ක් රටින් පිටව ගොස් ඇත (Economist, 2023).



2021 දී ශ්‍රම බලකායෙන් 60% ක් අවිධිමත් අංශයේ සේවය කර ඇත.



ශ්‍රම බලකායෙන් 26% ක් කෘෂිකාර්මික, වන වගා  සහ ධීවර අංශවල සේවය කරයි.



ශ්‍රම බලකායෙන් 16.8%ක් නිෂ්පාදන අංශයේ සේවය කරයි.



2019 දී, පුද්ගලයන් 113,000ක් පමණ මෙරට තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ අංශයේ සේවයේ යෙදී සිටි අතර ඒ අතරින් 37%ක් කාන්තාවන්ය.

2021 දී, ශ්‍රම බලකායෙන් සියයට 60 කට ආසන්න ප්‍රමාණයක් අවිධිමත් අංශයේ සේවයේ යොදවා තිබිණි (Department of Census and Statistics, 2022). මෙමඟින් සිය අයිතිවාසිකම් ආරක්ෂා කරන විධිමත් ආරක්ෂාවන් නොමැති කම්කරුවන් සංඛ්‍යාව පිළිබඳ ගැටළුව ඉස්මතු කරනු ලැබේ.

කෘෂිකර්මාන්තය, වන වගාව සහ ධීවර අංශය ශ්‍රම බලකායෙන් සියයට 26ක් නියෝජනය කරයි. කුඩා වතු හිමි ගොවීන් දිළිඳුතම කණ්ඩායමට අයත් වන අතර දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන පිරිසෙන් අඩකට වඩා වැඩි සංඛ්‍යාවක් නියෝජනය කරයි. එසේම කෘෂිකාර්මික අංශයේ ශ්‍රම බලකායෙන් සියයට 40 ක් කාන්තාවෝ වෙති.

තේ යනු ශ්‍රී ලංකාවේ විශාලතම කෘෂිකාර්මික අපනයනය භෝගය වන අතර දළ වශයෙන් මිලියන 1 ක පමණ පිරිසකගේ සෘජු හෝ වක්‍ර රැකියා සඳහා තේ දායක වේ (EDB, 2022b). ලක්ෂ පහකට ආසන්න කුඩා වතු හිමි වගාකරුවන් සංඛ්‍යාවක් තේ නිෂ්පාදනයෙන් සියයට 70 ක් සඳහා දායක වේ (ILO, 2018). මෙම අංශය බොහෝ විට මානව හිමිකම්, අඩු වැටුප්, දිළිඳු ජීවන තත්වයන් සහ මූලික සේවාවන් සඳහා වන සීමිත ප්‍රවේශය සම්බන්ධ ගැටළු වලට මුහුණ දෙයි (OHCHR" 2021).

නිෂ්පාදන අංශය සේවා නියුක්තිය අනුව දෙවන විශාලතම ආර්ථික අංශය වන අතර එය මුළු රැකියා නියුක්තිකයන්ගෙන් සියයට 16.8ක් වේ (Department of Census and Statistics, 2022). ඇඟලුම් කර්මාන්තය විශාලතම නිෂ්පාදන උප අංශය බවට පත් කරමින් ආසන්න වශයෙන් පුද්ගලයින් 300,000ක් සඳහා රැකියා සපයා ඇති අතර එහි ශ්‍රම බලකායෙන් දළ වශයෙන් සියයට 78ක් කාන්තාවෝ වෙති (IPS, 2019). මෙම කර්මාන්තයේ රැකියා යනු වැටුප්, අපහසු සේවා තත්ත්වයන් සහ සිවිල් අවකාශයන් සීමා කරන දැඩි ප්‍රතිපත්ති හේතුවෙන් අවධානය යොමු විය යුතු ක්ෂේත්‍රයකි (OHCHR, 2021).

ශ්‍රී ලංකාවේ සේවා අංශයේ වැඩිම විදේශ විනිමය උපයන්නා වන සංචාරක ව්‍යාපාරය 2022 දී පුද්ගලයන් 190,521 ක් සෘජුවම සේවයේ යොදවා ඇති අතර තවත් 195,715 ක් එම අංශයෙන් වක්‍ර රැකියා ලබා ඇත (Central Bank of Sri Lanka, 2023). ජාත්‍යන්තර කම්කරු සංවිධානයට (ILO) අනුව මෙම අංශය මෙරට විශාලතම රැකියා අංශ අතරින් එකක් බවට පත් කරමින් එහි රැකියා ප්‍රමාණය මිලියනය ඉක්මවනු ඇතැයි අපේක්ෂා කෙරේ (Aneja et al, 2020).

2019 දී මෙරට තොරතුරු තාක්ෂණ හා ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ අංශයේ පුද්ගලයන් 113,000 ක් පමණ සේවයේ යොදවා තිබුණු අතර ඒ අතරින් සියයට 37 ක් කාන්තාවන් විය (PwC, 2023). 2022 වන විට මෙම අංශයේ බඳවා ගැනීම් සම්බන්ධයෙන් ගැටළුකාරී තත්වයක් ඇති වූ අතර එහි රැකියාවල නියැලී සිටි පුද්ගලයන් සංඛ්‍යාව 71,000 ක් පමණක් විය (Central Bank of Sri Lanka, 2023). එසේම 2023 දී මෙම අංශයට පුද්ගලයින් 175,000 ක් අවශ්‍ය වේ (Aneez, 2023). ආර්ථිකයට ඩොලර් බිලියන 15 ක දායකත්වයක් ලබා දීම සඳහා මෙම අංශයේ 2030 ඉලක්කය සපුරා ගැනීමට 2025 වන විට පුද්ගලයන් 300,000ක් අවශ්‍ය වනු ඇත.

මෙරට සංක්‍රමණික ශ්‍රමිකයන් විසින් කරන විදේශ පර්යේෂණ මත දැඩි ලෙස විශ්වාසය තබා ඇති අතර 2022 දී එමඟින් ලැබූ ආදායම ඩොලර් බිලියන 3.8 ක් වූ අතර එය දෙවන වැඩිම විදේශ ආදායම් මාර්ගය බවට පත් විය (Central Bank of Sri Lanka, 2023). පසුගිය දශකය තුළ විදේශයන්හි වැඩිම සංක්‍රමණික ශ්‍රමිකයින් ස්ථානගත කිරීම 2022 දී සිදු වූ අතර එය 311,056 විය. සියලුම සංක්‍රමණික ශ්‍රමිකයන් අතරින් සියයට 57.7ක් ගෘහ සේවිකාවන් සහ නුපුහුණු ශ්‍රමිකයින් විය. සංක්‍රමණික ශ්‍රමිකයන්, විශේෂයෙන් කාන්තාවන්, සූරාකෑම සහ අපයෝජනය බහුලව සිදු වේ (Thisera and Wasantha" 2023).

## 5.2 සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවලට සහාය වීමේදී පවතින ප්‍රතිපත්ති සහ උපාය මාර්ග ඇතුළුව රජයේ කාර්යභාරය

2022 මූල්‍ය අර්බුදයෙන් පසු රට යථා තත්ත්වයට පත් කිරීමේ දී ව්‍යාපාර ප්‍රධාන වේ. ශ්‍රී ලංකා රජය පහත සඳහන් අරමුණු සමඟින් විවෘත සමාජ ආරක්ෂණ ක්‍රමයක් ඇති කිරීමට උත්සාහ කරයි.

- අපනයනය ඉලක්ක කරගත් තරඟකාරී ආර්ථිකයක්
- පරිසර හිතකාමී හරිත හා නිල ආර්ථිකයක්
- ඩිජිටල් ආර්ථිකයක්

එවැනි ආර්ථික ක්‍රමයක් පෞද්ගලික ව්‍යවසායන් විසින් මෙහෙයවනු ඇති අතර රජයේ කාර්යභාරය වනුයේ වෙළඳපළ නියාමනය කිරීම, යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීම, වෙළඳපළ අසාර්ථකත්වයන් නිවැරදි කිරීම සහ නීතිය හා සාමය පවත්වා ගැනීමයි. 2023 අයවැය මඟින් ව්‍යවසායකයින්ගේ සහ පෞද්ගලික ව්‍යවසායකයින්ගේ කාර්යභාරය සහ ව්‍යාපාර හිතකාමී රෙගුලාසි හරහා ව්‍යවසායකත්වයට පහසුකම් සැලසීම සහ රජයේ මැදිහත්වීම් හේතුවෙන් ඇතිවන වෙළඳපළ විකෘතිතා අවම කිරීම සඳහා වන රජයේ කාර්යභාරය ඉස්මතු කරයි.

වෙළඳපළ විකෘති කිරීම් අඩු කිරීම සඳහා ප්‍රධාන වන්නේ රජය සතු ව්‍යවසායන් ආපසු පැවරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම වන අතර එමඟින් රජයේ මූල්‍ය සහ වාණිජ ණය දෙන වෙළඳපොළ මත සැලකිය යුතු පීඩනයක් එල්ල කරනු ලැබේ (Central Bank of Sri Lanka, 2023). රජය සතු විශාලතම ව්‍යාපාර 52 පමණක් වාර්ෂිකව ශ්‍රී ලංකා රුපියල් බිලියන 86 ක් පමණ පාඩු ලබන අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් පහසුකමේ කොන්දේසිවලට අනුකූලව, කැබිනට් මණ්ඩලය රජය සතු ව්‍යාපාර හතක් විකිණීම සහ අනෙකුත් රජය සතු ව්‍යාපාර සඳහා ශක්තිමත් ප්‍රතිසංස්කරණ සිදු කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත (Daily FT, 2023).

වෙළඳපොළ ප්‍රමුඛ ආර්ථිකයක් කරා නැවත යොමු වීමත් සමඟ රජය නැවත බෙදාහරින්නාගේ (මූලික වශයෙන් ආර්ථික ක්‍රියාකාරකම් බදුකරණය සහ අනෙකුත් අංශ වලට බෙදා හැරීම හරහා සිදු කරනු ලැබේ) සහ නියාමකගේ (ව්‍යාපාර සඳහා සමාන අවස්ථා සහ කර්මාන්තයේ සාධාරණ භාවිතයන් සහතික කිරීම සඳහා සාධාරණ තරඟකාරිත්වය

සහ නියාමන රාමු ස්ථාපිත කිරීම) සාම්ප්‍රදායික කාර්යභාරය ඉටු කරනු ඇත (Freeman and Burton, 2018) (Stiglitz" 2021). මීට අමතරව, මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම, නව ව්‍යවසායන් වේගයෙන් ඇති වීම සහ තාක්ෂණික නවෝත්පාදනයන් ඇතුළු කාර්මිකකරණය සහ වටිනාකම් නිර්මාණය සඳහා රජය පහසුකම් සපයන්නෙකු ලෙස ක්‍රියා කරනු ඇත (Daokui Li and Maskin" 2021). කොවිඩ් 19 හි බලපෑම හඳුනා ගනිමින්, සමාජ විෂමතා උග්‍ර නොවන පරිදි අවදානම් සමාජගත කිරීමේදී සිය කාර්යභාරය සලකා බැලීම හෝ සිදුවීම් වලට ප්‍රතිචාර දැක්වීමේදී පෞද්ගලික අංශයට සහාය වීම ද රජය විසින් සිදු කළ යුතු වනු ඇත (Stiglitz" 2021).

ශ්‍රී ලංකා රජය වෙළඳපොළ නියාමකයෙකු, පහසුකම් සපයන්නෙකු සහ සහභාගිවන්නෙකු ලෙස තම භූමිකාව දක්වමින් ප්‍රධාන ප්‍රතිපත්ති, මාර්ග සිතියම් සහ මුලපිරීම් කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. මෙම ප්‍රතිපත්ති, මාර්ග සිතියම් සහ මුලපිරීම් මඟින් සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සෘජුවම හඳුනා නොගත්තද ඒවාට සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සඳහා එලදායී පරිසරයක් ප්‍රවර්ධනය කිරීමට හා නිර්මාණය කිරීමට හැකියාව ඇත.

ප්‍රතිපත්ති ප්‍රධාන වශයෙන් තිරසරභාවය පිළිබඳ අභියෝග කෙරෙහි අවධානය යොමු කරයි. සමාජ අවශ්‍යතා සපුරාලීමට අදාළ අනෙකුත් රජයේ ප්‍රතිපත්ති (උදා: සෞඛ්‍ය සේවා සැපයීම, පෝෂණය, අධ්‍යාපනය සහ ග්‍රාමීය කෘෂිකාර්මික සංවර්ධනය), වෙළඳපොළ නියාමකයෙකු හෝ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සඳහා පහසුකම් සපයන්නෙකු ලෙස වන රජයේ භූමිකාවක් අපේක්ෂා නොකරයි. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තා සවිබල ගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2023) මඟින් කාන්තාවන්ගේ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සුළුතරයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ පෞද්ගලික අංශයේ ඔවුන්ගේ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සඳහා රජය ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කිරීමට උත්සාහ කරන ක්ෂේත්‍ර දක්වා ඇත (Ministry of Women, Child Affairs and Social Empowerment, 2023). කෙසේ වුවද, කාන්තාවන්ගේ සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සුළුතරයන්ගේ පාරිසරික සහ තිරසර ඉලක්ක සපුරා ගැනීම සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය පිළිබඳ රජයේ පිළිගැනීම ඉහළ යාමක් පෙන්නුම් කලද සමාජ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා පෞද්ගලික අංශයට, විශේෂයෙන් සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවලට, ඇත්තේ සීමිත පිළිගැනීමක් සහ පහසුකම් සැලසීමකි.

පෞද්ගලික අංශයට ආයෝජනය කිරීමට සහ දියුණු වීමට හැකි සහායශීලි පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රතිපත්තිවල පැහැදිළි බව සහ ස්ථාවරත්වය ඉතා වැදගත් වේ. ව්‍යාකූලත්වයට හේතු වන සහ වේගවත් සමාජ ආර්ථික සංවර්ධනයට බාධා කරන සැලකිලිමත් විය යුතු ප්‍රධාන ක්ෂේත්‍ර ලෙස නොගැළපෙන සහ ප්‍රතිවිරුද්ධ ප්‍රතිපත්ති දක්වා ඇත (National Planning Department, 2023). එකම කරුණු යම් ප්‍රමාණයකට ආවරණය කෙරෙන සහ ප්‍රතිවිරුද්ධ ප්‍රතිපත්ති හේතුවෙන් යැවෙන ප්‍රතිවිරුද්ධ පණිවිඩ සම්බන්ධයෙන් ප්‍රධාන තොරතුරු සපයන්නෝ කනස්සල්ල පළ කර ඇත. එබැවින්, සංයුක්ත සහ තිරසර වාපාර සංවර්ධනය සඳහා එම ව්‍යාපාර වැඩිදියුණු කිරීම සඳහා දේශීය හා විදේශීය ආයෝජන ආකර්ෂණය කර ගැනීමට හිතකර ස්ථාවර ප්‍රතිපත්ති පවතින පසුබිමක් නිර්මාණය කිරීම ඇතුළුව ප්‍රතිපත්තිමය අනුකූලතාව සහ පැහැදිලි බව පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වනු ඇත. ප්‍රතිපත්ති මඟින් තිරසර සහ සංයුක්ත ආර්ථිකයක් සඳහා අපේක්ෂිත ප්‍රතිඵල ලබා දෙන බව සහතික කිරීම සඳහා ප්‍රතිඵල මත පදනම් වූ අධීක්ෂණ සහ ඇගයීම් රාමු යොදා ගැනීම ඉතා වැදගත් වනු ඇත.


ඡායාරූප Stock

| රජයේ කාර්යභාරය | සංයුක්ත සහ තිරසර ව්‍යාපාර අංශය සඳහා ප්‍රතිපත්තිය සහ අදාළත්වය |
|---|---|
| නියාමක | **ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තා සවිබල ගැන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2023)**<br><br>මෙම ප්‍රතිපත්තිය මඟින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය නොසලකා රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශය තුළම සැමට සමාන අයිතිවාසිකම්, නිදහස සහ අවස්ථා භුක්ති විඳිය හැකි සමාජයක් අරමුණු කෙරේ. |
| පහසුකම් සපයන්නා / නියාමක | **තිරසර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය (2019)**<br><br>සම්පත් භාවිතය අඩු කිරීම, අපද්‍රව්‍යය හා දූෂක අවම කිරීම සහ සියලු ආර්ථික අංශ ඔස්සේ තිරසර භාවිතයන් දිරිමත් කිරීම ප්‍රතිපත්තියේ අරමුණ වේ. 2030 වන විට අපද්‍රව්‍යය අඩු කිරීම සහ තිරසර ප්‍රසම්පාදනය අවධාරණය කරමින් ආහාර නාස්තිය අවම කිරීම සහ අවම පාරිසරික බලපෑම සඳහා රසායනික ද්‍රව්‍යය කළමනාකරණය කිරීම එයට ඇතුළත් වේ. |
| පහසුකම් සපයන්නා / නියාමක | **තිරසර නිවාස සහ ඉදිකිරීම් මාර්ග සිතියම 2020-2050 (2020)**<br><br>මාර්ග සිතියම මඟින් කර්මාන්තයේ මෙහෙයුම් කටයුතු නැවත සකස් කරමින් ඉදිකිරීම් අංශය සම්පත් කාර්යක්ෂම සහ තිරසර භාවිතයන් කරා මෙහෙයවනු ලැබේ. |
| පහසුකම් සපයන්නා / නියාමක/ සහභාගිවන්නා | **කාබන් ශුද්ධ ශුන්‍ය 2050: මාර්ග සිතියම සහ උපායමාර්ගික සැලැස්ම (2023)**<br><br>මාර්ග සිතියම සහ උපායමාර්ගික සැලැස්ම හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම සහ කාබන් විවික්ත කිරීම ඉහළ නැංවීම සඳහා වන උපාය මාර්ග කෙටියෙන් දක්වන අතර එමඟින් පරීක්ෂාකාරී දේශගුණික ක්‍රියාමාර්ග හරහා කාබන් උදාසීනත්වය ඇති කිරීම අරමුණු කරයි. |
| පහසුකම් සපයන්නා / නියාමක | **දේශගුණික සෞභාග්‍ය සැලැස්ම (2022)**<br><br>මෙම සැලැස්ම මඟින් බලශක්ති සංක්‍රාන්තියට පහසුකම් සැලසීම සහ සංවර්ධනයේ දී දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා රාමුවක් හඳුන්වා දෙනු ලැබේ. සැලැස්මෙහි ප්‍රධාන වශයෙන් පුනර්ජනනීය ප්‍රභවයන් වෙත සිදු වන බලශක්ති සංක්‍රාන්තිය සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දෙන සහ හරිත රැකියා සඳහා ශ්‍රම බලකායට නව කුසලතා ඉගැන්වීම සහ පුහුණුව ලබා දීම තුළින් තිරසර ආර්ථික පරිවර්තනය ප්‍රවර්ධනය කිරීම සඳහා උපාය මාර්ග දක්වා ඇත. |
| පහසුකම් සපයන්නා | **පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්ම 2021 - 2026 (2019)**<br><br>මෙම සැලැස්ම මඟින් සූර්ය බලය, සුළං සහ ජෛව ස්කන්ධ මත පදනම් වූ විදුලිය කෙරෙහි වන අවධානය සහිතව තිරසර බලශක්ති විසඳුම් සඳහා දායක වෙමින්, මහා පරිමාණ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ප්‍රවර්ධනය කරනු ලැබේ. |
| පහසුකම් සපයන්නා | **ශ්‍රී ලංකාවේ ජාතික අනුවර්තන සැලැස්ම: 2016 - 2025 ( 2016)**<br><br>එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියේ මාර්ගෝපදේශ වලට අනුකූලව, ආංශික සහ ජාතික මට්ටමින් අදාළ කර ගැනීම, අවදානමට ලක්විය හැකි අංශ හඳුනා ගැනීම සහ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ කර ගැනීමේ විකල්ප යෝජනා කිරීම මෙම සැලැස්මෙහි ඉලක්කය වේ. |
| පහසුකම් සපයන්නා / නියාමක | **ජාතික පාරිසරික ක්‍රියාකාරී සැලැස්ම 2022 - 2030 (2022)**<br><br>ක්‍රියාකාරී සැලැස්ම තිරසර සංවර්ධන ඉලක්ක වලට අනුකූලව තේමාත්මක ක්ෂේත්‍ර නවයක් කෙරෙහි අවධානය යොමු කරමින් මැදිහත්වීමේ උපාය මාර්ග, සම්පත් සජීවකරණ සැලසුම් සහ තවත් දෑ පිරිනමමින් විසිඑක්වන සියවසේ පාරිසරික අභියෝග සම්බන්ධයෙන් අවධානය යොමු කරයි. |
| පහසුකම් සපයන්නා / නියාමක | **ඉදිරි දශකය සඳහා ජාතික බලශක්ති විභවයන්, ක්‍රමෝපායයන් සහ මාර්ග සිතියම 2023-2033 (2022)**<br><br>ජල, සුළං, සූර්ය, හයිඩ්‍රජන් සහ තාප බලශක්ති ප්‍රභවයන් සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් තිරසර බලශක්ති ආරක්ෂණ උපායමාර්ගික සැලැස්මක් සඳහා ඇති හැකියාවන් සහ උපාය මාර්ග මෙම සැලැස්මෙහි දක්වා ඇත. |

| රජයේ කාර්යභාරය | සංයුක්ත සහ තිරසර ව්‍යාපාර අංශය සඳහා ප්‍රතිපත්තිය සහ අදාළත්වය |
|---|---|
| පහසුකම් සපයන්නා / නියාමක | **ප්ලාස්ටික් අපද්‍රව්‍යය කළමනාකරණය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම (2021)**<br><br>මෙම සැලැස්ම වැළැක්වීමේ ප්‍රවේශයක් අනුගමනය කරන අතර එමගින් කසළ ගොඩකිරීමෙන් තොර චක්‍රීය ආර්ථිකයක් ප්‍රවර්ධනය කිරීම සඳහා 3R අපද්‍රව්‍ය ධූරාවලිය (අඩු කිරීම, නැවත භාවිතා කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය) අවධාරණය කරයි. |
| පහසුකම් සපයන්නා / නියාමක | **පාරිසර හිතකාමී ලේබල්කරණය පිළිබඳ ජාතික රාමුව**<br><br>මෙම රාමුව පරිසර හිතකාමී භාවිතයන් සහ වගකිවයුතු පාරිභෝගික හැසිරීම් දිරිමත් කරමින් පරිසර හිතකාමී ලේබල්කරණ යෝජනා ක්‍රම සඳහා  සහාය දක්වයි. |
| පහසුකම් සපයන්නා / නියාමක | **තිරසර සංචාරක ව්‍යාපාර සහතික කිරීමේ යෝජනා ක්‍රමය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (2018)**<br><br>මෙම සහතික කිරීම මගින් සංචාරක අංශයේ තිරසර භාවිතයන් දිරිමත් කරන අතර ව්‍යාපාර වලට සිය තිරසරභාවය ප්‍රචාරය කිරීමට සහ සිය පාරිසරික හා ප්‍රජා ප්‍රතිලාභ ප්‍රදර්ශනය කිරීමට හැකියාව ලබා දෙනු ලැබේ. |
| පහසුකම් සපයන්නා / නියාමක | **කාබනික නිෂ්පාදන සහතික කිරීම, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය**<br><br>සහතික කිරීමේ ක්‍රමය මඟින් තිරසර වගා භාවිතයන් සහ දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ වෙත ඇති ප්‍රවේශය ප්‍රවර්ධනය කරමින් කාබනික ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කරනු ලැබේ. |
| පහසුකම් සපයන්නා / නියාමක | **හරිත බැඳුම්කර නිකුත් කිරීම සහ වෙළඳාම, කොළඹ කොටස් වෙළඳපොළ**<br><br>ශ්‍රී ලාංකික සමාගම් වලට හරිත ව්‍යාපෘති සඳහා අරමුදල් රැස් කර ගැනීමට සහ විදේශීය ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමට හැකි වන පරිදි හරිත බැඳුම්කර ලැයිස්තුගත කිරීමට සහ වෙළඳාම් කිරීමට කොටස් හුවමාරුව ඉඩ සලසනු ඇත |
| පහසුකම් සපයන්නා | **පුනර්ජනනීය බලශක්ති සම්පත් සංවර්ධන සැලැස්ම 2021 - 2026 (2019)**<br><br>මෙම සැලැස්ම මඟින් සූර්ය බලය, සුළං සහ ජෛව ස්කන්ධ මත පදනම් වූ විදුලිය කෙරෙහි වන අවධානය සහිතව තිරසර බලශක්ති විසඳුම් සඳහා දායක වෙමින්, මහා පරිමාණ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ප්‍රවර්ධනය කරනු ලැබේ. |
| පහසුකම් සපයන්නා / නියාමක | **තිරසර මූල්‍යකරණය සඳහා  වන මාර්ග සිතියම (2019)**<br><br>ශ්‍රී ලංකාව තුළ තිරසර මූල්‍ය භාවිතයන් ඇති කිරීම සඳහා විස්තීර්ණ උපාය මාර්ග මෙම මාර්ග සිතියමෙහි දක්වා ඇත. එමඟින් පාරිසරික, සමාජීය සහ ආයතනික පාලන අවදානම් කළමනාකරණය කිරීම සහ පරිසර හිතකාමී ව්‍යාපාර වලට සහාය දැක්වීම සඳහා මූල්‍ය ආයතන වලට බලය ලබා දෙනු ලැබේ.<br><br>ප්‍රතිපත්ති සහජීවනය පෝෂණය කිරීම, ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සහ නව්‍ය හරිත හා දේශගුණික මූල්‍ය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම මඟින් මාර්ග සිතියම සමස්ත මූල්‍ය අංශය පුරා තිරසර ආයෝජන සඳහා පෞද්ගලික ප්‍රාග්ධනය ආකර්ෂණය කර ගැනීමට උත්සාහ කරයි. |
| නියාමක | **ශ්‍රී ලංකා හරිත මූල්‍ය වර්ගීකරණය**<br><br>වර්ගීකරණය මඟින් තිරසර මූල්‍ය සඳහා වන මාර්ග සිතියම අවධාරණය කරමින් පාරිසරික වශයෙන් තිරසර ආර්ථික ක්‍රියාකාරකම් වර්ගීකරණ කරනු ලැබේ. වර්ගීකරණය මඟින් දේශීය සන්දර්භය සලකා බලමින් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව හරිත මූලපිරීම් සඳහා අඩු වියදම් අරමුදල් ලබා ගැනීමට මඟ පාදන අතර වන වගාවේ සිට මූල්‍ය දක්වා පුළුල් පරාසයක විහිදී ඇති අංශ ප්‍රවර්ධනය කරයි |
| පහසුකම් සපයන්නා / නියාමක | **ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාරය සඳහා  වන උපායමාර්ගික සැලැස්ම 2022-2025**<br><br>සංචාරක අංශය යථා තත්ත්වයට පත් කිරීම කරා මෙහෙයවීම සහ අනාගතට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම අරමුණු කරගත් ක්‍රියාමාර්ග සඳහා ප්‍රමුඛතා සහ සාධාරණීකරණයන් සැලැස්ම මඟින් දක්වා ඇත. එය වසර දෙකක් ඇතුළත අංශය යථා තත්ත්වයට පත් වීමේ හැකියාව අවධාරණය කරන අතර වඩාත් සංයුක්ත, තිරසර සහ ඔරොත්තු දෙන සංචාරක ආකෘතියක් සඳහා පෙනී සිටී. |

## 5.3 පුද්ගලික අංශයේ කාර්යභාරය

ශ්‍රී ලංකාවේ පෞද්ගලික ව්‍යවසායන් අරමුණු සහිත මෙහෙවර මඟින් මෙහෙයවන කටයුතු හරහා සමාජීය හා පාරිසරික බලපෑම් ඇති කරන බවට සැලකිය යුතු උදාහරණ තිබේ (4 වන කොටසේ තෝරාගත් උදාහරණ බලන්න).

ශ්‍රී ලංකාවේ අපනයනාභිමුඛ ඇඟලුම්, කෘෂිකර්මාන්තය සහ සංචාරක යන අංශවල මහා පරිමාණ ව්‍යවසායන් කිහිපයක් ධනාත්මක සමාජීය හා පාරිසරික ප්‍රතිඵල ලබා දීම සඳහා සංයුක්ත සහ තිරසර භාවිතයන් අනුගමනය කිරීම කෙරෙහි දැඩි කැපවීමක් පෙන්නුම් කර ඇත. පරිසරයට අවම බලපෑමක් ඇති කරන ඩයි වර්ග සහ රසායනික ද්‍රව්‍ය සඳහා ආයෝජනය කිරීම, අඩු ජල පරිභෝජනයක් සහිත නව්‍ය ඩයි කිරීමේ ක්‍රම, අපජලය ප්‍රතිචක්‍රීකරණය කිරීම, උඩුචක්‍රීකරණය (upcycled) කරන ලද සහ නැවත භාවිතා කරන ලද අපද්‍රව්‍ය වලින් සෑදූ රෙදි, අපද්‍රව්‍යය අඩු කිරීම සහ පුනර්ජනනීය ප්‍රභවයන් හරහා බලශක්තිය ලබා ගැනීම විශාල ඇඟලුම් අපනයනකරුවන්ගේ උපායමාර්ගික අරමුණු අතර ප්‍රධාන වේ. තාක්ෂණික දැනුම, කාලගුණික දත්ත සහ දේශගුණික විපර්යාස අනුවර්තන තාක්ෂණයන් බෙදා ගැනීමෙන් සහ ආපසු මිලදී ගැනීමේ ගිවිසුම් හරහා වගා කිරීමට පෙර සහතික මිලක් ලබා දීමෙන් විශාල කෘෂිකාර්මික නිෂ්පාදන එකතු කර බෙදා හරින්නන් විසින් දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දෙන සහ ආර්ථික වශයෙන් සවිබල ගැන්වූ කුඩා වතු හිමියන් නිර්මාණය කිරීමට උත්සාහ කරනු ලැබේ. විශාල හෝටල් ක්‍රියාකරුවෝ ස්වභාවික වාසස්ථාන වලට අවම වෙනස්කම් සහිත පහසුකම් සැලසුම් කිරීම, ශාක හා සත්ත්ව විශේෂ ආරක්ෂා කිරීම සහ සේවා සැපයීම සඳහා දේශීය ප්‍රජාවන් සෘජුවම සම්බන්ධ කර ගැනීම යන අවස්ථාවලදී තම උපායමාර්ගික අරමුණු හා නිෂ්පාදන සහ සේවා පිරිනැමීම් වල වැදගත් කොටසක් ලෙස සංයුක්ත සහ තිරසර භාවිතයන් සලකති.

එසේම, ශ්‍රී ලංකාවේ ඇතැම් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ධනාත්මක සමාජීය සහ පාරිසරික ප්‍රතිඵල ලබා දීමෙහි සක්‍රියව නිරත වේ. ශ්‍රී ලංකාවේ සමාජ ව්‍යවසායයන්හි තත්ත්වය පිළිබඳ වාර්තාවට අනුව ඇස්තමේන්තුගත සියයට 10 ක් හෙවත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර 8,100 ක් සමාජ ව්‍යවසායන් වේ (Lanka Social Ventures and Social Enterprise UK, 2018). සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සමාජ ව්‍යවසායන් වලට වඩා පුළුල් ලෙස අර්ථ දක්වා තිබෙන්නේය යන කරුණ සලකන විට, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අතර සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවල ඇස්තමේන්තුගත ප්‍රතිශතය වැඩි යැයි අපේක්ෂා කිරීම සාධාරණ වේ. වාර්තාවට අනුව සමීක්ෂණයට බඳුන් කරන ලද බොහෝ සංවිධාන අධ්‍යයනයේ නිර්ණායක සපුරා තිබුණද තමන් සමාජ ව්‍යවසායන් ලෙස ම සලකා නොතිබුණි. එසේම, දැනටමත් සමාජීය හා පාරිසරික බලපෑමක් ඇති කරන බොහෝ ව්‍යාපාර තමන් සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ලෙස හඳුනා නොගනී.

ශ්‍රී ලංකාවේ සමුපකාර සංගම් වලින් ඇස්තමේන්තුගත සියයට 27 ක් සමාජ ව්‍යවසායන් වේ (Lanka Social Ventures and Social Enterprise UK" 2018). ගොවි පාදක සංවිධාන සහ/හෝ නිෂ්පාදක කණ්ඩායම් ලෙස, සමුපකාර සැලකිය යුතු සාර්ථකත්වයක් අත්කර ගෙන ඇති අතර (ILO, 2018) කුඩා පරිමාණ කාබනික ගොවි සංගමය, උදයාර්කඩ්ඩු සමුපකාරය (ILO, 2020), පුතුකුඩියිරිප්පු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කාන්තා ව්‍යවසායකයින්ගේ සමුපකාර සංගමය (ILO, 2018), මොරවක් කෝරළේ තේ නිෂ්පාදකයින්ගේ සමුපකාර සංගමය (Mahindapala et al, 2020), මලරුම් භූමි කාන්තා ගොවි සංවර්ධන සමුපකාර සමිතිය සහ කාලිමොඩ්ඩායි පුන්යන්කුලම් සකසුරුවම් සහ ණය සමුපකාර සංගමය (ILO, 2019) ආදිය උදාහරණ වේ. කෙසේ වුවද, කාන්තාවන් ඇතුළු ආන්තික ප්‍රජාවන්ගේ සාමාජිකයින් ආර්ථික ක්‍රියාකාරකම් සමඟ සම්බන්ධ කර ඔවුන්ගේ ආදායම් වැඩි කිරීමේ සාර්ථකත්වය පෙන්නුම් කර ඇති බොහෝ සමුපකාර

ශ්‍රී ලංකාවේ අපනයනාභිමුඛ ඇඟලුම්, කෘෂිකර්මාන්තය සහ සංචාරක යන අංශවල මහා පරිමාන ව්‍යවසායන් කිහිපයක් ධනාත්මක සමාජීය හා පාරිසරික ප්‍රතිඵල ලබා දීම සඳහා සංයුක්ත සහ තිරසර භාවිතයන් අනුගමනය කිරීම කෙරෙහි දැඩි කැපවීමක් පෙන්නුම් කර ඇත.




ඡායාරූපය: ශ්‍රී ලංකා තිරසර සංවර්ධන සභාව

සංගම්, තමන් සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ලෙස හඳුනා නොගන්නා අතර, එමඟින් ඔවුන්ගේ බලපෑම සහ මෙහෙයුම් වැඩිදියුණු කිරීමට හැකි වන පරිදි පිළිගැනීම සහ ආයෝජන ලබා ගැනීමේ හැකියාව සීමා වේ.

විශාල පරිමානයේ ව්‍යවසායන්, කුඩා හා මධ්‍යය පරිමාණ ව්‍යවසායන් සහ සමුපකාරවල බලපෑම දැනටමත් හඳුනාගෙන, මැන බලා සන්නිවේදනය කර ඇති අතර මෙය සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. ජනනය කරන ලද බලපෑම් ඇති කිරීම සහ වාර්තාකරණය සඳහා ව්‍යාපාරයේ කැපවීම පිළිබඳ පොදු ප්‍රකාශයක් සකස් කිරීම ඇතුළුව තමන් ඇති කරන බලපෑම හඳුනාගෙන එය වර්ධනය කරන උපාය මාර්ග යොදා ගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට බලපෑම් ව්‍යාපාර නායකයින්හට ධාරිතා සංවර්ධනය, දැනුවත්භාවය සහ පිළිගැනීම සහ ව්‍යාපාර පුහුණු කිරීම තුළින් බලපෑම් ව්‍යාපාර සඳහා ඵලදායී පරිසරයක් නිර්මාණය කිරීම සඳහා පුද්ගලික අංශයේ බහුපාර්ශවකරුවන්ගේ වඩාත් පුළුල් ප්‍රවේශයක් අවශ්‍ය වේ.

සංයුක්ත සහ තිරසර ප්‍රතිඵල ලබා දෙන සියළුම අංශ ඔස්සේ බලපෑම් ව්‍යාපාර හඳුනා ගැනීම සහ ඒ පිළිබඳව වාර්තා කිරීම සම්මතය බවට පත්වන ප්‍රමිතීන් සැකසීමට උපකාරී වනු ඇති අතර එමඟින් දැනටමත් අරමුණක් සහිත බලපෑමක් ඇති නොකරන අනෙකුත් ව්‍යවසායන්ට එය අනුගමනය කිරීමට දිරිගන්වනු ලැබේ. මෙමඟින් ආයෝජන අවස්ථා ඉහළ නංවා බලපෑම් ආයෝජකයින් සඳහා එය වඩාත් ආකර්ෂණීය කරනු ලැබේ.

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ සමුපකාර මඟින් එල්ල කරන ධනාත්මක සමාජීය හා පාරිසරික බලපෑම පවත්වා ගැනීම සහ මැන බැලීම ඉතා වැදගත් වේ. කෙසේ වුවද, එසේ කිරීම විශේෂයෙන් කුඩා හා මධ්‍යය පරිමාණ ව්‍යවසායකයින්ට අභියෝගාත්මක වේ. මන්ද යත් ඔවුන්ගේ සංවිධානාත්මක උපාය මාර්ග බොහෝ දුරට පැවැත්ම සහ මෙහෙයුම් අවශ්‍යතා මඟින් මෙහෙයවනු ලබන බැවිණි. නිලධාරිවාදී අකාර්යක්ෂමතාවන්, දේශපාලන මැදිහත්වීම් වලින් කඩිසරබව සහ නවෝත්පාදනයට බාධා විය හැකි සීමිත වූ මූල්‍යනයන් හේතුවෙන් සමුපකාර පීඩාවට පත්විය හැකිවේ. බලපෑම් එල්ල කිරීම සඳහා මෙහෙවර පාදක කරගත් ප්‍රවේශයක් ඇතුළත් කිරීම, මහජනතාවට දැකිය හැකි බව, වගවීම සහ ප්‍රසිද්ධියේ වාර්තා කරන ස්ථාවර හා අරමුණු සහිත බලපෑමක් එල්ල කිරීම සඳහා සාමූහික අරමුණක් ඇති කිරීමෙන් එවැනි අභියෝග අවම කර ගැනීමට උපකාරී විය හැකිය.

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සහ සමුපකාර අතර සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සඳහා ඵලදායී පරිසරයක් නිර්මාණය කිරීමේදී ශ්‍රී ලංකාවේ විශාල පරිමාන ව්‍යවසායන්ට සැලකිය යුතු සහ බලපෑම්සහගත කාර්යභාරයක් ඉටු කළ හැකි අතර එමඟින් සහයෝගීතාවයෙන් යුතුව ක්‍රියාත්මක වන, සංයුක්තභාවය සහ තිරසරභාවය පිළිබඳ මූලධර්ම මත පදනම් වූ පෞද්ගලික අංශයක් කරා සාමූහික පියවරක් තැබිය හැකිය.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන අංශය වන ඇඟලුම් කර්මාන්තය, ''වරදකාරීත්වයෙන් තොර ඇඟලුම්" ("Garments without Guilt") ව්‍යාපාරයට සම්බන්ධ වන අතර එය ලොව පළමුවෙන්ම තමන් විසින්ම පනවා ගත් උසස් රැකියා ප්‍රමිතීන් ක්‍රියාත්මක කළ සහ ඒවා ශක්තිමත් ලෙස ප්‍රවර්ධනය කළ අංශ අතරින් එකකි. වෙනත් අංශවල සංයුක්ත සහ තිරසර ව්‍යාපාර, විශේෂයෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ සමුපකාර සඳහා සමාන ව්‍යාපාර සංවර්ධනය කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට උපකාර කිරීම, ශ්‍රී ලංකාවේ සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවල සමස්ත තත්ත්වය සහ අරමුණු සහගත බලපෑමක් එල්ල කිරීමට ව්‍යාපාරවල කැපවීම ඉහළ නැංවීමට උපකාරී වනු ඇත.

තිරසර මුලපිරීම් ක්‍රියාත්මක කිරීමට සහ හරිත තාක්ෂණයන් යොදා ගැනීමට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ සමුපකාර සතු නොවිය හැකි සම්පත් සහ විශේෂඥතාව බොහෝ විට විශාල ව්‍යවසායන් සතුව ඇත. කලින් සිදු කළ යුතු ආයෝජනය සහ ලාභ ලැබීමට අවශ්‍ය මෙහෙයුම් කටයුතු ප්‍රමාණය යන හේතු මත ප්‍රාග්ධන ආයෝජන තනිවම සපයා ගත නොහැකි කුඩා පරිමාණ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සමඟ විශාල ව්‍යවසායන් සම්බන්ධ කිරීමට සහයෝගීතාවයෙන් යුතුව කටයුතු කිරීම සඳහා දිරිගන්වන ආකල්පයක් ඉවහල් විය හැකිය. උදාහරණයක් ලෙස, කුඩා පරිමාණයේ සංයුක්ත සහ තිරසර ව්‍යාපාරවල වර්ණ ගැන්වීමේ ක්‍රියාවලියේ දී බැහැර කරන ජලය පිරිපහදු කිරීම සඳහා අපජල බැහැර කිරීමේ කම්හලේ ධාරිතාව බෙදා ගැනීමට ප්‍රමුඛ පෙළේ ඇඟලුම් නිෂ්පාදකයෙක් කුඩා පරිමාණයේ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සමඟ සාකච්ඡා කරමින් සිටියි. උඩුචක්‍රීකරණය (upcycling) සහ නැවත භාවිත කිරීම සඳහා ඉතිරි වන අමුද්‍රව්‍යය සහ ඉවතලන අමුද්‍රව්‍යය සැපයීමට විවිධ අංශවල විශාල ව්‍යවසායන් කිහිපයක් කුඩා පරිමාණ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර සමඟ හවුල් වී කටයුතු කරයි.

විශාල ව්‍යවසායන්ට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සහ සමුපකාර තම සැපයුම් දාමවලට ඒකාබද්ධ කළ හැකිය. විශාල ව්‍යවසායන්හි ප්‍රධාන තොරතුරු සපයන්නන් කිහිප දෙනෙක් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සංවර්ධනය කර තම සැපයුම් දාම සමඟ සම්බන්ධ කරන ලද වැඩසටහන් පිළිබඳ අවධාරණය කළහ. විශාල ව්‍යවසායන් සඳහා හොඳින් දන්නා සහ විශ්වසනීය සැපයුම්කරුවෙකු ලබා දුන් අතර කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ජාත්‍යන්තර වෙළඳපොළ වෙත ප්‍රවේශය ලබා ගන්නා ලදී. ගොවීන් සඳහා වන වගා වැඩසටහන් යටතේ ගොවීන් නිෂ්පාදක කණ්ඩායම් බවට සංවිධානය කිරීමට ඔවුන් දරන උත්සාහයන් පිළිබඳව තවත් ප්‍රධාන තොරතුරු සපයන්නෙක් අවධාරණය කළේය. එවැනි සංයුක්ත සහ තිරසර ව්‍යාපාර අනෙකුත් සැපයුම් දාම ඔස්සේ ප්‍රතිනිර්මාණය කිරීම සඳහා වඩාත් සුදුසු වන නමුත් ඒ සඳහා එවැනි අවස්ථා ගොඩ නැගීමට, බෙදා ගැනීමට සහ අධ්‍යයනය කිරීමට හැකි සහයෝගී වේදිකා අවශ්‍ය වේ.

සංයුක්තභාවය සහ තිරසරභාවය වෙනුවෙන් පෙනී සිටීමේදී සහ දැනුම සහ හොඳම භාවිතාවන් බෙදා ගැනීම සඳහා

වේදිකාවක් සැපයීමේදී වාණිජ මණ්ඩල සහ කර්මාන්ත සංගම් වලට වැදගත් කාර්යභාරයක් ඉටු කළ හැකිය. මෙම පාර්ශවකරුවන්ට බලපෑම වැඩි කිරීම සඳහා සහයෝගීතාව දිරිමත් කරන, සංයුක්තභාවය සහ තිරසරභාවය පිළිබඳ ප්‍රමිතීන් ප්‍රවර්ධනය කරන, ධාරිතා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන සහ සංයුක්ත සහ තිරසර භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යාපාර අතර ජාලකරණයට පහසුකම් සපයන රජයේ දිරිගැන්වීම් වෙනුවෙන් පෙනී සිටිය හැකිය.

සංයුක්ත සහ තිරසර ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා වන ශ්‍රී ලංකාවේ ප්‍රයත්නයන්ට සහාය වීමට ගෝලීය සැපයුම් දාම කොටස්කරුවන් (උදා: ගැනුම්කරුවන්, වෙළඳ සන්නාම, සිල්ලර වෙළෙන්දන්) සම්බන්ධ කර ගැනීම සඳහා මණ්ඩල සහ වෙළඳ සංගම් රජය සමඟ එක්ව ජාත්‍යන්තර සංවර්ධන සංවිධාන සමඟ හවුල් වී කටයුතු කළ හැකිය. මෙයට සාධාරණ වෙළඳ කොන්දේසි ප්‍රවර්ධනය කිරීම, ඔවුන්ගේ ඉලක්කගත පාරිභෝගික වෙළඳපොළ තුළ දැනුවත්භාවය ඇති කිරීම හා ප්‍රවර්ධනය කිරීම සහ සංයුක්ත සහ තිරසර ප්‍රතිඵල ලබා දීම සඳහා දැඩි කැපවීමක් පෙන්නුම් කරන ව්‍යවසායන් වෙතින් ආරම්භයක් ලබා ගැනීම සඳහා වන විධි නියෝග ඇතුළත් විය හැකිය.

## 5.4 මූල්‍යන පසුබිම

### 5.4.1 මූල්‍යන පසුබිමට අදාළ අභියෝග

මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ දී ව්‍යාපාර සාමාන්‍යයෙන් මුහුණ දෙන සීමාවන්ට අමතරව, සාධාරණ පිරිවැයකින් මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ හැකියාව තවදුරටත් සීමා කරන අන්‍ය අභියෝග වලට සංයුක්ත තිරසර ව්‍යාපාර මුහුණ දෙයි.

සමාජීය හා පාරිසරික බලපෑමක් ඇති කිරීම සඳහා සංයුක්ත තිරසර ව්‍යාපාර වැඩි අවදානම් ගැනීමට, අඩු ලාභදායීතාවක් පිරිනැමීමට ඉඩ ඇති අතර මූලික අරමුණ ලාභ වැඩි කර ගැනීම වන පුද්ගලික අංශයේ වෙනත් ව්‍යවසායන්ට සාපේක්ෂව ඒවාට ලාභ උපරිම කර ගැනීම සඳහා වැඩි කාලයක් අවශ්‍ය වීමට ඉඩ ඇත.

වාණිජ ණය දෙන්නන් සඳහා (උදා: වාණිජ බැංකු) සංයුක්ත තිරසර ව්‍යාපාර යනු තවමත් සාපේක්ෂව නව සංකල්පයක් වන අතර ණය දෙන්නන් අතර දැනුවත්භාවය නොමැතිකම යන්නෙන් අදහස් වන්නේ සංයුක්ත තිරසර ව්‍යාපාර වලට අවාසි සහගත තත්ත්වයක් ඇති වී තිබෙන බව සහ අඩු කැමැත්තක් දක්වන බවයි.

සංවර්ධන මූල්‍ය ආයතන (DFIs) විසින් සංයුක්ත තිරසර ව්‍යාපාර සඳහා මුදල් යෙදවීමට ඉඩ ඇත. කෙසේ වුවද, ඒවා අරමුදල් සපයන්නේ විශාල ආයෝජන සඳහාය. කුඩා පරිමාණ සංයුක්ත තිරසර ව්‍යාපාර සංවර්ධන මූල්‍ය ආයතන විසින් පිරිනමනු ලබන අරමුදල් ප්‍රමාණය සහ අවශ්‍ය අරමුදල් අතර නොගැළපීමකට මුහුණ දෙයි. කුඩා පරිමාණ සංයුක්ත තිරසර ව්‍යාපාර වෙනුවෙන් මුදල් යෙදවීමට මූලික ආයෝජන සඳහා හිඩසක් පවතී. සංයුක්ත තිරසර ව්‍යාපාර විසින් බලපෑම් ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන බලපෑම් මැන බැලීම සිදු කරනු ලබන්නේ කලාතුරකිනි. ලාභ ලැබීම සඳහා තම කොටස් විකිණීමට සංවර්ධිත ද්විතියික වෙළඳපළ නොමැති වීම සහ ශ්‍රී ලංකාවෙන් ප්‍රාග්ධනය පිටතට ගැනීමට ඇති සීමාවන් හේතුවෙන් ද ආයෝජකයින් ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීමට ඇති නැඹුරුව ද අඩුය.

### 5.4.2 මූල්‍යකරණය හරහා සංයුක්ත තිරසර ව්‍යාපාර උත්ප්‍රේරණය කිරීම

සංයුක්ත තිරසර ව්‍යාපාරවල මෙහෙයුම් සහ බලපෑම ඉහළ නැංවීම සඳහා ඒවාට හිතකර ශක්තිමත් ආයෝජන සහ මූල්‍යනය සහිත පරිසරයක් අත්‍යවශ්‍ය වේ. එවැනි පරිසරයක් නිර්මාණය කිරීම සඳහා බහු පාර්ශ්වකරුවන්ගේ ප්‍රවේශයක් අවශ්‍ය වනු ඇත.

සංයුක්ත තිරසර ව්‍යාපාර දැනට පවතින මූල්‍යකරණ අවස්ථා සහ ආයෝජන උපකරණ (ස්කන්ධ, හරිත සහ සමාජ බැඳුම්කර, ස්ත්‍රී පුරුෂ භාවය ඇතුළත් මූල්‍ය නිෂ්පාදන, ප්‍රදාන, සමූහ අරමුදල් සැපයීම, කාබන් ණය, පිටස්තර විධිවිධාන මත ණය දීම ඇතුළුව) සහ දේශීය හා විදේශීය ආයෝජකයින් සමඟ සම්බන්ධ කිරීම සඳහා මාර්ග සිතියමක්



ඡායාරූපය iStock

සකස් කිරීම සහ සහ සංයුක්ත සහ තිරසර ව්‍යාපාර මුහුණ දෙන මූල්‍ය හිඩැස් පියවා ගැනීමට උපකාරී වන අතිරේක මූල්‍ය උපකරණ සහ රෙගුලාසි ගවේෂණය කිරීම සඳහා මාර්ග සිතියමක් සකස් කිරීමට මහ බැංකුව, කොළඹ කොටස් වෙළඳපොළ, කලාපීය සහ දේශීය බලපෑම් ආයෝජකයින්, සංයුක්ත තිරසර ව්‍යාපාර සහ දේශීය වාණිජ බැංකුවල සහභාගීත්වය ඇතිව මුදල් අමාත්‍යාංශය විසින් මෙහෙයවනු ලබන බහු පාර්ශ්වකරුවන්ගේ සාකච්ඡා අඛණ්ඩව කරගෙන යාම ඉතා වැදගත් වනු ඇත. මාර්ග සිතියම මගින් ශ්‍රී ලංකාවේ සංයුක්ත තිරසර ව්‍යාපාරවල සංවර්ධන මට්ටම සහ සංවර්ධන මූල්‍ය ආයතනවල වර්තමාන පිරිනැමීම, ප්‍රධාන ධාරා හා බලපෑම් ආයෝජකයින් සහ වාණිජ බැංකු මත පදනම්ව ඒවායේ විවිධ මූල්‍ය අවශ්‍යතා (ක්‍රමවේදය සහ මූලික ආයෝජනයේ ප්‍රමාණය අනුව) හඳුනා ගත යුතුය. පෞද්ගලික ආයෝජකයින්ගේ අවදානම් අඩු කරන රජයේ ඇපකර ලබා දීම සහ සමාජ කොටස් සහ බැඳුම්කර (social stock and bond) හුවමාරුව වැනි ද්‍රව්‍යශීලී ද්විතීයික වෙළෙඳපොළ සංවර්ධනය කිරීමට පියවර ගැනීම, පෞද්ගලික ආයෝජන සඳහා පෙළඹවීමට උපකාරී වේ.

වෙනස්වීම් රාමු පිළිබඳ න්‍යාය, අධීක්ෂණ සහ ඇගයීම් රාමු සංවර්ධනය කිරීම සහ (බලපෑම්) ආයෝජකයින්ගේ ඉල්ලීම් සපුරාලීම සඳහා අවශ්‍ය බලපෑම් වාර්තාකරණය සඳහා සංයුක්ත තිරසර ව්‍යාපාරවල ධාරිතාවන් ගොඩනැගීමට අධ්‍යයන හා වෘත්තීය ආයතන සහ ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන්ගේ සහයෝගීතාවය ඇතිව රජයට පුළුල් ව්‍යාපාරයක් මෙහෙයවිය හැකිය.

සාධාරණ පිරිවැයකින් මූල්‍යනය ලබා ගැනීමේ හැකියාව සීමා කරන අන්‍යය අභියෝග වලට සංයුක්ත තිරසර ව්‍යාපාර මුහුණ දෙයි.

සංයුක්ත තිරසර ව්‍යාපාරවල මෙහෙයුම් සහ බලපෑම වැඩිදියුණු කිරීම සඳහා ඒවාට හිතකර ශක්තිමත් ආයෝජන සහ මූල්‍යන පරිසරයක් අත්‍යවශ්‍ය වේ.

### 5.5 අතරමැදි සහ සහාය සංවිධාන

සංයුක්ත තිරසර ව්‍යාපාර අරමුදල් සැපයීමේ අවස්ථා සමඟ සම්බන්ධ කිරීම, බලපෑම් ආයෝජකයන් වෙත නිසි සේවාවන් සැපයීම, නියමිත කාලයට නිවැරදි බලපෑම් වාර්තාකරණය සිදු කරන බවට වගබලා ගැනීම, අවදානම් අවම වන බවට වගබලා ගැනීම සඳහා නීතිමය විශේෂඥතාව ලබා දීම සහ ලාභ ලැබීම සඳහා  තම කොටස් විකිණීමට ආයෝජකයන්ට අවස්ථා ලබා දීම සඳහා බලපෑම් ආයෝජනය, හරිත, සමාජීය සහ තිරසර මූල්‍ය උපකරණ පිළිබඳව මනා දැනුමක් ඇති ආයෝජන අතරමැදියන් සහිත පරිසරයක් අත්‍යවශ්‍ය වනු ඇත.

පහත දැක්වෙන්නේ උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළ හැකි ජාතික සහ විදේශීය අතරමැදියන් සහ සහාය සංවිධානවල සවිස්තරාත්මක නොවන ලැයිස්තුවකි.

#### ගෝලීය බහුපාර්ශික සංවිධාන

**International Finance Corporation** (ජාත්‍යන්තර මූල්‍ය සමාගම) මගින් සංවර්ධනය වෙමින් පවතින රටවල පෞද්ගලික ව්‍යවසාය ආයෝජනය සඳහා ණය සහ සෘජු ආයෝජන යන ක්‍රම දෙක හරහාම මුදල් සැපයීම සිදු කරනු ලැබේ. කොවිඩ්19 වසංගතයේ අහිතකර ආර්ථික බලපෑම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ශ්‍රී ලංකාවේ කුඩා  හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහාය වීම සඳහා  ජාත්‍යන්තර මූල්‍ය සමායතනය, කොමර්ෂල් බැංකුව සමඟ එක්ව ඩොලර් මිලියන 50 ක ණයක් ලබා දී ඇත.

**ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO)** සමාජ සාධාරණත්වය සහ යහපත් වැඩ පරිසරයක් ප්‍රවර්ධනය කරන අතර ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් සහ ප්‍රතිපත්ති හැඩගැස්වීමේ දී සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කරයි. ජාත්‍යන්තර කම්කරු සංවිධානය, සිලෝන් බිස්කට් සමාගම සහ ඇල්ලි ෆුඩ් පුද්ගලික සමාගම සමඟ එක්ව දේශීය ප්‍රජාවන්ට, විශේෂයෙන් කාන්තාවන්ට රැකියා සහ ආදායම් උත්පාදනය කිරීම සඳහා බඩ ඉරිඟු සහ උඳු යන නව වටිනාකම් දාම දෙක පිළිබඳ ගවේෂණය කර ඇත.

තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ ප්‍රයත්නයේ කොටසක් ලෙස **එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)**, මානව හිමිකම් සහ වැදගත් ව්‍යාපාරික භාවිතාවන් ප්‍රවර්ධනය කරයි. වටිනාකම් මත පදනම් වූ වෙළඳාම සහ ආයෝජනය දිරිමත් කරමින්, ව්‍යාපාර සහ මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මෙහෙයුම් මූලධර්ම අනුගමනය කිරීමට එය රජයන්ට සහ සමාගම් වලට සහාය වේ.

**International Fund for Agricultural Development (කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල)** ග්‍රාමීය දරිද්‍රතාවය තුරන් කිරීම සහ තිරසර කෘෂිකාර්මික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. එහි කුඩා වතු හිමියන්ගේ කෘෂි ව්‍යාපාර හවුල්කාරිත්ව වැඩසටහන මගින් තිරසර භාවිතාවන් සහතික කරමින්, කෘෂිකර්මාන්තයේ

නියැලෙන්නන්ගේ ජීවනෝපාය සහ ව්‍යාපාරික අපේක්ෂාවන් ඉහළ නැංවීම මඟින් කුඩා වතු හිමියන්ගේ පවුල් 57,500 ක ආදායම් වැඩි කිරීමට සහ ආහාරවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට උත්සාහ කරයි.

**Food and Agriculture Organization of the United Nations (එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය)** ආහාර සුරක්ෂිතතාව, කෘෂිකර්මාන්තය, ග්‍රාමීය සංවර්ධනය සහ තිරසර ස්වභාවික සම්පත් කළමනාකරණය සම්බන්ධ ගැටළු සම්බන්ධයෙන් කටයුතු කරයි. එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය සහ යුරෝපා සංගමය එක්ව අපනයනය අරමුණු කරගත් කොළ පිපිඤ්ඤා සහ මඤ්ඤොක්කා වගා වැඩසටහනක් සහ අන්නාසි නිෂ්පාදන වැඩසටහනක් සඳහා අම්පාර දිස්ත්‍රික්කයේ ගොවි කණ්ඩායම් සහ Hayleys Agriculture Holdings හි සීමාසහිත Sunfrost පුද්ගලික සමාගම අතර වන වගා ගිවිසුම් දෙකක් සඳහා පහසුකම් සපයන ලදී.

**ලෝක බැංකුව** යනු සංවර්ධනය වෙමින් පවතින රටවලට යටිතල පහසුකම්, සමාජ සේවා සහ ආර්ථික වර්ධනයට අදාළ සංවර්ධන ව්‍යාපෘති සඳහා මූල්‍ය හා තාක්ෂණික සහාය ලබා දෙන ජාත්‍යන්තර මූල්‍ය ආයතනයකි. අත්‍යාවශ්‍ය ආහාර සහ වෛද්‍ය සැපයුම් ආනයනය කිරීමට පහසුකම් සැපයීම සඳහා ලෝක බැංකුව ජාත්‍යන්තර මූල්‍ය සමායතනය හරහා පෞද්ගලික බැංකු තුනකට ඩොලර් මිලියන 400 ක ණයක් ලබා දී ඇත.

**United Nations Global Compact Network (එක්සත් ජාතීන්ගේ ගෝලීය සංයුක්ත ජාලය)** යනු මානව හිමිකම්, ශ්‍රමය, පරිසරය සහ දූෂණ විරෝධී යන අංශවල විශ්වීයව පිළිගත් මූලධර්ම 10 ක් සමඟ තම කටයුතු සහ උපාය මාර්ග ගැළපීම වෙනුවෙන් කැපවී සිටින ව්‍යාපාර සඳහා වන ස්වේච්ඡා මූලපිරීමකි. එහි තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම වේගවත් කරන වැඩසටහන දේශගුණයට අදාළ ක්‍රියාමාර්ග, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, ව්‍යාපාර හා මානව හිමිකම් සහ තිරසර සැපයුම් දාමයන් ආදියට අදාළ ඉලක්ක කෙරෙහි සමාගම්වල කැපවීම තහවුරු කිරීම සඳහා වන මාස නවයක වැඩසටහනකි.

### කලාපීය බහුපාර්ශික සංවිධාන

ආසියානු සංවර්ධන බැංකුව ආසියා සහ පැසිෆික් කලාපයේ ආර්ථික හා සමාජීය සංවර්ධනයට සහාය වේ. එය ශ්‍රී ලංකාවේ ආහාර වටිනාකම් දාමය වැඩිදියුණු කිරීම, ආර්ථික වර්ධනය ඇති කිරීම සහ රැකියා අවස්ථා උත්පාදනය කිරීම සඳහා ජෝන් කීල්ස් හෝල්ඩින්ග්ස් පීඑල්සී වෙත ඩොලර් මිලියන 80 ක් දක්වා වන ආයෝජනයක් ලබා දී ඇත.

**Asian Infrastructure Investment Bank (ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව)** යනු බහුපාර්ශික සංවර්ධන බැංකුවක් ලෙස ක්‍රියාත්මක වීමට ඇති කරන ලද අන්තර් රාජ්‍ය කලාපීය සංවර්ධන ආයතනයකි. බැංකුව ගනුදෙනුකරුවන්ට හෙට දවස සඳහා යටිතල පහසුකම්, තිරසරභාවය, නවෝත්පාදනය සහ සම්බන්ධතාවය සහිත හරිත යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ එම සාර්ථකත්වය සමාජය සමඟ බෙදා ගැනීම සඳහා ඉඩ සලසයි. එය මෙම කාර්යය ඉටු කරන්නේ මෙම දැක්ම මල්එල ගැන්වෙන මූල්‍ය පහසුකම් සැපයීමෙනි.

**යුරෝපීය ආයෝජන බැංකුව** ලොව විශාලතම බහුපාර්ශ්වික ණයහිමියා වන අතර 2001 සිට ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන ආයෝජන ව්‍යාපෘති සඳහා සක්‍රීයව සහාය දක්වා ඇත. මෙම බැංකුව දේශගුණික ක්‍රියාමාර්ග සඳහා ලොව ප්‍රධාන මූල්‍ය සම්පාදකයන්ගෙන් කෙනෙක් වන අතර හරිත ව්‍යාපෘති සඳහා මූල්‍යනය සහ හරිත බැඳුම්කරවල ආයෝජනය කිරීමට තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය මෙම බැංකුව සමග සාකච්ඡා සිදු කරමින් පවතී.

### ද්විපාර්ශවික දායක /සංවර්ධන නියෝජිතායතන

**ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද නියෝජිතායතනය** (USAID) යනු දරිද්‍රතාවය අඩු කිරීම, ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීම සහ හවුල්කාර රටවල තිරසර සංවර්ධනයට සහාය වීම අරමුණු කරගත් විදේශ ආධාර සහ සංවර්ධන සහාය සැපයීම කෙරෙහි අවධානය යොමු කරන එක්සත් ජනපද රජයේ නියෝජිතායතනයකි. ශ්‍රී ලංකාවේ සැලකිය යුතු වර්ධන හැකියාවක් ඇති අංශවල ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා උසස් තත්ත්වයේ මූල්‍යකරණය සහ ව්‍යාපාරික සේවා ලබා ගැනීමේ හැකියාව වැඩි දියුණු කිරීම මඟින් ආර්ථිකයේ ස්ථාවර වර්ධනයක් ඇති කිරීම CATALYZE පුද්ගලික අංශ සංවර්ධන වැඩසටහනේ අරමුණ වේ.

**GIZ** යනු තිරසර සංවර්ධනය සහ අධ්‍යාපනය සඳහා වන ජාත්‍යන්තර සහයෝගීතා ක්ෂේත්‍රයේ සේවා සපයන්නෙකි. ඔවුන්ගේ කාර්යයන් අතර ආර්ථික සංවර්ධනය සහ රැකියා ප්‍රවර්ධනය, බලශක්තිය හා පරිසරය සහ සාමය හා ආරක්ෂාව ඇතුළත් වේ. ශ්‍රී ලංකාවේ කාබනික කෘෂිකර්ම අංශයේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහාය වීමේ ව්‍යාපෘතියක් යටතේ, GIZ" Lanka Good Market (Guarantee) Ltd සමාගම සමඟ එක්ව ගොවි ප්‍රජාවන්ට තම අත්දැකීම් සහ උගත් පාඩම් බෙදා ගැනීමට වේදිකාවක් ලබා දී කාබනික කෘෂිකර්ම අංශය පිළිබඳ එහි නියැලෙන්නෙකු වෙතින් වන වටිනා මතයක් නිර්මාණය කර ඇත.

ආහාර, සෞඛ්‍ය සහ ආරක්ෂණ සහාය ඇතුළු ආර්ථික අර්බුදයට ප්‍රතිචාර වශයෙන් මානුෂීය ආධාර සැපයීම; ආර්ථික වර්ධනය සඳහා ප්‍රතිසංස්කරණ ප්‍රවර්ධනය කිරීම; වරප්‍රසාද නොලත් ශ්‍රී ලාංකිකයන් සඳහා රැකියා අවස්ථා සහ ජීවනෝපායන් වැඩිදියුණු කිරීම; සහ ඕස්ට්‍රේලියානු සම්මාන ශිෂ්‍යත්ව හරහා අධ්‍යාපනය සහ පුහුණුව සඳහා සහාය වීම ශ්‍රී ලංකාවේ **Australian Agency for International Development (ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඕස්ට්‍රේලියානු නියෝජිතායතනයේ)** අරමුණු වේ.

**ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය** (JICA) ශ්‍රී ලංකාව වෙත 1954 සිට තාක්ෂණික සහයෝගිතා ව්‍යාපෘති සහ 1977 සිට සහනදායී නිල සංවර්ධන ණය ආධාර ලබා

දී ඇත. එතැන් පටන්, ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය පුළුල් පරාසයක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට අඛණ්ඩව සහාය දක්වයි. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතා ක්ෂේත්‍ර තුනක් කෙරෙහි ජපාන ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය අවධානය යොමු කරයි: ගුණාත්මක වර්ධනය ප්‍රවර්ධනය කිරීම, සංයුක්ත වර්ධනය සඳහා සංවර්ධන සහයෝගීතාව සහ අනතුරට භාජනය විය හැකි බව අවම කිරීම. මෙම මුලපිරීම් ශ්‍රී ලංකාවේ තිරසර සංවර්ධනයට දායක වන අතර ජපානය සහ ශ්‍රී ලංකාව අතර ශක්තිමත් සබඳතා වර්ධනය කරයි.

**කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (KOICA)** 1995 සිට ශ්‍රී ලංකාවේ සංවර්ධන සහයෝගීතාව සඳහා වේදිකාවක් සහ ප්‍රධාන හවුල්කරුවෙකු ලෙස කටයුතු කර ඇත. ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතා ආයතන සමඟ හවුල්කාරිත්වයන්, ලෝක මිතුරු ස්වේච්ඡා වැඩසටහන් (World Friends Volunteers Programmes), ධාරිතා වර්ධන වැඩසටහන්, බහුපාර්ශ්වික සහයෝගීතාව, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය, අධ්‍යාපනය, ප්‍රවාහනය, ජල කළමනාකරණය, සනීපාරක්ෂාව සහ ග්‍රාමීය සංවර්ධනය යන ප්‍රමුඛ සහයෝගීතා ක්ෂේත්‍රවල හදිසි ප්‍රතිචාර දැක්වීම ඇතුළු සහයෝගීතා වැඩසටහන් මෙම කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරනු ලැබේ.

### දේශීය රාජ්‍ය නොවන සංවිධාන සහ අනෙකුත් සංවිධාන

**Chrysalis** යනු පෞද්ගලික සහ රාජ්‍ය යන අංශ දෙක සමඟම කටයුතු කිරීමෙන් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහතික කිරීම සහ විවිධත්වය පිළිගන්නා පරිසරයක් නිර්මාණය කිරීම සඳහා කාන්තා හා තරුණ ප්‍රජාව සවිබලගන්වන රාජ්‍ය නොවන සංවිධානයකි. එය සේවා ස්ථාන විවිධත්වය සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය වැඩිදියුණු කිරීම සඳහා පෞද්ගලික අංශය සමඟ කටයුතු කරන අතර අවශ්‍ය ප්‍රතිපත්ති සහ රෙගුලාසි සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රජයේ අමාත්‍යාංශ සමඟ කටයුතු කරයි. එය ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය, සාමකාමී ප්‍රජාවන් ගොඩනැගීම සහ හදිසි අවස්ථා සඳහා වන සූදානම යන කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අනෙකුත් පාර්ශවකරුවන් සම්බන්ධ කර ගනී.

**Centre for Child Rights and Business (ළමා අයිතිවාසිකම් සහ ව්‍යාපාර සඳහා වන මධ්‍යස්ථානය)** යනු ව්‍යාපාර සැපයුම් දාමයන්ගෙන් පීඩාවට පත් දරුවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල ජීවන තත්ත්වය නගා සිටුවීමට සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම සහ සේවා ස්ථානය සහ පවුල සමබර කර ගැනීමට ඉඩ සළසන සේවා ස්ථාන සහ සේවාවන් ආදිය නිර්මාණය කිරීම මඟින් වගකිව යුතු ව්‍යාපාර ගොඩනැගීම සඳහා කැප වූ ලාභ නොලබන සංවිධානයකි. මෙම මධ්‍යස්ථානය Save the Children Sri Lanka සහ English Tea Shop සමඟ එක්ව දරුවන් සිටින සේවකයින්ට සිය දරුවන්ගේ යහපැවැත්ම සඳහා ආයෝජනය කිරීමට සහාය වීම සඳහා ළමා ප්‍රතිලාභ දීමනා/දිරි දීමනා හඳුන්වා දෙමින්, පුරෝගාමී ළමා ප්‍රතිලාභ නියමු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කරයි.

**සර්වෝදය ශ්‍රමදාන ව්‍යාපාරය** යනු සමාජීය, ආර්ථික සහ සංස්කෘතික අභියෝග වලට මුහුණ දෙන ප්‍රජා සංවර්ධන සංවිධානයකි. ශ්‍රී ලංකාවේ පළාත් පහක කාන්තා ව්‍යවසායකයින් සවිබල ගැන්වීම සඳහා ඔවුන්ට අනන්‍ය වූ අභියෝග වලට මුහුණ දීම සහ ව්‍යාපාර වර්ධනය සඳහා හිතකර පරිසරයක් ඇති කිරීමට ශ්‍රී ලංකා රුපියල් මිලියන 40 ක ආයෝජනයක් සහිත වසර දෙකක මූලාරම්භයක් සඳහා HSBC ශ්‍රී ලංකා සහ ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමය සහයෝගයෙන් කටයුතු කරයි.

**Palladium International, LLC** යනු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ගෝලීය සංවර්ධන උපදේශක සමාගමක් වන අතර එය බලපෑම් මත පදනම් වූ ව්‍යාපාර වලට සිය බලපෑම වැඩි කිරීමට අවශ්‍ය අරමුදල්, තාක්ෂණික හැකියාවන් සහ වෙළඳපොළ වෙත ප්‍රවේශ වීමට සහාය වීම ඇතුළුව ලෝකයේ වඩාත්ම තීරණාත්මක අභියෝග විසඳීම සඳහා රජයන්, ව්‍යාපාර සහ ආයෝජකයින් සමඟ කටයුතු කරයි. Palladium හි ශ්‍රී ලංකා වේ ඒකකය, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ බලපෑම් මත පදනම් වූ ව්‍යාපාර ඉලක්ක කරගත් ප්‍රදාන ඇතුළු ප්‍රදානවල පරිපාලකයෙකු ලෙසද කටයුතු කරයි.

**Good Life X** සදාචාරාත්මක සහ තිරසර ව්‍යාපාරික සංකල්ප ප්‍රවර්ධනය කරන අතර සමාජීය හෝ පාරිසරික අවධානයක් සහිත ව්‍යවසායන් සඳහා නොමිලේ සම්පත් ලබා දීම, ව්‍යාපාර සංවර්ධනය, අරමුදල් සැපයීම සහ හවුල්කාරිත්ව සේවා පිරිනැමීම සිදු කරයි. එය ශ්‍රී ලංකාවේ සහ ආසියාවේ නව ව්‍යාපාර සහ දැනට ස්ථාපිත සමාගම්වලට විශේෂයෙන් ආහාර, කෘෂිකර්මාන්තය, සුවතාවය, සංචාරක, තාක්ෂණය සහ පුනර්ජනනීය බලශක්තිය වැනි අංශවල සිය නිෂ්පාදන ගෝලීය වශයෙන් ප්‍රලිත කිරීමට සහාය වේ. එහි THRIVE Business Model Canvas, සමාගම් වලට සිය ව්‍යාපාර නිෂ්කර්ශක ආකෘතිවල සිට පුනර්ජනක ආකෘති දක්වා (නැවත) සැලසුම් කිරීමට සහ පරිවර්තනය කිරීමට උපකාරී වේ. එය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට මෙන්ම විශාල සමාගම් වලට ද භාවිතා කළ හැකි බහුකාර්ය මෙවලමකි.

කොළඹ පිහිටි Hatch යනු සමාජීය හා පාරිසරික බලපෑම් කෙරෙහි දැඩි අවධානයක් යොමු කරන අලුතින් ආරම්භ කරන ව්‍යාපාරවල වර්ධනය සහ සාර්ථකත්වය සඳහා සම්පත්, උපදෙස් සහ සහාය ලබා දෙන වේදිකාවකි.

**Lanka Impact Investing Network (LIIN)** සමාජීය හා පාරිසරික ගැටළු විසඳීම සඳහා පුද්ගලික ප්‍රාග්ධනය යොමු කරයි. බලපෑම් ආයෝජන අරමුදල් සහ දේශීය ව්‍යවසායකයින්ට අත්‍යාවශ්‍ය ව්‍යාපාර සංවර්ධන ආධාර සැපයීම හරහා LIIN සමාජ ව්‍යවසායන් සඳහා ක්‍රියාකාරීව සහාය දක්වයි. සමාජ ව්‍යවසායකයින් සහ ආයෝජකයින් සම්බන්ධ කරන පළමු රියැලිටි රූපවාහිනී වැඩසටහන වන ඇත් පවුරෙහි සම හිමිකරු සහ නැගී එන කාන්තා සමුළුවේ සංවිධායක ලෙස LIIN සමාජ ව්‍යවසායකත්වයේ සහ බලපෑම් ආයෝජනයෙහි කාන්තා නායකත්වය ප්‍රවර්ධනය කරයි.

**Lanka Social Ventures** යනු සමාජීය වෙනසක් සහ පාරිසරික තිරසරභාවය සඳහා ව්‍යවසායකත්වයට සහ නවෝත්පාදනයට සහාය වන සමාජ ව්‍යවසායකි. එමඟින් ව්‍යාපාර සඳහා මඟ පෙන්වීම, අධීක්ෂණය, පුහුණුව, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන, තරඟ සහ දැනුවත් කිරීමේ චාරිකා සම්බන්ධීකරණය කරන අතර ව්‍යවසායකයින්, ප්‍රජා සංවිධාන සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා අරමුදල් රැස් කිරීම සහ සම්පත්, උපදෙස් සහ සහාය ලබාදෙන සේවාවන් සැපයීම සිදු කෙරේ.

**SLYCAN Trust** යනු ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ තරුණයින් සවිබලගැන්වීම ඇතුළු දේශගුණික විපර්යාස, තිරසර සංවර්ධනය, ජෛව විවිධත්වය සහ පරිසර පද්ධති සංරක්ෂණය, සත්ත්ව සුභසාධනය සහ සමාජ සාධාරණත්වය යන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කටයුතු කරන ලාභ නොලැබීම සඳහා වන බුද්ධි මණ්ඩලයකි. එහි කාර්යයන් ප්‍රතිපත්ති විශ්ලේෂණය සහ සාක්ෂි පදනම් කරගත් පර්යේෂණවල සිට ප්‍රායෝගිකව සැලැස්මක් ක්‍රියාත්මක කිරීම දක්වා ජාතික, කලාපීය සහ ගෝලීය මට්ටමින් විහිදේ.

**CLIMAFUGE** හි අරමුණ වන්නේ ආසියාව, අප්‍රිකාව සහ යුරෝපය තුළ විලාසිතා, ආහාර පද්ධති, සංචාරක ව්‍යාපාරය සහ අපද්‍රව්‍යය කළමනාකරණය යන ක්ෂේත්‍රවල නව්‍ය ආයෝජන සහ සංයුක්ත හවුල්කාරිත්ව ආකෘති ඇතුළුව සදාචාරාත්මක, තිරසර සහ දේශගුණික හිතකාමී විසඳුම් ලබා දීමෙන් ව්‍යාපාර පරිවර්තනය කිරීමයි. අද වන විට, **CLIMAFUGE** ශ්‍රී ලංකාවේ තිරසර හා සදාචාරාත්මක විලාසිතා ව්‍යවසායන් කණ්ඩායම් දෙකකට වර්ධනය සඳහා සහාය ලබා දී ඇත.

# යොමුව


ADB (Asian Development Bank) (2023). *Asian Development Outlook September 2023*. Available at www.adb.org/sites/default/files/publication/908126/south-asia-ado-september-2023.pdf.

Alawattegama, K.K. (2020). Free Education Policy and its Emerging Challenges in Sri Lanka. *European Journal of Educational Sciences*, vol. 7, No. 1 (March).

Aneez, S. (2023). *Crisis-hit Sri Lanka's brain drain hits ICT sector's workforce; requires 100,000 more – official*. Economy Next. 6 October. Available at https://economynext.com/crisis-hit-sri-lankas-brain-drain-hits-ict-sectors-workforce-requires-100000-more-official-134150/.

Aneja, U., A. Shridhar and Z. Mawii (2020). *Platformization of the tourism sector in Sri Lanka: Impacts on labour market and decent work opportunities*. Colombo: ILO Country Office for Sri Lanka and the Maldives. Available at www.ilo.org/wcmsp5/groups/public/---asia/---ro-bangkok/documents/publication/wcms_755007.pdf.

Ashutosh, D., and D. Roshan (2023). *Sustainable Tourism Market Size, Share, Growth, Forecast 2032*. Allied Market Research. Available at www.alliedmarketresearch.com/sustainable-tourism-market-A06549.

Asian Development Bank (2019). *Growing Old Before Becoming Rich: Challenges of an Aging Population in Sri Lanka*. Available at https://dx.doi.org/10.22617/TCS190612-2.

Balogh, A. (2021, December 13). *The rise and fall of monoculture farming. European Commission*. Available at https://ec.europa.eu/research-and-innovation/en/horizon-magazine/rise-and-fall-monoculture-farming.

Central Bank of Sri Lanka (2023). *Annual Report of the Monetary Board 2022* (Vol. I). Available at www.cbsl.gov.lk/en/publications/economic-and-financial-reports/annual-reports/annual-report-2022.

Central Bank of Sri Lanka (2023). *IMF Executive Board Approves US$3 Billion Under the Extended Fund Facility (EFF) Arrangement for Sri Lanka*. Available at www.cbsl.gov.lk/en/news/imf-fund-facility.

Ceylon Electricity Board (n.d.). *Statistical Digest 2022*. Available at www.ceb.lk/front_img/img_reports/1687251830Statistical_Digest_2022.pdf

Ceylon Today (2023, August 23). *Halt exodus of medical professionals before it's too late!* Available at https://ceylontoday.lk/2023/08/23/halt-exodus-of-medical-professionals-before-its-too-late/.

Cole, C. (2020, August 19). *Marine Plastic Pollution: Opportunities for Sri Lanka - The Lakshman Kadirgamar Institute*. Lakshman Kadirgamar Institute, Sri Lanka. Available at https://lki.lk/blog/marine-plastic-pollution-opportunities-for-sri-lanka/.

Daily FT (2023). *Cabinet approves transaction advisors for sale of 7 SOEs*. Available at www.ft.lk/front-page/Cabinet-approves-transaction-advisors-for-sale-of-7-SOEs/44-750489.

Daokui Li, D., and E.S. Maskin (2021). Government and economics: An emerging field of study. *Journal of Government and Economics*, vol. 1, No. 100005 (Spring).

Department of Census and Statistics (2022). *Labour Force Survey Annual Report 2021*. Colombo: Government of Sri Lanka. Available at www.statistics.gov.lk/LabourForce/StaticalInformation/AnnualReports/2021.

De Zoysa, M. (2022). Ecotourism Development and Biodiversity Conservation in Sri Lanka: Objectives, Conflicts and Resolutions. *Open Journal of Ecology*, vol. 12, No. 10, pp. 638–666.

Eckstein, D., V. Künzel and L. Schäfer (2021). *Global Climate Risk Index ...: Who suffers most from extreme weather events? Weather-related loss events 2019 and 2000-2019*. 2021. Germanwatch e.V. Available at https://reliefweb.int/attachments/b6a6928e-214a-3398-bc01-1460f32bb3ad/Global%20Climate%20Risk%20Index%202021_1.pdf.

Eckstein, D., M. Winges, V. Künzel and L. Schäfer (2019). *Global Climate Risk Index 2020: Who Suffers Most from Extreme Weather Events? Wether-Related Loss Events in 2018 and 1999 to 2018*. Germanwatch Nord-Süd Initiative e.V. Available at https://reliefweb.int/attachments/46420ec0-d583-3531-a48e-2b9bfced2586/20-2-01e%20Global%20Climate%20Risk%20Index%202020_10.pdf.

Economist (2023). *Middle-class Sri Lankans are fleeing their country*. Available at www.economist.com/asia/2023/03/30/middle-class-sri-lankans-are-fleeing-their-country.

Economynext (2023). *Sri Lanka to invest US$11bn by 2030 to meet renewable target*. Available at https://economynext.com/sri-lanka-to-invest-us11bn-by-2030-to-meet-renewable-target-125645/.

EDB (Export Development Board, Sri Lanka) (2022a). *Industry Capability Report: Sri Lankan Apparel Sector*. Available at www.srilankabusiness.com/ebooks/industry-capability-report-apparel-2021.pdf.

EDB (Export Development Board, Sri Lanka) (2022b). *Industry Capability Report: Tea Sector*. Available at www.srilankabusiness.com/ebooks/industry-capability-report-tea-2021.pdf.

EFL (Environmental Foundation (Guarantee) Limited) (2017, June 14). *Status of Waste Management in Sri Lanka*. Available at https://efl.lk/status-waste-management-sri-lanka/.

Freeman, E., and J. Burton (2018). *Governments as Facilitators of Value Creation*. MIT Sloan Management Review. Available at https://sloanreview.mit.edu/article/governments-as-facilitators-of-value-creation/.

GIIN (Global Impact Investing Network) and Dalberg (2015). *The Landscape for Impact Investing in South Asia: Understanding the current status, trends, opportunities, and challenges in Bangladesh, India, Myanmar, Nepal, Pakistan, and Sri Lanka*. Available at https://thegiin.org/assets/documents/pub/South%20Asia%20Landscape%20Study%202015/1_Full%20South%20Asia%20Report.pdf.

Government of Sri Lanka (2022). *Sri Lanka Climate Prosperity Plan (Preliminary Report)*. Available at https://unfccc.int/sites/default/files/resource/SriLanka_LTLEDS.pdf.

Gunatilaka, R., and S. Chandrasiri (2022). *Gender Disparities and Labour Market Challenges: The Demand for Women Workers in Sri Lanka*. UN Women. Available at https://asiapacific.unwomen.org/sites/default/files/2022-03/lk-Gender-Disparities-and-Labour-Market-Challenges_Full-Report.pdf.

Gunawardana, K. (2017). Women Participation in Senior Management Positions in Licensed Commercial Banks in Sri Lanka. SSRN (14 March). Available at https://dx.doi.org/10.2139/ssrn.2932679.

Gunawardana, S.J. (2018). *Rural Sri Lankan Women in Agriculture: Participation and recognition in sustainable agricultural livelihoods across their life course*. Melbourne, Australia: Oxfam Monash Partnership. Available at www.monash.edu/__data/assets/pdf_file/0008/2482802/rural-sri-lankan-women-in-agriculture-full-report.pdf.

Hand, D., B. Ringel and A. Danel (2022). *Sizing the Impact Investing Market: 2022*. New York: Global Impact Investing Network (GIIN). Available at https://thegiin.org/assets/2022-Market%20Sizing%20Report-Final.pdf.

IFC (International Finance Corporation) (n.d.). *Impact Investing*. Available at www.ifc.org/en/our-impact/impact-investing-at-ifc.

ILO (International Labour Organization) (2018). *Future of Work for Tea Smallholders in Sri Lanka*. Colombo: ILO Country Office for Sri Lanka and the Maldives. Available at www.ilo.org/wcmsp5/groups/public/---asia/---ro-bangkok/---ilo-colombo/documents/publication/wcms_654641.pdf.

ILO (International Labour Organization) (2018). *All-female cooperative brings women farmers to the fore in Sri Lanka*. 22 March. Available at www.ilo.org/colombo/info/pub/features/WCMS_634688/lang--en/index.htm.

ILO (International Labour Organization) (2019). *Sri Lankan women improve their livelihoods through cooperatives in the groundnut value chain*. 28 November. Available at www.ilo.org/global/topics/cooperatives/news/WCMS_730976/lang--en/index.htm.

ILO (International Labour Organization) (2020). *ILO supports the creation of market links through cooperatives in agriculture in Northern Sri Lanka*. 10 December. Available at www.ilo.org/global/topics/cooperatives/news/WCMS_763789/lang--en/index.htm.

IMF (International Monetary Fund, Asia and Pacific Dept) (2023). *Sri Lanka: Request for an Extended Arrangement Under the Extended Fund Facility-Press Release; Staff Report; and Statement by the Executive Director for Sri Lanka*. Available at https://doi.org/10.5089/9798400238987.002.

IPS (Institute of Policies Studies of Sri Lanka) (2019). 4IR and Women in the Workforce: Sri Lanka's Apparel Industry. In *Sri Lanka: State of the Economy 2019*. Available at www.ips.lk/wp-content/uploads/2019/11/Policy-insights-Chap-14.pdf.

IPS (Institute of Policy Studies of Sri Lanka) (2017). *Sri Lanka: State of the Economy 2017*. Available at www.ips.lk/publication-title-sri-lanka-state-economy-2017/#.

Lanka Social Ventures and Social Enterprise UK (2018). *The State of Social Enterprises in Sri Lanka*. Colombo: The British Council in Sri Lanka. Available at https://artnet.unescap.org/sti/publications/books-reports/state-social-enterprises-sri-lanka.

Laryea, G. (2022, August 25). *Devastating crisis for children in Sri Lanka is a cautionary tale for South Asia*. UNICEF. Available at www.unicef.org/rosa/press-releases/devastating-crisis-children-sri-lanka-cautionary-tale-south-asia.

Lorenzo, R., N. Voigt, M. Tsusaka and M. Krentz (2018). *How Diverse Leadership Teams Boost Innovation*. Boston Consulting Group. Available at www.bcg.com/publications/2018/how-diverse-leadership-teams-boost-innovation.

Mahindapala, K.G.J.P., M.W.A.P. Jayathilaka and L.N.A.C. Jayawardana (2020). Role of Agriculture Cooperatives as a Farmer-Based Organization in Sri Lanka: A Case Study in Morawak Korale Tea Producers' Cooperative Society. In *International Research Conference of UWU-2020*. Sri Lanka: Uva Wellassa University. Available at www.erepo.lib.uwu.ac.lk/handle/123456789/5644.

Market Research Future (2023). *Sustainable Fabrics Market to Expand at a CAGR of 12.50% By 2030 – Report by Market Research Future (MRFR)*. GlobeNewswire. Available at www.globenewswire.com/en/news-release/2023/05/02/2659434/0/en/Sustainable-Fabrics-Market-to-Expand-at-a-CAGR-of-12-50-By-2030-Report-by-Market-Research-Future-MRFR.html.

Mendis, K. (2013). Higher Education and Labourforce Participation of Sri Lankan Females. Available at www.researchgate.net/publication/335003753_Higher_Education_and_labourforce_Participation_of_Sri_Lankan_Females.

Ministry of Agriculture (n.d.). *Sri Lanka - Agriculture Sector Modernization Project*. Available at www.agrimin.gov.lk/web/index.php/home-1/12-project/841-agriculture-sector-modernization-project.

Ministry of Environment (2021). *Sri Lanka Updated Nationally Determined Contributions*. Available at https://unfccc.int/sites/default/files/NDC/2022-06/Amendmend%20to%20the%20Updated%20Nationally%20Determined%20Contributions%20of%20Sri%20Lanka.pdf.

Ministry of Environment (2022). *Third National Communication of Climate Change in Sri Lanka*. Available at https://unfccc.int/sites/default/files/resource/Third%20National%20Communication%20of%20Sri%20Lanka.pdf.

Ministry of Women, Child Affairs and Social Empowerment (2023). *National Policy on Gender Equality and Women's Empowerment. Colombo: Government of Sri Lanka*. Available at https://srilanka.unfpa.org/sites/default/files/pub-pdf/sri_lanka_national_policy_gewe_english.pdf.

National Planning Department (2023). *A Robust National Planning Framework for Sri Lanka*. Colombo: Government of Sri Lanka. https://www.npd.gov.lk/images/files/2023/A_Robust_National_Planning_Framework_for_Sri_Lanka_Main_8Jun.pdf

OHCHR (Office of the High Commissioner for Human Rights) (2021). *End of Mission Statement by the Special Rapporteur on contemporary forms of slavery, including its causes and consequences on his country visit to Sri Lanka, 26 November–3 December 2021*. Available at www.ohchr.org/en/statements/2022/01/end-mission-statement-special-rapporteur-contemporary-forms-slavery-including?LangID=E&NewsID=27895.

PEC (Presidential Expert Committee) (2019). *Sustainable Sri Lanka 2030 Vision and Strategic Path*. Government of Sri Lanka. Available at www.presidentsoffice.gov.lk/wp-content/uploads/2019/05/Final-v2.4-Typeset-MM-v12F-Cov3.pdf.

PwC (2023). *Sri Lanka IT-BPM Industry: State of the Industry 2019/20*. Sri Lanka Association for Software Services Companies (SLASSCOM). Available at https://slasscom.lk/wp-content/uploads/2021/06/State-of-the-industry-report.pdf

Ramasamy, R. (2020). Governance and administration in Sri Lanka: trends, tensions, and prospects. *Public Administration and Policy: An Asia-Pacific Journal*, vol. 23, No. 2, pp. 187–198. Available at https://doi.org/10.1108/PAP-03-2020-0020.

Sachs, J.D., C. Kroll, G. Lafortune, G. Fuller and F. Woelm (2022). *Sustainable Development Report 2022*. Cambridge University Press.

Samaraweera, R. (2021). *talkingeconomics - Forest Restoration: Where Does Sri Lanka Stand?* Institute of policy studies Sri Lanka. Available at www.ips.lk/talkingeconomics/2021/03/22/forest-restoration-where-does-sri-lanka-stand/.

Samuel, R., and A. Danise (2023). *On-Demand Production is the Sustainable Future of Fashion and Textiles*. Forbes. Available at www.forbes.com/sites/forbesbusinesscouncil/2023/01/17/on-demand-production-is-the-sustainable-future-of-fashion-and-textiles/.

SLYCAN Trust (n.d.). *Building Resilience of Women in Agriculture*. Available at www.slycantrust.org/blog-posts-knowledge/building-resilience-of-women-in-agriculture.

Stiglitz, J.E. (2021). The proper role of government in the market economy: The case of the post-COVID recovery. *Journal of Government and Economics*, vol. 1, No. 100004. Available at https://doi.org/10.1016/j.jge.2021.100004.

Thisera, M.S.D., and D. Wasantha (2023). *Sri Lanka: Workers employed abroad experience labour rights abuse, incl. in Italy, Canada and Oman*. Business and Human Rights Resource Centre. Available at www.business-humanrights.org/en/latest-news/sri-lanka-workers-employed-abroad-experience-labour-rights-abuse-incl-in-italy-canada-oman/.

UNDP (United Nations Development Programme) (2022). *Human Development Report 2021/2022: Uncertain Times, Unsettled Lives: Shaping our Future in a Transforming World*. Available at https://hdr.undp.org/system/files/documents/global-report-document/hdr2021-22pdf_1.pdf.

UNICEF (United Nations Children's Fund) (2023). *Sri Lanka Economic Crisis 2023 Situation Report No.1*. Available at https://reliefweb.int/report/sri-lanka/unicef-sri-lanka-humanitarian-situation-report-no-1-economic-crisis-january-june-2023?gclid=Cj0KCQjwm66pBhDQARIsALIR2zDSejtBB5s0Nwx0dXSP1JMezmVq8v1f-k00ezzIH3X2KNwmMRyHQ9EaAvJpEALw_wcB.

United Nations Environment Programme, Nairobi (2021). *Food Waste Index Report 2021*. Available at www.unep.org/resources/report/unep-food-waste-index-report-2021.

WHO (World Health Organization) (2023). *Appeal - Sri Lanka*. Available at www.who.int/emergencies/funding/outbreak-and-crisis-response-appeal/2023/2023-appeals/appeal-sri-lanka.

World Bank (2018). *Building Sri Lanka's Resilience To Climate Change*. Available at www.worldbank.org/en/news/feature/2018/09/21/building-sri-lankas-resilience-to-climate-change.

World Bank and CIAT (2015). Climate-smart agriculture in Sri Lanka. Available at https://climateknowledgeportal.worldbank.org/sites/default/files/2019-06/CSA%20in%20Sri%20Lanka.pdf.

World Bank Group (2021). *The Rural Nonfarm Sector and Livelihood Strategies in Sri Lanka: Background Report to Sri Lanka Poverty Assessment (English)*. Available at http://documents.worldbank.org/curated/en/210021634313271639/The-Rural-Nonfarm-Sector-and-Livelihood-Strategies-in-Sri-Lanka-Background-Report-to-Sri-Lanka-Poverty-Assessment.

World Bank Group (2023). *Sri Lanka Development Update: Mobilizing Tax Revenue for a Brighter Future*. Available at https://openknowledge.worldbank.org/server/api/core/bitstreams/e8702694-0c68-4a7b-8cd2-006a821463d0/content.

**Trade, Investment, and Innovation Division**

**United Nations Economic and Social Commission for Asia and the Pacific**

United Nations Building,
Rajadamnern Nok Avenue

Bangkok 10200, Thailand

E-mail: escap-tiid@un.org